වාර්ෂික වාර්තාව

ANNUAL REPORT

ஆண்டு அறிக்கை

2019





තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව
மூன்றாம் நிலைக்கல்வி, தொழிற்கல்வி ஆணைக்குழு
TERTIARY AND VOCATIONAL EDUCATION COMMISSION

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය
திறன்கள் அபிவிருத்தி, தொழில்வாய்ப்பு மற்றும் தொழிலாளர் உறவுகள் அமைச்சு
Ministry of Skills Development, Employment & Labour Relations

පටුන **පිටු අංකය**

කොමිෂන් සභා තොරතුරු පැවරීම		II
දැක්ම හා මෙහෙවර		III
සභාපතිතුමාගේ පණිවිඩය		IV
අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය		VI
1.0	හැඳින්වීම	1
2.0	තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය	1
3.0	කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය	3
4.0	පාලන හා මුදල් අංශය	5
5.0	සැලසුම් හා පර්යේෂණ අංශය	21
6.0	පාඨමාලා ලියාපදිංචි, පිළිගැනීම් හා තත්ව කළමනාකරණ පද්ධති අංශය	29
7.0	ජාතික නිපුණතා සම්මත විෂයමාලා හා ජාතික වෘත්තීය සුදුසුකම් අංශය	35
8.0	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	41
9.0	මහජන සම්බන්ධතා (වෘත්තික හා කර්මාන්ත) අංශය	51
10.0	තොරතුරු පද්ධති අංශය	59
මූල්‍ය ප්‍රකාශය		73 - 95
	මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශය	73
	මූල්‍ය තත්ත්ව ප්‍රකාශය	74
	ශුද්ධ වත්කම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය	75
	මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	76
	මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ සටහන්	78
	මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ උප සටහන්	86
	මූල්‍ය තත්ත්ව ප්‍රකාශ උප ලේඛන 01 - පාරිතෝෂික වෙන්කිරීම්	93
විගණකාධිපති වාර්තාව		97
විගණකාධිපති වාර්තාවේ පැහැදිලි කිරීම් හා පිළිතුරු		106

කොමිෂන් සභා තොරතුරු

ආයතනය	:	තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව.
අමාත්‍යාංශය	:	නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.
ලිපිනය	:	තුන්වන මහල ''නිපුණතා පියස'' 354/2 ඇල්විටිගල මාවත, කොළඹ 05.
ඊමේල් ලිපිනය	:	info@tvec.gov.lk
වෙබ් අඩවිය	:	www.tvec.gov.lk
දුරකථන අංකය	:	011-7608000
ෆැක්ස් අංකය	:	011-2555007
විගණකවරු	:	විගණකාධිපති. විගණකාධිපති දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල.
බැංකුකරුවන්	:	මහජන බැංකුව වයි. එම්. බී. ඒ. ශාඛාව, බොරැල්ල..

දැක්ම

රැකියා වෙළඳපොළට ගැළපෙන හා ගුණාත්මක තෘතීයික
හා වෘත්තීය අධ්‍යාපනය අපේක්ෂා කරන සියළු දෙනාට
වෘත්තීය පුහුණුව ලැබීම අපගේ දැක්ම වේ.

මෙහෙවර

අභියෝගාත්මක ලෝක වෙළඳ අවශ්‍යතා හා
සමාජ ආර්ථික අරමුණු ඉටුවන
කාර්යක්ෂම, ඵලදායී හා ගුණාත්මභාවය සහතික කළ
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමයක්
ස්ථාපිතකර පවත්වාගෙන යෑම අපගේ මෙහෙවර වේ.

සභාපතිතුමාගේ පණිවිඩය

විද්‍යාජෝති මහාචාර්ය දයන්ත විජයසේකර

2019 වර්ෂය ආරම්භ වූයේ මා සභාපතිවරයා වශයෙන්ද නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ජානක ජයලත් මහතා වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන්ද කටයුතු කරමින් සිටියදීය. ඔහු විදේශගතව සිටි අවස්ථාවලදී අධ්‍යක්ෂ, ලියාපදිංචි හා ප්‍රතිපත්ති එස්.යූ.කේ රුබසිංහ මහතා විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ධූරයේ රාජකාරී ආවරණය කරනු ලැබිණ.

වසර ආරම්භයේදී අංශ ප්‍රධානීන්ගේ එකඟත්වයෙන් කොමිෂන් සභාවේ පරිපාලන ක්‍රියාවලිය ප්‍රතිව්‍යුහගත කළ අතර එය සියලුම අංශයන්හි මෙන්ම නිළධාරීන්ගේද කාර්යක්ෂමතාවය හා යෝග්‍යතාව ඉහළ නැංවීමට හේතු විය. පාර්ශවකරුවන්ගේ දුර්මත ඉවත් වී තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ නියාමන ආයතනය ලෙස නැවත ප්‍රතිස්ථාපනය සිදු විය.

ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) ක්‍රමය සමාලෝචනය කිරීම ප්‍රධාන කාර්යය භාර්යක්ව තිබූ අතර ඒ සඳහා ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර ප්‍රවීණ උපදේශකවරයෙකු වන ඩේවිඩ් ලයිත් මහතාගේ දැනුම උපයෝගී කරගැනීම සිදුවිය. මෙය පාස්කු ඉරු දිනට පසුව ක්‍රියාත්මක වීමට තිබුණද රටේ එවකට පැවති තත්ත්වය හේතුවෙන් එයට බාධා පැමිණිණි. නමුත්, ජාතික වෘත්තීය සුදුසුකම් අංශයේ ක්‍රියාකාරී සහයෝගයෙන් ඉතා සාර්ථකව එය සිදු කරගැනීමට හැකි විය. එහි දී ක්ෂේත්‍රයේ නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් වැඩමුළුවක් ද පවත්වන ලදී.

කෙසේ නමුත් අධ්‍යක්ෂ ජනරාල් තනතුර පිරවීම එසැනින් සිදු කළ යුතු කාරණයක් වූ අතර, ඒ සඳහා පුවත්පත් දැන්වීමක් මගින් පත් කර ගතයුතුව තිබුණි. ඒ සඳහා අන්තර් කාල සීමාවකට අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත්කර ගැනීමට කැබිනට් සංදේශ දෙකක් ඉදිරිපත් කළ අතර ආර්.ඩී.එස්. කුමාරරත්න මහතා 2019 ජූනි මස ආරම්භයේ සිට වසරක කාලයක් සඳහා අධ්‍යක්ෂ ජනරාල් ලෙස 3/2018 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව පත් කරන ලදී.

කෙසේ වෙතත්, වසර දෙකකට ආසන්න කාලයක් අධ්‍යක්ෂ තනතුරු තුනක් පුරප්පාඩු ව පැවති අතර, එම තනතුරු සඳහා නිලධාරීන් පත් කරනු ලැබුවේ වැඩ බැලීමේ පදනම මතයි. විවිධ හේතූන් මත වැඩ බැලීමේ කාලය ඉක්මවා ගොස් තිබූ බැවින් අනෙකුත් තනතුරු පුරප්පාඩු සමඟ දැන්වීම් පළකරන ලදී. නමුදු ජනාධිපතිවරණය වැනි විවිධ කාරණා හේතුවෙන් තවදුරටත් තනතුරු පුරප්පාඩුව පවතී.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්යය භාර්යයක්ව ඇති කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ප්‍රකාශය සකස් කිරීම සඳහා මෙම වර්ෂය තුළදී ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව හා එක්ව කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශනය එළිදැක්වීම සඳහා උපරිම දායකත්වය ලබා දුන් අතර මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වැඩමුළුවක් ද පවත්වන ලදී. එය ක්‍රියාවට නැංවීම මීට වඩා කඩිනම්ව සිදු කළ යුතුව තිබුණකි.

වසර අග භාගය සැලකූ විට වසර මුල කාලය තරම් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්ය සාධනය පාර්ශවකරුවන් බලාපොරොත්තු වූ පමණ නොතිබුණි.

නිපුණතා ආංශික සභාවේ කාර්යය සාධනය මීට වඩා ඵලදායීව තිබිය යුතු වූ අතර මේ හරහා කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් පරිමේයකරණය විධිමත් කළ යුතුව ඇත.

වෘත්තීය මාර්ගෝපදේශනය සැපයීමේ අවශ්‍යතාවය සඳහා TVET Guide 2019 තොරතුරු පද්ධති අංශය මගින් ඩිස්ත්‍රික් වශයෙන් පිටපත් සකස් කිරීම සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය හරහා ඉතා පුළුල් ලෙස තොරතුරු සපයා තිබුණද වෘත්තීය මාර්ගෝපදේශන අවශ්‍යතාව සැපිරීමට ප්‍රමාණවත් නොවුණි. ජාතික වෘත්තීය සුදුසුකම් අංශය සීමිත කාර්යය මණ්ඩලයක් සමඟ අවශ්‍ය ලියකියවිලි සකස් කර පාර්ශවකරුවන්ට හැකි උපරිමයෙන් මඟ පෙන්වීම ලබා දුන්නේය. කාර්යය මණ්ඩල හිඟය නොතකා ලියාපදිංචි කිරීමේ හා ප්‍රතිපත්ති අංශය නැවත වරක් දිවයින පුරා සිය රාජකාරී කටයුතු උපරිමයෙන් සිදු කළේය.

එලෙසම අකුමිකතා ඇතුළු බොහෝ අඩුපාඩුකම් මඟහරවා ගැනීම සඳහා තත්ත්ව පාලන හා නියාමන අංශය ක්‍රියාපටිපාටිවල විශාල වෙනස්කම් සිදු කළේය. සැලසුම් හා පර්යේෂණ අංශය විසින් TVET පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම් කිහිපයක් සකස් කර තිබුණි.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පනත් සංශෝධන සැලසුම් සමඟ ඉදිරි කටයුතු සිදු කිරීමට නොහැකි වූයේ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) සමඟ ඒකාබද්ධව සහභාගී නොවීම හේතුවෙන් සහ ඒකාබද්ධ කමිටුව සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සම්පූර්ණයෙන්ම පත් නොකිරීම හේතුවෙනි.

ජනාධිපති ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයක් පදනම් කරගෙන 2019 දෙසැම්බර් මාසය ආරම්භයේ අවශ්‍යනම් සභාපති ධූරයෙන් ඉල්ලා අස්වීමට මා ඉදිරිපත් වූ නමුත් ඒ වෙනුවට 1990 අංක 20 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා (සංශෝධිත පරිදි) පනතේ නියම කර ඇති පරිදි එළඹෙන වසරේ 02 වන දින සිට තනතුරේ නැවත වරක් රැඳී සිටීමට පත්වීම් ලිපියක් නිකුත් කරන ලදී.

2020 වර්ෂය තුළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙත අපේක්ෂිත ඉලක්කයන් සහ සේවාවන් සපුරා ගැනීමට හැකි වෙතැයි මම බලාපොරොත්තු වෙමි.

විද්‍යාජෝති මහාචාර්ය දයන්ත විජයසේකර
සභාපති

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) 1992 දී කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ නියාමන ආයතනය ලෙස ආරම්භ කරන ලද අතර, එය 1990 අංක 20 දරණ පාර්ලිමේන්තු පනත මඟින් ස්ථාපිත කරන ලදී. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ මූලික වගකීම වන්නේ ප්‍රතිපත්ති සැකසීම,තත්ව ආරක්ෂණය සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය රට තුළ සම්බන්ධීකරණය කිරීම හා දියුණු කිරීමය. 1999 මෙම පනතට එක් කරන ලද සංශෝධනය මඟින් කොමිෂන් සභාවේ සාමාජිකයින් 17 දෙනා අතරින් සභාපතිවරයා ඇතුළු සාමාජිකයින් 10 දෙනෙකුම සේවායෝජකයන්ගේ සංගම් වෙළඳ හා කාර්මික සංගම්, වාණිජ්‍ය විද්‍යා මණ්ඩල සංගම් නියෝජිතයින් ලෙස පෞද්ගලික අංශයේ දායකත්වය උදෙසා වේ. මෙම සංශෝධනයේ අරමුණ වී ඇත්තේ කොමිෂන් සභාව පෞද්ගලික අංශයේද දායකත්වය සමඟ ශ්‍රම වෙළඳපළ අවශ්‍යතාවයන් පදනම් කරගත් ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණු ප්‍රතිපත්ති සම්පාදනය හා එකී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහි ලා ගත යුතු ක්‍රියාමාර්ග හඳුන්වාදීමයි.

2019 වසර තුළ විශේෂිත වූ සාක්ෂාත් කරගැනීම් අතරට කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ප්‍රතිපත්තිය ඉදිරිපත් කිරීම හා එයට ඇමති මණ්ඩලයේ සහ පාර්ලිමේන්තුවේ අනුමැතිය හිමි වීම ප්‍රධාන කොට සැළකිය හැකිය. මෙම සැලැස්ම පදනම් කරගත් සංවර්ධන ප්‍රතිපත්ති සැලසුම 2020 වසරේදී ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව රටේ ආර්ථික දියුණුව උදෙසා සෘජුව දායක විය හැකි සාධකයක් වශයෙන් දැඩි සැලකිල්ලට යොමු වී ඇති අතර, එම අරමුණු ලඟාකර ගැනීමෙහි ලා ව්‍යාප්ත වූ විශේෂිත කාර්යය භාර්යයක් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙත පැවරී ඇති බව සඳහන් කරනු කැමැත්තෙමි.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව රුපියල් මිලියන 130ක පුනරාවර්තන වියදමක් හා රුපියල් මිලියන 10ක ප්‍රාග්ධන වියදම් සහිතව 2019 වසරේදී පවත්වාගෙන යනු ලැබීය. මෙහි ඇති විශේෂය නම් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සිය සේවා සැපයුම් මඟින් ඇස්තමේන්තුගත රුපියල් මිලියන 36 ඉක්මවා යමින් රුපියල් මිලියන 48.7 ආදායමක් වසර තුළ උපයා ඇත.

2019 වසර තුළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් ලාභීන් වෙනුවෙන් සහතිකපත් 78,007ක් නිකුත්කර ඇත. මෙය 2018 ට සාපේක්ෂව 26% ක වැඩිවීමේ ප්‍රතිශතයකි. (2018 සහතිකපත් ප්‍රමාණය 61,150). මීට අමතරව 2019 වර්ෂයේදී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කොමිෂන් සභාව ආයතන 700ක ප්‍රමාණයක් ලියාපදිංචි ඇගයීම් සංඛ්‍යාවක් ඉලක්කගත කර තිබුණු අතර, එයින් ආයතන 697 ක ප්‍රමාණයක් ඇගයීමට ලක්කර ඇත.

ඉහත පුහුණු ආයතනවලට අදාළ වූ හා නව වෘත්තීය පුහුණු පාඨමාලා පදනම් කරගත් නිපුණතා සම්මත 22ක් විවිධ විෂයධාරාවන් යටතේ පුහුණුව ස්ථාපිත කිරීම සඳහා ඉදිරිපත් කරන ලද අතර නිපුණතා සම්මත හා විෂයමාලා 25ක් යාවත්කාලීන කර ඇත.

වෘත්තීය පාඨමාලා හා සම්මත වැඩිදියුණු කිරීමෙහි ලා දායක විය හැකි නව පර්යේෂණ දිරි ගැන්වීම තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව තවදුරටත් ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව 2019 වර්ෂයේදී නව පර්යේෂණ 06ක් සහ කෙටි ව්‍යාපෘති 02ක් ක්‍රියාත්මක කිරීමට අදාළ පියවර ගෙන ඇත.

වඩාත් පුළුල් වූත් තත්කාලීන වූත් ශ්‍රම වෙළඳපළට අදාළ වූ තොරතුරු ලබා දීම වෙනුවෙන් දැනට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් කරනු ලබන ශ්‍රම වෙළඳපළ ප්‍රකාශන හා දත්ත සමාලෝචනය කර ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

පුහුණු පාඨමාලා හා සම්මත තවදුරටත් වෙළඳපළ අවශ්‍යතා ඉලක්ක කරගෙන ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඉල්ලුම හා සැසඳෙන ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා සමීප සම්බන්ධතා ව්‍යාපාර ක්ෂේත්‍රය සමඟ ව්‍යාප්ත කිරීමට කටයුතු කරනු ලැබූ අතර, මෙම අරමුණ වෙනුවෙන් ඇති කරන ලද ආංශික නිපුණතා සභාවල කටයුතු ප්‍රවර්ධනය කිරීමට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව දායක වී ඇත.

ප්‍රතිපත්ති සම්පාදනයේ සිට එය ක්‍රියාත්මක කිරීම හා ඇගයීම සඳහා ව්‍යාපාරික ප්‍රජාවේ දායකත්වය වටිනා මෙහෙවරක් ඉටු කළ හැකිය.මේ සඳහා ව්‍යාපාරික ප්‍රජාවේ සෘජු දායකත්වයක් අත්‍යාවශ්‍ය වේ. ව්‍යාපාරික ක්ෂේත්‍රයට අදාළව පුහුණු ශ්‍රම අවශ්‍යතා ක්‍රමානුකූල ක්‍රමවේදයකට අනුව සපයා ගැනීම සඳහා ඔවුනට දායක විය හැකි බැවින් අන්‍යෝන්‍ය සාර්ථකත්වයක් (win-win Situation) ඇති කිරීමෙහිලා ඔවුන්ගේ සෘජු දායකත්වය අපි තවදුරටත් අපේක්ෂා කරමු.

ආර්.ඩී.එස්.කුමාරරත්න
අධ්‍යක්ෂ ජනරාල්

1.0 හැඳින්වීම

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ස්ථාපනය කරන ලද අතර 1999 අංක 50 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධිත) පනත මඟින් 1999 දෙසැම්බර් 16 දින සිට ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස ක්‍රියාත්මක වේ.

කොමිෂන් සභාවේ පොදු අරමුණු පහත සඳහන් පරිදි වේ.

(අ) ආර්ථිකයේ මිනිස් සම්පත් අවශ්‍යතා වලට සරිලන අයුරින් සියළුම මට්ටම්වල තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමය සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ සංවර්ධනය කිරීම.

(ආ) සහතික පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ඇතුළුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ප්‍රධානයන් පිරිනැමීම සඳහා ජාතික වශයෙන් පිළිගත් ක්‍රමයක් සංවර්ධනය කිරීම, සහ

(ඇ) තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය සලස්වන ශිල්ප ආයතන, නියෝජ්‍ය ආයතන සහ වෙනත් සියළු ආයතනවල ශාස්ත්‍රීය හා පුහුණුවීම් සම්මතයක් පවත්වාගෙන යාම.

2.0 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම කොමිෂන් සභාව 1999 අංක 50 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධන) පනතේ දැක්වෙන විධි විධාන අනුව පත් කරනු ලබන සභාපතිවරයෙකු ඇතුලු සාමාජිකයන් 12 දෙනෙකුගෙන් සමන්විත වේ.

2019 වසර තුල කොමිෂන් සභා සංයුතිය

පනතේ (6:1) (ඌ) වගන්තිය යටතේ කර ඇති පත්විම්,

1.	මහාචාර්ය දයන්ත එස් විජේසේකර මහතා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව.	-	සභාපති
2.	ආචාර්ය රාණි ජයමහ මහත්මිය ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත.	-	සාමාජික
3.	ආචාර්ය පූජ්‍ය කිරින්දේ අස්සජි හිමි ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත.	-	සාමාජික

4. ගරු එන්.ඒ.එච්.ඇන්තනී හියුමර් පින්ටෝ පියතුමා - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත.

5. බුද්දික රුවන් මඩිහහේවා මහතා - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත.

6. වඩිවෙල් පුත්තිරසිගමනි මහතා - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත.

පනතේ 6 (1) (අ) සිට (ඉ) වගන්ති යටතේ කර ඇති පත්වීම්

අ) ආර්.ඩී.එස්.කුමාරරත්න මහතා - සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ

ආ) නසීර් අහමඩ් මහතා - සාමාජික
සභාපති
ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය

ඇ) රවි ජයවර්ධන මහතා - සාමාජික
සභාපති
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

ඈ) පී.එන්.කේ.මලලසේකර මහත්මිය - සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තුමේන්තුව

ඉ) මහාචාර්ය කේ.ටී.එම්.යූ.හේමපාල මහතා - සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

ඊ) හේමාල් කස්තුරිආරච්චි මහතා - සාමාජික
මුදල් අමාත්‍යාංශය
මහා භාණ්ඩාගාර නියෝජිත

3.0 කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය

කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිළධාරියා ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා කටයුතු කරන අතර ඔහුගේ සහාය සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු, අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකු සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/සහකාර අධ්‍යක්ෂවරුන් 25 දෙනෙකු ඇතුළුව 91 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් මඟින් 2019 වසර තුලදී කොමිෂන් සභාවේ කාර්යභාර්ය ඉටු කරන ලදී. ඒ අනුව කොමිෂන් සභාවේ අරමුණු හා පරමාර්ථ කාර්යක්ෂමව ඉටු කර ගැනීම පිණිස පහත දැක්වෙන අංශ යටතේ කටයුතු සංවිධානය කරනු ලැබ ඇත.

- පාලන හා මුදල් අංශය
- සැලසුම් හා පර්යේෂණ අංශය
- ආයතන ලියාපදිංචි ප්‍රතීතන හා තත්ත්ව කළමනාකරණ පද්ධති අංශය
- තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය
- මහජන සම්බන්ධතා (වෘත්තික හා කර්මාන්ත) අංශය
- ජාතික වෘත්තීය සුදුසකම් අංශය
- තොරතුරු පද්ධති අංශය
- නීති අංශය

කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදනයන්ට අනුව කොමිෂන් සභාව සඳහා 116 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් අනුමතව ඇතත්, 2019.12.31 දිනට කාර්ය මණ්ඩලය 91 දෙනෙකුගෙන් සමන්විත විය.
විස්තර පහත දක්වා ඇත.

වගුව 3.1 කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය - 2019

තනතුරු නාමය		අනුමත සංඛ්‍යාව	2019/12/31 දිනට සේවයේ යෙදී සිටින සේවක සංඛ්‍යාව
1	අධ්‍යක්ෂ ජනරාල්	01	01
2	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්	01	01
3	අධ්‍යක්ෂ	07	04
4	ශ්‍රම වෙළඳපොල විශ්ලේෂක	01	01
5	නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ	29	25
6	නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණක හා විමර්ෂන)	01	01
7	සහකාර අධ්‍යක්ෂ (නීති/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)	01	01

	තනතුරු නාමය	අනුමත සංඛ්‍යාව	2019/12/31 දිනට සේවයේ යෙදී සිටින සේවක සංඛ්‍යාව
8	නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)	01	01
9	සංඛ්‍යාලේඛනඥ	01	01
10	නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු සේවා)	01	01
11	පරිපාලන නිලධාරී	01	01
12	භාෂා පරිවර්තක (සිංහල/දෙමල/ඉංග්‍රීසි)	01	01
13	වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරී	06	05
14	සංවර්ධන නිළධාරි	17	11
15	තොරතුරු තාක්ෂණ නිළධාරි	01	00
16	තොරතුරු තාක්ෂණ සහකාර	02	01
17	පරිගණක යෙදවුම් සහායක	06	04
18	කළමණාකරන සහකාර (I ශ්‍රේණිය / II ශ්‍රේණිය / III ශ්‍රේණිය)	16	12
19	තොරතුරු සහායක	01	00
20	රියදුරු (I ශ්‍රේණිය / II ශ්‍රේණිය / III ශ්‍රේණිය)	14	12
21	කාර්යාල කාර්ය සහායක	07	07
	එකතුව	**116**	**91**

2019.05.30 දින භාෂා පරිවර්ථක, රියදුරු, කළමනාකරණ සහකාර, පරිගණක යෙදවුම් සහායක, සංවර්ධන නිළධාරී, තොරතුරු තාක්ෂණ සහකාර යන තනතුරු සඳහා බඳවා ගැනීමට පුවත්පත් දැන්වීම් පළකරන ලදී. ඒ අනුව 2019.08.30 දින භාෂා පරිවර්ථක හා රියදුරු යන තනතුරු දෙක සඳහා පමණක් සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී.

රියදුරු තනතුර සඳහා සුදුසුකම් ලද අයදුම්කරුවන් 24 දෙනෙකු සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වන ලද අතර එයින් සුදුසුකම් ලද අයදුම්කරුවන් සඳහා ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වීමට නිර්දේශ විය. නමුත් ජනාධිපතිවරණය හේතුවෙන් සියළු බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවන ලදී.

සංවර්ධන නිළධාරී, පරිගණක යෙදවුම් සහායක, කළමනාකරණ සහකාර, තොරතුරු තාක්ෂණ සහකාර යන තනතුරු සඳහා ලද සුදුසුකම්ලත් අයදුම්පත් සංඛ්‍යාව 2110 කි. නමුත් ජනාධිපතිවරණය හේතුවෙන් සියළු බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවන ලදී.

භාෂා පරිවර්ථක තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් දෙදෙනකු සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී. එයින් සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වූ අයි.ඩබ්.එස්.ඒ. දිසානායක මහත්මිය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් 2019.08.30 දින තෝරා පත්කරන ලද අතර 2019.11.14 වන දින පත්වීම් ලබා දී ඇත.

4.0 පාලන හා මුදල් අංශය

කොමිෂන් සභාවේ කාර්යභාරය කාර්යක්ෂමව හා සඵලදායීව ඉටුකරලීමට අවශ්‍යය වන මානව හා මුල්‍ය සම්පත් කළමනාකරණය ඇතුළුව යටිතල පහසුකම් සැපයීමේ කාර්යය ඉටුකරනු ලබයි.

මානව සම්පත් කළමනාකරණයට අදාලව තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත නම් සඳහන් නිලධාරීන් 2019 වසර තුළදී කොමිෂන් සභාවේ සේවයට බඳවා ගන්නා ලදී.

4.1 2019 වසරේ පත්වීම්.

	නම	තනතුර	බඳවාගත් දිනය
1	ආර්.ඩී.එස්. කුමාරරත්න මහතා	අධ්‍යක්ෂ ජනරාල්	2019.06.06
2	අයි.ඩබ්.එස්.ඒ. දිසානායක මහත්මිය	භාෂා පරිවර්ථක	2019.11.19

4.2 2019 වසරේ සේවයෙන් ඉවත්වීම්

	නම	තනතුර	සේවයෙන් ඉවත් වූ දිනය
1	එච්.ඩබ්.ඉරේෂා කුමුදුනී මිය	සංවර්ධන නිලධාරී	2019.04.10
2	එච්.පී.කේ.එන්.බණ්ඩාර මහතා	සහකාර අධ්‍යක්ෂ	2019.06.16
3	එච්.පී.නිපුන හංසක	කළමනාකරණ සහකාර	2019.06.10
4	සී.එච්.විමුක්ති දර්ශනිකා මහත්මිය	කළමනාකරණ සහකාර	2019.07.01
5	එච්.පී.සී. ශානිකා මිය	සංවර්ධන නිලධාරී	2019.07.30
6	කේ.ඩබ්.පියුමි අප්සරා මෙනවිය	සංවර්ධන නිලධාරී	2019.08.01
7	සමීර අතපත්තු මහතා	තොරතුරු තාක්ෂණ නිළධාරී	2019.09.19
8	පී.පී.තුෂාර සම්පත් මහතා	රියදුරු	2019.09.02
9	ඩී.කේ.ජයකොඩි මහතා	රියදුරු	2019.12.31

4.3 2019 වර්ෂය තුල ක්‍රියාත්මක වූ වැඩ බැලීමේ / වැඩ ආවරණය කිරීමේ තනතුරු සඳහා කොමිෂන් සභාව තුලින් තෝරී පත් වූ නිළධාරීන්

නම		වැඩ බැලීමේ / වැඩ ආවරණය කිරීමේ තනතුර	දිනය
1	ජේ.ඒ.ඩී.ජේ. ජයලත් මහතා	අධ්‍යක්ෂ ජනරාල්	2018.11.21
2	ආචාර්ය අජිත් පොල්වත්ත මහතා	අධ්‍යක්ෂ (තත්ත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන)	2018.10.02
3	ආර්.ජේ. සමරවීර මහතා	අධ්‍යක්ෂ (පාලන)	2018.06.25
4	ඒ.එස්. කල්පගේ මහත්මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන හා විමර්ශන)	2018.06.25
5	එස්.යූ.කේ. රුබසිංහ මහතා	අධ්‍යක්ෂ ජනරාල්	2019.03.16 - 2019.04.26

4.4 දේශීය හා විදේශීය පුහුණු

කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ විෂය දැනුම වර්ධනය කිරීම පෙරදැරිව නිළධාරීන් දේශීය හා විදේශීය පුහුණුවීම් / සම්මන්ත්‍රණවලට යොමු කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා දේශීය පුහුණු වීම් / සම්මන්ත්‍රණ වලට සහභාගි වූ නිළධාරීන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

නම		අංශය	තනතුර	පුහුණු පාඨමාලාව	ආයතනය	කාල සීමාව
1	දිල්රුක්ෂි හේරත් මිය	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	සහකාර අධ්‍යක්ෂ	Innovative Grant Proposals for Successful Funding	University of Colombo	දින 1
2	කුසලා පනන්ගල මෙනවිය	පාලන අංශය	පරිපාලන නිලධාරී	නිවාඩුහාර නිළධාරියාගේ කාර්ය භාර්ය හා වගකීම	NILS	දින 2 2019.02.25
3	කේ.ඩබ්.සුජානි දිල්හාරා විතාන මෙනවිය	පාලන අංශය	පරිගණක යෙදවුම් සහායක	නිවාඩුහාර නිළධාරියාගේ කාර්ය භාර්ය හා වගකීම	NILS	දින 2 2019.02.25
4	ප්‍රසංග මුතුකුමාරණ මයා	පාඨමාලා ලියාපදිංචි පිළිගැනීම් හා තත්ව කළමනාකරණ පද්ධති අංශය	වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරී	Certificate in English For Office Management	NILS	දින 7

නම		අංශය	තනතුර	පුහුණු පාඨමාලාව	ආයතනය	කාල සීමාව
5	විමර්ශී රම්මාවඩු මිය	තොරතුරු පද්ධති අංශය	තොරතුරු තාක්ෂණ සහකාර	Certificate in English For Office Management	NILS	දින 8
6	පී.එල්.අයි.ඒ.එස්.ද සොයිසා මෙනවිය	අභ්‍යන්තර විගණක හා විමර්ශන අංශය	සංවර්ධන නිළධාරී	විධිමත් විනය පරීක්ෂණය	NILS	දින 2
7	කසුනි බමුණුසිංහ මෙනවිය	නීති අංශය	කළමනාකරණ සහකාර	විධිමත් විනය පරීක්ෂණය	NILS	දින 2
8	කේ.ඩබ්. සුජානි දිල්හාරා විතාන මෙනවිය	පාලන අංශය	පරිගණක යෙදවුම් සහායක	ශ්‍රම අධ්‍යනවේදී උපාධිය	University of Colombo	අවුරුදු 3
9	ටී.ජී. රවිඳු රන්දික මහතා	සභාපති අංශය	කාර්යාල කාර්ය සහායක	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
10	එච්.ජී.සී.ශානිකා මිය	කර්මාන්ත සබඳතා අංශය	සංවර්ධන නිළධාරී	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
11	එච්.ඒ.දේවින්දි දර්ශනිකා මිය	අභ්‍යන්තර විගණන හා විමර්ෂණ අංශය	සංවර්ධන නිළධාරී	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
12	පී.එල්.අයි.ඒ.එස්.ද සොයිසා මෙනවිය	අභ්‍යන්තර විගණන හා විමර්ෂණ අංශය	සංවර්ධන නිළධාරී	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
13	ඒ.එම්.සමීර මදුෂාන් මහතා	තොරතුරු පද්ධති අංශය	තොරතුරු තාක්ෂණ නිළධාරී	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
14	ජයමිණි මධුෂා මෙනවිය	තොරතුරු පද්ධති අංශය	කාර්යාල කාර්ය සහායක	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
15	කසුනි බමුණුසිංහ මෙනවිය	නීති අංශය	කළමනාකරණ සහකාර	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
16	බී.එස්.ජේ.විපුල්සි මිය	පුහුණු සම්මත විෂයමාලා හා ජාතික වෘත්තීය සුදුසුකම් අංශය	සහකාර අධ්‍යක්ෂ	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
17	එල්.එන්.කංකනම්ගේ මෙනවිය	පුහුණු සම්මත විෂයමාලා හා ජාතික වෘත්තීය සුදුසුකම් අංශය	සංවර්ධන නිළධාරී	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන

නම		අංශය	තනතුර	පුහුණු පාඨමාලාව	ආයතනය	කාල සීමාව
18	පී.ඩබ්.එස්. භාෂිනි මෙනවිය	සැලසුම් හා පර්යේෂණ අංශය	සහකාර අධ්‍යක්ෂක	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
19	එම්.ඩබ්.ඒ.අසංක රංගන මහතා	සැලසුම් හා පර්යේෂණ අංශය	කාර්යල කාර්ය සහායක	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
20	වයි.පී.එස්. උදයකාන්ති	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරී	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
21	ඒ.කේ.කේ. කොහම්බන් මෙනවිය	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	සංවර්ධන නිළධාරී	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
22	කේ.ඩබ්.පියුම් අප්සරා මෙනවිය	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	සංවර්ධන නිළධාරී	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
23	ඩබ්.වපිර බණ්ඩාර මයා	පාඨමාලා ලියාපදිංචි පිළිගැනීම් හා තත්ව කළමනාකරණ පද්ධති අංශය	සහකාර අධ්‍යක්ෂක	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
24	නදීක පිවන්ත මයා	පාඨමාලා ලියාපදිංචි පිළිගැනීම් හා තත්ව කළමනාකරණ පද්ධති අංශය	වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරී	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
25	ඒ.එච්.එන්.සඳමාලි මිය	පාඨමාලා ලියාපදිංචි පිළිගැනීම් හා තත්ව කළමනාකරණ පද්ධති අංශය	සංවර්ධන නිළධාරී	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
26	විමුක්ති දර්ශනිකා මිය	පාලන අංශය	කළමනාකරණ සහකාර	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
27	යූ.පී.වන්දි මේනකා මිය	අධ්‍යක්ෂ ජනරාල් අංශය	කළමනාකරණ සහකාර	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
28	ආර්.එස්. ප්‍රනාන්දු මිය	ගිණුම් අංශය	සහකාර අධ්‍යක්ෂ	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
29	ධනුෂ්කා චාමලි ද සිල්වා මිය	ගිණුම් අංශය	කළමනාකරණ සහකාර	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන

නම		අංශය	තනතුර	පුහුණු පාඨමාලාව	ආයතනය	කාල සීමාව
30	කේ.ඒ.ඩි. හසන්ති ලක්මිණි මිය	කාර්මාන්ත සබඳතා අංශය	සහකාර අධ්‍යක්ෂක	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
31	ඒ.එස්. කල්පගේ මිය	අභ්‍යන්තර විගණන හා විමර්ෂණ අංශය	සහකාර අධ්‍යක්ෂක	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
32	පී.සී.ජනක් ද සිල්වා මයා	අභ්‍යන්තර විගණන හා විමර්ෂණ අංශය	සංවර්ධන නිළධාරි	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
33	ඩබ්.ජී.සමන් කුමාර මයා	තොරතුරු පද්ධති අංශය	සහකාර අධ්‍යක්ෂක	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
34	වී.එන්.රම්මාවඩු මිය	තොරතුරු පද්ධති අංශය	තොරතුරු තාක්ෂණ සහකාර	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
35	පී.ඩී.එස්.කාරියවසම් මිය	නීති අංශය	සහකාර අධ්‍යක්ෂ	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
36	එච්.එම්.ඒ.කේ.ඩි. හේරත් මිය	පුහුණු සම්මත විෂයමාලා හා ජාතික වෘත්තීය සුදුසුකම් අංශය	සහකාර අධ්‍යක්ෂ	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
37	එච්.ආර්.එම්.යූ.යූ. විජේබණ්ඩාර මිය	පුහුණු සම්මත විෂයමාලා හා ජාතික වෘත්තීය සුදුසුකම් අංශය	සහකාර අධ්‍යක්ෂ	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
38	යූ.ඒ.ප්‍රියන්ත ධර්මසේන මයා	සැලසුම් හා පර්යේෂණ අංශය	සහකාර අධ්‍යක්ෂ	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
39	ජී.වී.එල්.පියුමාලි මෙනවිය	සැලසුම් හා පර්යේෂණ අංශය	සංවර්ධන නිළධාරි	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
40	අනුෂා කුමාරි ද සිල්වා මිය	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	සහකාර අධ්‍යක්ෂ	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
41	ජී.චතුරි උපේක්ෂා මිය	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	සහකාර අධ්‍යක්ෂ	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
42	ටී.ඒ.ඩබ්.මදුෂානි මෙනවිය	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	සංවර්ධන නිළධාරි	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
43	එච්.ඩබ්.ඉරේෂා කුමුදුනි මිය	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	සංවර්ධන නිළධාරි	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන

නම		අංශය	තනතුර	පුහුණු පාඨමාලාව	ආයතනය	කාල සීමාව
44	සපිත් බුද්ධික කරුණානායක මහතා	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	සංවර්ධන නිළධාරී	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
45	විපුලි නදීෂා හේරත් මිය	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	පරිගණක යෙදවුම් සහයක	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
46	ඩී.ඩබ්.ඉෂානි මිය	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	කළමනාකරණ සහකාර	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
47	ඒ.පී.ඉන්ද්‍රානි මෙනවිය	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	කාර්යාල කාර්ය සහායක	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
48	නිලූකා රාජපක්ෂ මිය	පාලන අංශය	සහකාර අධ්‍යක්ෂ	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
49	එච්.පී.කේ.එන්. බණ්ඩාර මහතා	පාඨමාලා ලියාපදිංචි පිළිගැනීම් හා තත්ව කළමනාකරණ පද්ධති අංශය	සහකාර අධ්‍යක්ෂ	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
50	ප්‍රසංග මුතුකුමාරණ මයා	පාඨමාලා ලියාපදිංචි පිළිගැනීම් හා තත්ව කළමනාකරණ පද්ධති අංශය	වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරී	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
51	එන්.එච්.එස්. දර්ශන මහතා	පාඨමාලා ලියාපදිංචි පිළිගැනීම් හා තත්ව කළමනාකරණ පද්ධති අංශය	සංවර්ධන නිළධාරී	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
52	පී.පී.ඒ. ශෂිකා චතුරංගනි මිය	පාඨමාලා ලියාපදිංචි පිළිගැනීම් හා තත්ව කළමනාකරණ පද්ධති අංශය	කළමනාකරණ සහකාර	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
53	පී.පී. සමන් කුමාර මයා	පාඨමාලා ලියාපදිංචි පිළිගැනීම් හා තත්ව කළමනාකරණ පද්ධති අංශය	කාර්යාල කාර්ය සහායක	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන

නම		අංශය	තනතුර	පුහුණු පාඨමාලාව	ආයතනය	කාල සීමාව
54	පී.එල්. මාස්කොරාල මිය	පාඨමාලා ලියාපදිංචි පිළිගැනීම් හා තත්ව කළමනාකරණ පද්ධති අංශය	සහකාර අධ්‍යක්ෂ	කාර්ය සංවර්ධන වැඩසටහන	SDFL	දින 3 වැඩසටහන
55	එන්.එල්. සඳරුවන් මයා	පාලන අංශය	කාර්යාල කාර්ය සහායක	ICT Level 4	VTA	පැය 720
56	හසන්ති ලක්මිණි මිය	කාර්මාන්ත සබඳතා අංශය	සහකාර අධ්‍යක්ෂ	Masters of Social Sciences Degree Programmes in Sociology	University of Kelaniya	අවුරුදු 2
57	පී.එම්.සී.පී. ගුණතිලක මයා	තොරතුරු පද්ධති අංශය	නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැ.ඛ)	Mater of Information Technology Degree Programme	University of Colombo	අවුරුදු 2
58	නිසංසලා දිල්රුක්ෂි මිය	ගිණුම් අංශය	කළමනාකරණ සහකාර	Staff of the Finance Division of the Institutions	SIDA	දින 12
59	නලින් ද සිල්වා මයා	ගිණුම් අංශය	කළමනාකරණ සහකාර	Staff of the Finance Division of the Institutions	SIDA	දින 12
60	යූ.පී.චන්දි මේනකා මිය	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	කළමනාකරණ සහකාර	ශාස්ත්‍ර වේදී බාහිර සමාන්‍ය උපාධි	University of Kelaniya	අවුරුදු 3
61	ආර්.ජේ. සමරවීර මයා	පාලන අංශය	අධ්‍යක්ෂ පාලන (වැ.ඛ)	Masters of regional Development and Planning	University of Colombo	අවුරුදු 2
62	කසුනි බමුණුසිංහ මෙනවිය	නීති අංශය	කළමනාකරණ සහකාර	ශ්‍රම අධ්‍යනවේදී උපාධිය	University of Colombo	අවුරුදු 3

නම		අංශය	තනතුර	පුහුණු පාඨමාලාව	ආයතනය	කාල සීමාව
63	ජී.එල්.මාස්කොරාල මිය	පාඨමාලා ලියාපදිංචි පිළිගැනීම් හා තත්ව කළමනාකරණ පද්ධති අංශය	සහකාර අධ්‍යක්ෂ	Lead Auditor ISO 9001 - 2015 Training Programme	SLSI	දින 5
64	කුසලා පනන්ගල මිය	පාලන අංශය	පරිපාලන නිලධාරී	Lead Auditor ISO 9001 - 2015 Training Programme	SLSI	දින 5
65	ඊ.සි.යූ. ගුණතුංග මිය	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	සහකාර අධ්‍යක්ෂ	Master In Labour Relatiun and Human Resource Management	University of Colombo	අවුරුදු 2
66	එච්.බී.අයි. සම්පත් මයා	පාලන අංශය	වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරී	Workshop on Training Need Assessment for Year 2020	SSDP	දින 1
67	වජිර විජේසිංහ මයා	කර්මාන්ත සබඳතා අංශය	සහකාර අධ්‍යක්ෂ	Workshop on Training Need Assessment for Year 2020	SSDP	දින 1

4.5 විදේශීය සම්මන්ත්‍රණ වලට සහභාගි වීම

2019 වර්ෂයේදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට ලැබූ ආරාධනා මත කොමිෂන් සභාවේ නිලධාරීන් පහත සඳහන් සම්මන්ත්‍රණවලට සහභාගි වී ඇත.

නම		අංශය	තනතුර	පුහුණු පාඨමාලාව	රට	කාල සීමාව
1	ආර්.ඩී.එස්. කුමාරරත්න මයා	අධ්‍යක්ෂ ජනරාල් අංශය	අධ්‍යක්ෂ ජනරාල්	Conferance	Korea	21.10.2019 - 26.10.2019
2	පේ.ඒ.ඩී.පේ. ජයලත් මයා	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් අංශය	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්	PHD Study Leaves	Thailand	15.11.2019 - 01.12.2019
						31.03.2019 - 01.05.2019
				Conferance	German	08.09.2019 - 13.09.2019
				Workshop		22.06.2019 - 06.07.2019
3	ජී.ඒ.එම්.යූ. ගනේපොල මයා	තොරතුරු පද්ධති අංශය	අධ්‍යක්ෂ	Conferance	Germany	08.09.2019 - 13.09.2019
				Workshop		27.03.2019 - 30.03.2019
4	ඩබ්.ඒ.ඩබ්.සී. ප්‍රේමරත්න මිය	පුහුණු සම්මත විෂයමාලා හා ජාතික වෘත්තීය සුදුසුකම් අංශය	අධ්‍යක්ෂ	Workshop	Thailand	09.06.2019 - 11.06.2019
5	මංජුල විද්‍යානපතිරණ මයා	කර්මාන්ත සබඳතා අංශය	අධ්‍යක්ෂ (වැ.බ)	Workshop	United kingdom	03.03.2019 - 09.03.2019
6	පී.පී.පී. නානයක්කාර මිය	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය	නියෝජ්‍ය අධ්‍යක්ෂ	Youth Skills Forum	India	28.10.2019 - 01.11.2019
7	ඒ.එස්. අමරසිංහ මිය	ගිණුම් අංශය	නියෝජ්‍ය අධ්‍යක්ෂ	Seminar	China	09.12.2019 - 12.12.2019
8	ඩබ්.කේ.ඩී. හරිස්චන්ද්‍ර මයා	පාඨමාලා ලියාපදිංචි පිළිගැනීම් හා තත්ව කළමනාකරණ පද්ධති	නියෝජ්‍ය අධ්‍යක්ෂ	Seminar	China	09.12.2019 - 12.12.2019

නම		අංශය	තනතුර	පුහුණු පාඨමාලාව	රට	කාල සීමාව
9	ඊ.ඒ.කේ.ද සිල්වා මිය	තත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන	සහකාර අධ්‍යක්ෂ	Seminar	China	09.12.2019 - 12.12.2019
10	එච්.එම්.ඒ.ඩී.කේ. හේරත් මිය	පුහුණු සම්මත විෂයමාලා හා ජාතික වෘත්තීය සුදුසුකම් අංශය	සහකාර අධ්‍යක්ෂ	Seminar	China	09.12.2019 - 12.12.2019
11	ප්‍රියන්ත ධර්මසේන මයා	සැලසුම් හා පර්යේෂණ අංශය	සහකාර අධ්‍යක්ෂ	Seminar	China	09.12.2019 - 12.12.2019
12	එච්.ජී.කේ.එන්. බණ්ඩාර මයා	පාඨමාලා ලියාපදිංචි පිළිගැනීම් හා තත්ව කළමනාකරණ පද්ධති අංශය	සහකාර අධ්‍යක්ෂ	Workshop	India	03.03.2019 - 09.03.2019

4.6 වාර්ෂික වෘත්තීය සාමාජික ගාස්තු ප්‍රතිපූර්ණය

කොමිෂන් සභාවේ නිලධාරීන් වෘත්තීය ආයතන වල සාමාජික ගාස්තු ගෙවීමේදී පහත සඳහන් නිලධාරීන් සඳහා ඔවුන්ගේ සාමාජික ගාස්තු ප්‍රතිපූර්ණය කර ඇත.

1. **ජේ. ඒ. ඩී. ජේ. ජයලත් මහතා -** නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
   බ්‍රිතාන්‍ය පරිගණක සංගමය.
   ශ්‍රී ලංකා පරිගණක සංගමය.

2. **ඒ. එස්. අමරසිංහ මහත්මිය -** නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)
   ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය.
   සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරී සාමාජික ගාස්තු.

3. **ආර්. ජේ. සමරවීර මහතා -** නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන හා විමර්ශන)
   ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය.
   සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරී සාමාජික ගාස්තු

4. **එස්. යූ. කේ. රුබසිංහ මහතා -** අධ්‍යක්ෂ
   ශ්‍රී ලංකා වරලත් ඉංජිනේරු ආයතනය.
   ආයතන ලියාපදිංචි ප්‍රතිපාදන හා තත්ත්ව කළමනාකරණ පද්ධති අංශය.

5. **වජිර පෙරේරා මහතා -** සැලසුම් හා පර්යේෂණ අංශය
   ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ආයතනය.
   රාජකීය රසායන විද්‍යා සංගමය - එක්සත් රාජධානිය.

6. **ආචාර්ය එච්. එම්. ඒ. ඩී. කේ. හේරත් මහත්මිය -** සහකාර අධ්‍යක්ෂ
   ශ්‍රී ලංකා පරිගණක සංගමය.

4.7 මූල්‍ය ප්‍රගතිය.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය මඟින් ලබා දෙන ලදී.

2019 වර්ෂය සඳහා කොමිෂන් සභාව සිය වියදම් සඳහා පහත පරිදි ඇස්තමේන්තු කරන ලදී.

- පුනරාවර්තන වියදම සඳහා රුපියල් මිලියන 130 කි.
- ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 9.9 කි.
- ඇස්තමේන්තුගත ආදායම රුපියල් මිලියන 36 කි.

2019 වර්ෂය සඳහා මහාභාණ්ඩාගාරය විසින් කොමිෂන් සභාව වෙත ඇස්තමේන්තු ගත කරන ලද සම්පූර්ණ අගයම නිදහස් කර තිබුණි.

2019 වර්ෂයෙහි උපයනලද ආදායම පිළිබඳ විස්තර පහත පරිදි වේ.

ආදායම් වර්ගය	ඇස්තමේන්තුගත ආදායම (රු.)	සත්‍ය ආදායම (රු.)
ආයතන ලියාපදිංචි ආදායම	1,910,000.00	2,873,500.00
ආයතන ප්‍රතීතන හා ඇගයුම්	2,000,000.00	2,594,000.00
සහතිකපත් නිකුත් කිරීම	1,575,000.00	3,429,530.00
සහතිකපත් සැසඳීම	1,000,000.00	4,715,500.00
ජාතික වෘත්තීය සුදුසුකම් සහතික කිරීම	1,000,000.00	1,227,000.00
විභාග ගාස්තු	24,000,000.00	27,802,180.00
විෂය මාලා අලෙවිය	700,000.00	712,000.00
පොත් අලෙවි	215,000.00	6,450.00
ශිෂ්‍ය වාර්තා පොත් අලෙවිය	2,500,000.00	4,348,050.00
ඇගයුම් හා ඇගයුම් ආදායම්	100,000.00	100,050.00
තත්ව කළමණාකරන සහතික කිරීම	1,000,000.00	890,000.00
මුළු ආදායම	**36,000,000.00**	**48,698,260.00**

4.8 අභ්‍යන්තර විගණනය හා විමර්ශනය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්යයන්ට අදාලව විගණන පරීක්ෂණ පැවැත්වීම අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ඇත. පෙර වර්ෂ වලදී මෙන් අභ්‍යන්තර පාලන ක්‍රමවල ප්‍රමාණවත් බව චක්‍රලේඛ උපදෙස් වලට කොමිෂන් සභාවට අදාල වන වෙනත් නීති රීති වලට අනුකූලවීම විමසමින් කාර්ය සාධනය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන හා විමර්ෂණ කටයුතු විගණන සැලැස්මට අනුව ඉදිරියට ගෙන යන ලදී.

අභ්‍යන්තර විගණන හා විමර්ෂණ වැඩසටහන අනුව සැලසුම් කරන ලද ප්‍රධාන විගණන පෙදෙස් 06 ට ආවරණය කරන ලද අතර අභ්‍යන්තර විගණන හා විමර්ෂණ වැඩසටහන අනුව සැලසුම් නොකරන ලද විගණන විමර්ෂණයන්ද අභ්‍යන්තර විගනණය විසින් අධ්‍යක්ෂ ජනරාල්ගේ හා විගණන හා කළමණාකරන කමිටුවේ උපදෙස් පරිදි ඉටු කරන ලදී.

විගණන හා විමර්ෂණ කටයුතු සහ නව ප්‍රතිපත්ති යෝජනා කිරීම හෝ වෙනස් කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙන්ම විගණන හා කළමණාකරන කමිටුව විසින් කෙරුණු අතර කොමිෂන් සභාවේ දුර්වලතා හා ඌනතා අවම මට්ටමක පවත්වා ගැනීමට අවශ්‍ය යෝජනා අදාල නිළධාරීන්ගේ අවධානයට යොමු කිරීමට අවශ්‍ය කටයුතු අදාල වර්ෂයේදී සිදුකරන ලදී.

I. විගණන හා කළමණාකරන කමිටුව

2019 වර්ෂයේදී විගණන හා කළමණාකරන කමිටුව අවස්ථා දෙකක දී රැස්වූ අතර එම අවස්ථාවල දී විගණන හා කළමණාකරන කමිටුව විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් කළමණාකරන තීරණ කොමිෂන් සභාව වෙත නිර්දේශ කරන ලදී.

i. අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

ii. මූල්‍ය වාර්තා සමාලෝචනය හා ඒ සම්බන්ධ කළමණාකරන තීරණ.

iii. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධ කළමණාකරන තීරණ.

iv. අභ්‍යන්තර විගණනයේ හා විමර්ෂණයන්හි කාර්ය සාධනය.

v. කොමිෂන් සභාවේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සමාලෝචන හා කළමණාකරන තීරණය.

vi. විගණකාධිපති වාර්තා සමාලෝචනය.

vii. අනිකුත් මෙහෙයුම් හා පාලන කාර්යයන් සම්බන්ධ විවිධ කළමණාකරණ තීරණ.

මේ අනුව විගණන හා කළමණාකරන කමිටුව මනා ලෙස ඉහත තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරන ලදී.

මෙම කමිටු කාර්යයන් ඉටු කිරීමේදී විගණන හා කළමණාකරන කමිටුවේ සංයුතිය පහත පරිදි විය.

2019 ජනවාරි මස 01 දින සිට 2019 දෙසැම්බර් 31 දක්වා විගණන හා කළමණාකරන කමිටුව පහත නම් සඳහන් කොමිෂන් සභා සාමාජිකයන්ගෙන් යුක්ත විය.

I. 2019 ජූලි 21 විගණන හා කළමණාකරන කමිටුව පහත නම් සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය.

- හේමාල් කස්තුරිආරච්චි මයා (කොමිෂන් සභා සාමාජික) - කමිටු සභාපති
- ආචාර්ය රාණි ජයමහ (කොමිෂන් සභා සාමාජික) - කමිටු සාමාජික
- බුද්ධික මඩිහහේවා මයා (කොමිෂන් සභා සාමාජික) - කමිටු සාමාජික
- එස්.සී ජගත් මයා (අමාත්‍යාංශ ප්‍රධාන අභ්‍යන්තර විගණක) - නිරීක්ෂක
- එල්.ඒ.පී.එස් ගුණසේකර මිය (රජයේ විගණන අංශය) - නිරීක්ෂක

II. 2019 ඔක්තෝබර් 11 විගණන හා කළමණාකරන කමිටුව පහත නම් සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය.

- හේමාල් කස්තුරිආරච්චි මයා (කොමිෂන් සභා සාමාජික) - කමිටු සභාපති
- ආචාර්ය රාණි ජයමහ (කොමිෂන් සභා සාමාජික) - කමිටු සාමාජික
- බුද්ධික මඩිහහේවා මයා (කොමිෂන් සභා සාමාජික) - කමිටු සාමාජික
- ආර්.එම්.ඩී.එම් කුමාරි මිය (අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන අංශය) - නිරීක්ෂක
- එල්.ඒ.පී.එස් ගුණසේකර මිය (රජයේ විගණන අංශය) - නිරීක්ෂක

4.9 නීති කටයුතු

පනත සංශෝධනය කිරීමේ ප්‍රගතිය

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත 1999 අංක 50 දරණ (සංශෝධන) පනත මඟින් සංශෝධනය වී ඇත. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ආයතන ලියාපදිංචි කිරීම විධිමත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන පනතට අන්තර්ගත කිරීමේ වැදගත්කම හඳුනාගැනීමෙන් පසු අදාළ පනත තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කරන ලදී.

නීති කෙටුම්පත් දෙපාර්තුමේන්තුව විසින් සකසන ලද කෙටුම්පත කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සඳහා අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.තවද 2017 ජූලි මස නව කොමිෂන් සභාව පත්වීමෙන් අනතුරුව එම කෙටුම්පත යලිත් සංශෝධන සහිතව අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර එම කෙටුම්පත අමාත්‍යාංශය විසින් නීති කෙටුම්පත් දෙපාර්තුමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය.

පනත් කෙටුම්පත තවදුරටත් සලකා බැලීම සඳහා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය 1990 අංක 20 දරණ පනත තුළම අන්තර්ගත වී තිබීම හේතුවෙන් පනත් සංශෝධනයේ දී විය හැකි ආයතනික අරමුණු හා බලතල අතර පරස්පරතා මඟහරවා ගැනීම සඳහා ආයතන දෙකෙහිම නියෝජනය ඇතුලත් කමිටුවක් කොමිෂන් සභාව මඟින් පත් කරන ලදී.තවද,යෝජිත කෙටුම්පත සහ ඉහත තොරතුරු අමාත්‍යාංශය වෙත ඉදිරි කටයුතු සඳහා යොමු කර ඇත.

තවද, සම්පූර්ණ පනත එකවර සලකා බලා සංශෝධනය කිරීමේදී සිදුවන ප්‍රමාදය වලක්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය කරුණු සම්බන්ධයෙන් රෙගුලාසි සකස් කිරීමට අමාත්‍යවරයා විසින් 2018.11.21 දින රැස්වීමේදී ලබාදුන් උපදෙස් පරිදි සකස් කළ රෙගුලාසි කෙටුම්පතක් ද ඉදිරි කටයුතු සඳහා අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.

2018.12.10 දිනැති කොමිෂන් සභා අනුමැතිය පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ සාමාජිකයින්ගෙන් යුක්ත වූ කමිටුවක් පත්කරන ලදී. එහි නියෝජිතයන් වශයෙන් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරමින් නියෝජිතයින් පත්කරන ලදී. 2019 වර්ෂයේදී ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පුරප්පාඩුව පැවතීම හේතුවෙන් එම සාමාජිකයින් පත්වන තෙක් මෙම කමිටුව කැඳවීමට යම් අපහසුතාවයක් පැවතිනි.

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ නව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගෙන් මෙම කමිටුව නියෝජනය සඳහා යෝජිත නම් අප වෙත ඉදිරිපත් කරන ලෙස දන්වා ඇති අතර එම කරුණාත් සමඟ මෙම කටයුතු ඉදිරියට කරනු ලැබේ.

ලියාපදිංචි නොවූ තෘතීයික හා වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචි කිරීමට ගන්නා ලද පියවර

කොමිෂන් සභාවේ ලියාපදිංචි වීමෙන් තොරව පවත්වා ගෙන යනු ලබන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ආයතන ලියාපදිංචි කර කොමිෂන් සභාවේ නීත්‍යානුකූල අවසරය යටතේ පවත්වාගෙන යාමට අවශ්‍ය පියවරයන් ගනු ලැබිණ. ඒ අනුව පුවත්පත් දැන්වීම් පලකරමින් ලියාපදිංචි නොකර පවත්වා ගෙන යනු ලබන ආයතන වෙත දැනුවත් කිරීමේ ලිපි යැවීම මඟින් අදාල ආයතන ලියාපදිංචිය සඳහා යොමු කරන ලද අතර මේ වන විට 2019 වසර සඳහා එවැනි ලිපි 85 ක් පමණ යවා ඇති අතර ආයතන 25 ක් පමණ මේ සඳහා යහපත් ප්‍රතිචාර දක්වා ඇත.එමෙන්ම සියළු මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ආයතන වෙතද ලියාපදිංචි නොකළ වෘත්තීය පුහුණු ආයතනවල වෙළඳ දැන්වීම් සහ වෙනත් තොරතුරු ප්‍රකාශයට පත් කිරීමේදී සත්‍යාපනය කර ඉදිරිපත් කරන ලෙස ලිපි මඟින් දැනුවත් කර ඇත.

මූල්‍යාධාර නිසිලෙස භාවිත නොකල ආයතනයන් සම්බන්ධයෙන් ගනු ලැබූ නීතිමය පියවර

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 04(ඊ) හා 04(උ) වගන්තිය යටතේ පෞද්ගලික අංශයේ / රාජ්‍ය නොවන අංශයේ ආයතනයන්ට දී ඇති මූල්‍ය ප්‍රදානයන් නිසිලෙස ක්‍රියාත්මක නොකර හා පාඨමාලා ප්‍රතිපාදන නොවී පවත්වා ගෙන යනු ලබන ආයතනයක් මඟින් එම ණය මුදල අයකර ගැනීමට අවශ්‍ය නීතිමය පියවර ගැනීමද සිදු කරන ලදී. එහිදී පහත සඳහන් ආයතන සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකොට අවශ්‍ය ලේඛන කටයුතු යොදා ඇත.

සමාධි ප්‍රජා සංවර්ධන පදනම හා ශ්‍රී සෝභිත වෘත්තීය පුහුණු ආයතන සමඨ මණ්ඩලයට කැඳවූ අතර සහභාගී නොවීය. එසේ හෙයින් මේ වන විට සමඨ නොකිරීමේ සහතිකයක් නිකුත් කර ඇති අතර නඩු පැවරීමේ කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කරනු ලැබේ. ශ්‍රී සෝභිත වෘත්තීය පුහුණු ආයතනය වෙත එන්තරවාසි නිකුත් කිරීමෙන් අනතුරුව ඔවුන් කළ ඉල්ලීම සලකා බලා මෙම නඩුව සමඨයකට පත්කරමින් ලබා දී තිබූ භාණ්ඩ යළි කොමිෂන් සභාව වෙත ලබා ගැනීමට කටයුතු කර ඇත.

හික්මා ආයතනයට විරුද්ධව මේ වන විට නඩු පැවරීමේ කටයුතු සිදු කර ඇති අතර මෙමඟින් ලබා දී ඇති මූල්‍ය ප්‍රදානයන් හා නඩු ගාස්තු අයකර ගැනීමට කටයුතු කරමින් සිටී.

විමර්ෂන පැවැත්වීම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මෙම ක්ෂේත්‍රයේ නියාමන ආයතනය වශයෙන් විවිධ ක්ෂේත්‍රයන්ට අදාල පුහුණු මධ්‍යස්ථාන වල සිදුවන ගැටළු සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කිරීමට අදාල ආයතන පුහුණුවන්නන් සහ ඇගයීම් නිලධාරීන්ද පෙලඹී තිබේ. එහිදී අපක්ෂපාති මැදිහත්කරුවෙකු වශයෙන් එම ගැටළු සමඨයකට පත්කිරීමත් ඊට අවශ්‍ය ඇතැම් පරීක්ෂණ පැවැත්වීමක් සිදුකරයි. ඒ අනුව 2019 වර්ෂයේදී අදාල ආයතන හතරක් සම්බන්ධයෙන් විමර්ෂන පැවැත්වීමට කටයුතු කරන ලදී.

කොමිෂන් සභා රැස්වීම පැවැත්වීම

නෛතිකය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ (නීති) සහ කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් ද කටයුතු කරන අතර 2019 වර්ෂයේ ජනවාරි සිට ජූලි මාසය දක්වා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත්කර නොතිබූ බැවින්, එම සාමාජිකයින් පත්කල පසු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 05 ක් පවත්වන ලදී.

5.0 සැලසුම් හා පර්යේෂණ අංශය

කොමිෂන් සභාවේ සැලසුම් හා පර්යේෂණ අංශයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ 1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පාර්ලිමේන්තු පනතෙහි පළමු අරමුණ වූ, ශ්‍රී ලංකාවේ ආර්ථික හා මානව සම්පත් සංවර්ධන අවශ්‍යතාවන් අනුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ සංවර්ධනය කිරීම සඳහා සක්‍රීය දායකත්වය ලබාදීමයි. සැලසුම් හා පර්යේෂණ අංශය පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් ඉටුකිරීම සඳහා වගකීම දරයි.

- එක් එක් ක්ෂේත්‍ර සඳහා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස් කිරීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ සම්බන්ධීකරණ කටයුතු කිරීම
- ශ්‍රී ලංකාවේ පළාත්බද වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම
- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ප්‍රතිපත්ති සකස්කිරීම හා යාවත්කාලීන කිරීම
- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ පර්යේෂණ අධ්‍යයන ආශ්‍රිත සම්බන්ධීකරණය කටයුතු සිදුකිරීම
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීම හා ඒ අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම
- කොමිෂන් සභාවේ මාසික, කාර්තු හා වාර්ෂික ප්‍රගති වාර්තා සකස්කිරීම හා ඊට අදාළ සමාලෝචනයන් ක්‍රියාත්මක කිරීම
- පෞද්ගලික හා රාජ්‍ය නොවන වෘත්තීය පුහුණු ආයතනවලට මූල්‍යාධාර සැපයීම් සඳහා වූ කර්තව්‍යයේ මූලික කටයුතු සම්පාදනය කිරීම

ඉහත කාර්යයන් ඉටුකර ගැනීම සඳහා එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට, සැලසුම් හා පර්යේෂණ අංශය කාර්යමණ්ඩල සාමාජිකයින් 04 දෙනෙකුගෙන් සමන්විත වේ. කාර්ය මණ්ඩලය අතර අධ්‍යක්ෂවරයෙකු, සහකාර අධ්‍යක්ෂවරයෙකු, සංවර්ධන නිළධාරිනියක, සහ පරිගණක යෙදවුම් සහායක නිළධාරිනියක (මෙම නිළධාරිනිය දැනට කොමිෂන් සභා සේවයෙන් ඉවත් වී ඇත) ගෙන් සමන්විතය.

ඒ අනුව, සැලසුම් හා පර්යේෂණ අංශය පහත සඳහන් වැඩසටහන් 2019 වසරේදී ක්‍රියාත්මක කර ඇත.

5.1 පෞද්ගලික හා රාජ්‍ය නොවන වෘත්තීය පුහුණු ආයතනවලට මූල්‍යාධාර සැපයීමේ ක්‍රියාවලිය සඳහා මුල් අධියර ක්‍රියාත්මක කිරීම

පුද්ගලික අංශයේ හා රාජ්‍ය නොවන වෘත්තීය පුහුණු ආයතනයන්හි ක්‍රියාත්මක කරනු ලබන වෘත්තීය හා කාර්මික පුහුණු පාඨමාලාවල ගුණාත්මකභාවය හා ශ්‍රම වෙළෙඳපොලට අදාලත්වය අනුව දියුණු කිරීම සඳහා අවශ්‍යවන පුහුණු උපකරණ ලබාදීම පිණිස කොමිෂන් සභාව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. මෙමඟින් පුද්ගලික අංශයේ සහ රාජ්‍ය නොවන සංවිධානවල පුහුණු පාඨමාලා ජාතික නිපුණතා සම්මතයන්ට අනුව ප්‍රතිනතය කර ඒ තුළින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකපත්‍ර ප්‍රදානය කිරීමට හැකියාව ලැබෙනු ඇත.

2019 වර්ෂය සඳහා මූල්‍යාධාර වැඩසටහන යටතේ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ලියාපදිංචි පුහුණු ආයතන තුළින් අයදුම්පත්‍ර කැඳවන ලදුව, ලැබුනු අයදුම්පත්‍ර අතුරින් තෝරාගන්නා ලද පුහුණු ආයතනයන් 10 ක් සඳහා මූලික ඇගයීම් සිදු කොට ඉදිරි කටයුතු සඳහා කොමිෂන් සභාවේ ලියාපදිංචි හා ප්‍රතීතන අංශය වෙත යොමුකර ඇත.

5.2 වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස්කිරීම හා යාවත්කාලීන කිරීම (VET Plan)

සැලසුම් හා පර්යේෂණ අංශය, වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම සඳහා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස් කිරීමෙහි නිරතව සිටී. ඒ අනුව 2019 වර්ෂය තුලදී මෝටර්රථ කාර්මික අංශය සඳහා වූ පුහුණු සැලසුම යාවත්කාලීන කොට සම්පූර්ණ කරන ලදී. ඒ සඳහා ක්‍රියාත්මක කරන ලද ක්‍රියාවලිය 5.2.1. හි සඳහන් වේ. බස්නාහිර පළාත සඳහා වූ පළාත්බද පුහුණු සැලසුම 2013 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වුවත් එය අර්ධ ලෙස අවසන් කිරීම හේතුවෙන් එහි වැඩකටයුතු සම්පූර්ණ කිරීමටද 2019 වර්ෂයේදී සැලසුම් සකස් කරන ලදී. මෙම පුහුණු සැලැස්ම 2020 වර්ෂයේ අවසන් කලයුතු වේ.

a) මෝටර්රථ කාර්මික ක්ෂේත්‍රය සඳහා වූ පුහුණු සැලැස්ම යාවත්කාලීනකොට සකස් කිරීම

වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලැසුම් යාවත්කාලීන කිරීමේ වැඩසටහන යටතේ මෝටර්රථ කාර්මික ක්ෂේත්‍රය සඳහා වූ සැලැස්ම යාවත්කාලීන කිරීම 2018 වර්ෂයේ දෙවන කාර්තුවේදී ආරම්භ කරන ලද අතර, මල්ටි-ටෙක් සොලියුෂන් (Multitec Solutions) පුද්ගලික ආයතනය මේ සඳහා උපදේශන දායකත්වය ලබාදුනි. මෙම සැලැස්ම සකස් කිරීම සඳහා 2019 වර්ෂය තුලදී රු. 2,720,000.00 ක් වැයකර ඇති අතර, 2019 වර්ෂයේදී මෙම වාර්ථාව සාර්ථකව අවසන් කොට වලංගු (Validation) කිරීමේ වැඩසටහනක් හා අදාල ක්ෂේත්‍ර නිළධාරීන් ගෙන්වා ඔවුන්ට ඉදිරිපත් කිරීමේ (Launching) වැඩසටහනක් ද සිදුකරන ලදී. මේ සඳහා නිළධාරීන් 50 ක් සහභාගී වූ අතර මෙම වැඩසටහනේ මූලිකත්වය DIMO ආයතනයෙහි සභාපති රංජිත් පණ්ඩිතගේ මහතා යටතේ සිදු කරන ලදී. අදාළ වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලැස්ම මුද්‍රණය කොට අදාළ ආයතනයන් සඳහා පිටපත්ද නිකුත් කර ඇත.



පුහුණු සැලැස්මේ මුල් කවරය



DIMO ආයතනයෙහි සභාපතිගේ මූලිකත්වයෙන් පවත්වනලද වැඩසටහනේ ඡායාරූපයකි. (2019.10.04)

5.3 කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සැලසුම් හා පර්යේෂණ අංශය මඟින් පර්යේෂණ කවය පවත්වාගෙන යනු ලබයි (Research Cell). 2005 වර්ෂයේ සිට ආරම්භ කරන ලද පර්යේෂණ කවය මේවන විට කාර්මික හා වෘත්තීය ක්ෂේත්‍රයට වැදගත් පර්යේෂණ රාශියක් එළිදැක්වීම සඳහා මූල්‍යමය හා ශ්‍රම දායකත්වය ලබාදී ඇත. එමෙන්ම නිමකරන ලද පර්යේෂණ කොමිෂන් සභා වෙබ් අඩවිය තුල පරිශීලනය සඳහා ඇතුලත්කර ඇත. 2019 වර්ෂයේදී පර්යේෂණ කවය මඟින් ඉදිරිපත් කරන ලද කාර්යයන් 5.4 වගුවෙහි සඳහන් කොට ඇත.

5.3.1 නව පර්යේෂණ අධ්‍යයන

2019 වර්ෂය තුලදී, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයට අයත් පුහුණු ආයතන තුලින් පර්යේෂණ යෝජනා මෙන්ම, කෙටි ව්‍යාපෘති සඳහාද යෝජනා කැඳවන ලදී. පර්යේෂණ සිදුකලද මේ දක්වා සිදුකර ඇති පර්යේෂණයන්හි සඳහන් යෝජනා හා ඉදිරි වැඩපිළිවෙල ක්‍රියාත්මක කරවීමේ අඩුපාඩු හඳුනාගත් බැවින්, 2019 වර්ෂයේදී පර්යේෂණ වලට අමතරව කෙටි ව්‍යාපෘති සඳහා ද ඉඩ ප්‍රස්ථාව සලසා දෙන ලදී. මෙමඟින් කෙටි ව්‍යාපෘති අවසානයේ වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ ගැටලු සහ දියුණුවීම් කෙටිකලකින් ලඟා කර ගැනීම මෙහි අරමුණව ඇත. ඒ අනුව, විවිධ ආයතන නියෝජනය කරමින් පර්යේෂණ යෝජනා 27 ක්ද හා කෙටි ව්‍යාපෘති 02 ක් ද පර්යේෂණ කවය වෙත ලැබුණි. ඉන් 2019 වර්ෂයේ සඳහා පර්යේෂණ 06 ක් සහ කෙටි ව්‍යාපෘති 02 ක් ක්‍රියාත්මක කිරීමට තෝරාගන්නා ලදී. එම යෝජනා පර්යේෂණ මෙහෙයුම් කමිටුව (Research Steering Committee) විසින් ඇගයීමට ලක්කිරීමෙන් පසුව ක්ෂේත්‍රයට අයත් උචිත, කාලීන පර්යේෂණ අධ්‍යයන 06 ක් හා කුඩා ව්‍යාපෘති 02 සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගන්නා ලදී. (මින් එක් කුඩා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සිදු නොවුනි) එම පර්යේෂණ අධ්‍යයනවල ගුණාත්මකභාවය රැකගැනීම සඳහා පර්යේෂණ කටයුතු මෙහෙයවීම හා අවශ්‍ය උපදෙස් ලබාදීම, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පර්යේෂණ කවය සහ පර්යේෂණ කමිටුව විසින් සිදුකරන ලදී. ඒ සඳහා රු. මිලියන 2.0 ක මූල්‍ය අනුග්‍රහය ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් දරන ලදී. එක් එක් පර්යේෂණ අධ්‍යයනයන් සඳහා වෙන්කරන ලද වියදම් පහත වගු අංක 5.4 මඟින් දැක්වේ.



තව දුරටත් 2018 වර්ෂයේ අඩක් නිමකරන ලද පර්යේෂණ සම්පූර්ණයෙන්ම අවසන් කොට එකී පර්යේෂණයන්හි සාරාංශ එකතුකොට පොත් පිංචක් (Booklet) සකස්කොට බෙදා හරින ලදී.

වගුව 5.4: ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් මූල්‍ය අනුග්‍රහය දක්වන පර්යේෂණ අධ්‍යයනයන් 2019

අංකය	පර්යේෂණ මාතෘකාව	පර්යේෂණයේ අරමුණු	පර්යේෂණ කණ්ඩායම	අනුමත කරන ලද මුදල (රු.)	2019 වර්ෂයේ දී වැයවූ මුදල (රු.)
1.	රත්මලාන විශ්ව විද්‍යාලයේ ඩිප්ලෝමා පාඨමාලාවල NVQ මට්ටම් 05 සහ 06 හි අභ්‍යාසලාභී කාර්යසාධනය පිළිබඳ පදනම් වැඩ සටහනේ බලපෑම පිළිබඳ අධ්‍යයනයක් - 2015 සිට 2018 දක්වා. පුහුණු වන්නන්ගේ කාර්යයසාධනය පිළබඳ විස්තරාත්මක විශ්ලේෂණයක්.	රත්මලාන කාර්මික විද්‍යාලයේ ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා පුහුණු කාර්යය සාධනය සඳහා පදනම් වැඩසටහන්හි බලපෑම හඳුනා ගැනීම. අරමුණු වන්නේ, ● පුහුණුකරුවන්ගේ කාර්ය සාධනය කෙරෙහි බලපෑමක් ඇතිවන ආකාරයේ සුදුසු පදනම් වැඩ සටහන් සංවර්ධනය කිරීම. ● පුහුණු කාර්යය සාධනය සඳහා පදනම් වැඩසටහන්හි වැදගත්කම තීරණය කිරීම.	වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය	60,000.00	30,000.00
2.	2010 - 2014 කාලය තුළ සාගර විශ්ව විද්‍යාලයේ උපාධි පාඨමාලාව හැදෑරූ උපාධිධාරීන්ගේ රැකියා ස්වභාවය	● සාගර විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන්ගේ රැකියා තත්ත්වය සහ රැකියා කාර්යය සාධනය අනුව උපාධිය ලැබීමෙන් පසු උපාධි පාඨමාලාවේ බලපෑම හඳුනා ගැනීම. ● දත්ත අනුව රැකියා කාණ්ඩගත කළ පසු උපාධිය හා රැකියා තත්ත්වයේ වෙනස හඳුනා ගැනීම. ● උපාධි ශිෂ්‍ය සංවර්ධන සඳහා ක්‍රියාකාරී සැලැස්මක් යෝජනා කිරීම.	සාගර විශ්ව විද්‍යාලය	190,000.00	95,000.00

අනු අංකය	පර්යේෂණ මාතෘකාව	පර්යේෂණයේ අරමුණු	පර්යේෂණ කණ්ඩායම	අනුමත කරන ලද මුදල (රු.)	2019 වර්ෂයේ දී වැයවූ මුදල (රු.)
3.	ශ්‍රී ලංකාවේ සමුද්‍රීය අංශයට අදාළ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සඳහා කාන්තා සහභාගීත්වය පිළිබඳ අධ්‍යයනය	සමුද්‍රීය පුහුණුව හා ධීවර ක්ෂේත්‍රයේ කාන්තාවන්ට වෘත්තීය අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් සඳහා ප්‍රවේශ වීමට සහ සහභාගී වීමට බලපාන සාධක සමාලෝචනය. ● පුහුණුව සහ අධ්‍යාපනය සඳහා කාන්තාවන්ට ඇති ප්‍රවේශය වැඩි දියුණු කිරීම. ● පසුගිය වසර 10 තුළ සමත් වූ පිරිමි සහ ගැහැණු ළමයින්ගේ රැකියා තත්ත්වය සොයා ගැනීම. ● ධීවර හා නාවික අංශවලට අදාළ වෘත්තීය අධ්‍යාපනයට කාන්තාවන්ගේ වැඩි සහභාගීත්වය සඳහා නිගමන හා යෝජනා ඉදිරිපත් කිරීම.	සාගර විශ්ව විද්‍යාලය	280,000.00	140,000.00
4.	ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරියේ ස්වයංක්‍රීය ජංගම වෙළඳාම පාඨමාලාවේ අපේක්ෂිත NVQ මට්ටමට සහ ප්‍රධානය කරන ලද NVQ මට්ටමේ මාදිලියේ (CBT & EBT) අධ්‍යයනය කිරීම	● ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් බඳවා ගත් ආධුනිකයින්ගේ මට්ටම සහ ප්‍රධානය කරන ලද සුදුසුකම් මට්ටමේ මෝටර් රථ යාන්ත්‍රික වෙළඳාමේ වෙනස හඳුනා ගැනීම ● ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ පාඨමාලාවල CBT / EBT මාදිලිය අතර සංසන්දනය අවබෝධ කර ගැනීම	ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය	120,000.00	60,000.00

අනු අංකය	පර්යේෂණ මාතෘකාව	පර්යේෂණයේ අරමුණු	පර්යේෂණ කණ්ඩායම	අනුමත කරන ලද මුදල (රු.)	2019 වර්ෂයේ දී වැයවූ මුදල (රු.)
5.	සිසුන් පිළිබඳ අධ්‍යයනය උතුරු පළාතේ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව කෙරෙහි දක්වන ආකල්පය	• උතුරු පළාතේ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව පිළිබඳ ශිෂ්‍ය ආකල්ප අධ්‍යයනය කිරීම.	ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය	63,000.00	31,500.00
6.	දරිද්‍රතාවයේ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනයේ කාර්යභාරය ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන් අතර අවම කිරීම	ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය අවම කිරීම සඳහා තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනයේ කාර්යයභාරය විමසීම. • වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන වැඩ සටහන මඟින් ලබා දෙන තාක්ෂණික උපාධි මඟින් ලබාදෙන උපාධි මඟින් ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට ජීවනෝපායක් සකසාගත හැකිද යන්න අධ්‍යයනය කිරීම. • ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය අඩු කිරීමට තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනයේ කාර්යයභාරය විමසීම.	වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය	195,000.00	97,500.00
කෙටි ව්‍යාපෘති					
7	දහතුන් වසරක පාසල් අධ්‍යාපනයේ වෘත්තීය පුහුණු අංශය සඳහා වෘත්තීය ආරක්ෂාව පිළිබඳ ගුරු පුහුණුව	• වෘත්තීය පුහුණුවේ සෞඛ්‍ය හා ආරක්ෂාව සම්බන්ධයෙන් පාසලේ දහතුන් වසරක අධ්‍යාපනය යටතේ ගුරුවරුන් පුහුණු කිරීම. • 12-13 ශ්‍රේණියේ ගුරු පුහුණුකරුවන් පුහුණු කිරීම.	ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය	500,000.00	250,000.00
මුළු එකතුව				**1,408,000.00**	**704,000.00**

2019 වර්ෂයේදී ආරම්භකල පර්යේෂණ අධ්‍යයන සඳහා රු. මිලියන 2 ක මුදලක් නිපුණතා සංවර්ධන අරමුදලෙන් ප්‍රතිපාදන ලෙස ලැබුණු අතර, 2019 වර්ෂයේදී එම අනුමත ප්‍රතිපාදන වලින් 50% ක ප්‍රතිශතයක් වැයකිරීමට හැකියාව ලැබුණි. ඉතිරි මුදල පර්යේෂණ අධ්‍යයන නිමකිරීමෙන් අනතුරුව 2020 වර්ෂයේදී ගෙවා නිමකිරීමට නියමිතය.

5.3.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම - 2019 (AIP 2019)

සැලසුම් හා පර්යේෂණ අංශය විසින් 2019 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කොට එකී සැලැස්ම සියලු අංශ සමඟ සාකච්ඡාවට ලක්කර ඒ සඳහා කොමිෂන් සභා අනුමැතිය ලබා ගෙන ඇත. තව දුරටත් 2020 වර්ෂයේදීද ඉහත ආකාරයට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කොට කොමිෂන් සභා අනුමැතිය ලබා ගන්නා ලදී.



වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2019



වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම - 2020

සැලසුම් හා පර්යේෂණ අංශය විසින් සංයුක්ත සැලැස්ම සකස් කිරීමට ද නියමිතය. ඒ අනුව එහි දළ පිටපතක් 2019 වර්ෂයේදී සකස් කොට නිම කරන ලදී. මෙය 2020 - 2024 දක්වා කාල පරාසයට අයත් වේ.

සැලසුම් හා පර්යේෂණ අංශය පාර්ලිමේන්තු පනතට අනුව සංවර්ධන සැලසුමක් (Development Plan) සකස්කිරීමට ද නියමිතය. තවද මේ සඳහා කණ්ඩායම් 05 කින් යුත් කමිටුවක් පත්කොට ඇත. තවද, මෙම ක්‍රියාවලියේදී Sustainable Development Goals ඉලක්ක, ජාතික වෘත්තීය පුහුණු ප්‍රතිපත්ති සහ මහබැංකු වාර්ථා යෝජනා ඉහත සැලසුම් සඳහා මූලාශ්‍ර ලෙස ද යොදාගැනීමට නියමිතය.

6.0 පාඨමාලා ලියාපදිංචි, පිළිගැනීම් හා තත්ත්ව කළමනාකරණ පද්ධති අංශය

1990, අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතට අනුව සහ වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය උදෙසා වූ සංවර්ධන සැලැස්මට අනුව, (1995 සැප්තැම්බර් 05 දින අංක 887/8 දරණ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් සියළු වෘත්තීය පුහුණු ආයතන සඳහා පහත පරිදි අදියර තුනකින් යුතු තත්ත්ව ආරක්ෂණ ක්‍රමවේදයක් අනුගමනය කරනු ලබයි.

1. වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය
2. පාඨමාලා ප්‍රතිනතය
3. තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීම
4. ආයතනයන් වෙත මූල්‍යාධාර ලබාදීම සඳහා නිර්දේශයන් ලබා දීම

පාඨමාලා ප්‍රතිනතය කිරීම සඳහා පුහුණු උපකරණ අඩුපාඩු පවතින පුහුණු ආයතනය වෙත එම උපකරණ ලබා ගැනීම සඳහා මූල්‍යාධාර ප්‍රදානය කිරීම මෙම කොමිෂන් සභාව මඟින් සිදු කරනු ලැබේ. 2019 වර්ෂය තුළ තෝරාගත් ක්ෂේත්‍රයන් සඳහා මූල්‍යාධාර ප්‍රදානය කිරීම සඳහා අයඳුම්පත් කැඳවන ලදී.

ඒ සඳහා අයඳුම්පත් 20ක් ලැබී තිබූ අතර ඒ සඳහා ඔවුන් තෝරාගැනීමේ සුදුසුකම් සොයා බලන ලදී. කෙසේ වෙතත් 2019 වර්ෂයේ කිසිදු ආයතනයක් වෙත මූල්‍යාධාර ලබා දීම නිර්දේශකර නොමැත.

ඉහත කරුණු 3 ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අංශයේ නිලධාරීන් 12 දෙනෙකුගේ සංයුක්තියකින් සමන්විත අතර, අධ්‍යක්ෂවරයකු, නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන් 02, සහකාර අධ්‍යක්ෂවරු 02 ,වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරීන් 02 සංවර්ධන නිලධාරීන් 02, කළමනාකරණ සහකාරවරුන් 02 සහ කාර්යාල කාර්යය සහායකයෙකු මීට ඇතුලත් වේ.

6.1. වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය

වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය නෛතික අවශ්‍යතාවක් වන අතර,රට තුල ක්‍රියාත්මකවන සියළු වෘත්තීය පුහුණු ආයතන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි විය යුතුය. (ඉහත සඳහන් කරන ලද පනතට අනුව) ලියාපදිංචිය සඳහා ආයතනයන්හි යටිතල පහසුකම් සහ ප්‍රමාණවත්බව, පුහුණු උපකරණ, ප්‍රමාණාත්මක බව උපදේශකයන්ගේ සුදුසුකම්, පුහුණුව ලබාදීමේ ක්‍රමවේදය, විෂයමාලාවන්හි ප්‍රමාණවත්බව, පිළිබඳ විමර්ශණය කර ඒ අනුව වර්ෂ දෙකක කාලයකට කොමිෂන් සභාව එම ආයතන සඳහා ලියාපදිංචිය ලබාදේ.

2019 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කොමිෂන් සභාව 700 ආයතන ප්‍රමාණයක් ලියාපදිංචිය සඳහා ඇගයීම් කිරීම ඉලක්ක ගත කර ඇති අතර ආයතන 697 ප්‍රමාණයක් ඇගයීමට ලක්කර ඇත.

ආයතන ලියාපදිංචිය සඳහා ඇගයීම් කිරීම් (නව සහ යාවත්කාලීන) වර්ගීකරණයට අනුව සංඛ්‍යා පහත වගුවෙහි දක්වා ඇත.

ආයතන වර්ගය	ආයතන ප්‍රමාණය		එකතුව
	නව ලියාපදිංචි කිරීම්	ලියාපදිංචිය යාවත්කාලීන කිරීම්	
(ඉලක්කගත) ඇගයීම් ප්‍රමාණය	300	400	700
අයදුම්පත් ලද සංඛ්‍යාව	315	369	684
ඇගයීම් කල ප්‍රමාණය	296	401	697

2019 වර්ෂයේ පුහුණු ආයතන ලියාපදිංචි කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලද පුහුණු ආයතන එහි හිමිකාරිත්වය අනුව පහත දක්වා ඇත.

ආයතන වර්ගය හිමිකාරිත්වය	ලියාපදිංචි කල ප්‍රමාණය නව*	ලියාපදිංචි කල ප්‍රමාණය (යාවත්කාලීන කිරීම්)
රාජ්‍ය ආයතන	15	56
ව්‍යවස්ථාපිත හෝ සංස්ථා, මණ්ඩල	17	61
පුද්ගලික	121	189
එකතුව	**153**	**306**

2019 වර්ෂයේ අවසානයේ වෘත්තීය පුහුණු ආයතන 1290 ප්‍රමාණයක් ලියාපදිංචිය වලංගු තත්වයේ පවතින ලද අතර පුහුණු ආයතන හිමිකාරිත්වය අනුව පහත දක්වා ඇති පරිදි වේ.

1. රාජ්‍ය ආයතන / ව්‍යවස්ථාපිත සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල - 582
2. පෞද්ගලික / රාජ්‍ය නොවන ආයතන - 708

පුහුණු මධ්‍යස්ථාන ලියාපදිංචි ඇගයීම් කටයුතු සඳහා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ පලපුරුදු නිලධාරීන්ගේ සේවය ලබාගනු ලැබේ. නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අනියුක්ත කර ඇති නිපුණතා සංවර්ධන නිලධාරීන් 46 දෙනෙකු ඉහත ඇගයීම්කිරීමට සම්බන්ධව පුහුණුව ලබාදී ඔවුන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කර ඇත.

ලියාපදිංචිය ලත් වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය තහවුරු කිරීමේ ලිපි නිකුත් කිරීම

වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන මගින් පුහුණුව ලබන ලද සහතිකපත්‍රලාභීන් විදේශගතවීම් සඳහා අදාල පුහුණු ආයතනයන්හි ලියාපදිංචිය තහවුරු කිරීමේ ලිපි විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත නිකුත් කිරීම මෙම අංශය සිදු කරනු ලැබේ. එවැනි ලිපි 1280 කට වැඩි සංඛ්‍යාවක් 2019 වසර තුල විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත නිකුත් කර ඇත.

6.2 NVQ සහතික ලබා දීම සඳහා පාඨමාලා ප්‍රතීතනය

ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව 2004 වර්ෂයේ හඳුන්වා දෙන ලදී. යම් වෘත්තීයන් සඳහා NVQ සුදුසුකම් ප්‍රදානය කිරීම සඳහා ජාතික නිපුණතා සම්මතයන් සංවර්ධනය කර තිබිය යුතුය. එම නිපුණතා සම්මත අනුව ජාතික විෂය මාලාවන් සකස් කරන අතර ඒ අනුව නිපුණතා පාදක ක්‍රමය යටතේ පුහුණු කටයුතු සිදු කරන පාඨමාලාවන් ප්‍රතීතනය කිරීම මෙම කොමිෂන් සභාව මඟින් සිදු කරනු ලැබේ.

2019 වර්ෂය තුල සිදු කරන ලද පාඨමාලා ප්‍රතීතනය ඇගයීම් ප්‍රමාණය පහත වගුවේ සඳහන් පරිදි වේ. ප්‍රතීතනය ලබා ඇති පාඨමාලා හරහා පුහුණුවක් ලබන පුහුණුවන්නන් අවසන් ඇගයීම මෙම කොමිෂන් සභාව මඟින් සිදු කරන අතර එහි ප්‍රතිඵල අනුව NVQ සුදුසුකම් ප්‍රදානය කරනු ලැබේ.

ආයතන වර්ගය	පාඨමාලා ප්‍රතීතන ඇගයීම් ප්‍රමාණය		එකතුව
	නව	යාවත්කාලීන	
ඉලක්ක ගත ඇගයීම් ප්‍රමාණය	340	600	940
ප්‍රතීතන ඇගයීම් සිදු කල ප්‍රමාණය	690	740	1430

2019 වර්ෂය තුල මෙම කොමිෂන් සභාව මඟින් ප්‍රතීතනය කරන ලද මුළු පාඨමාලා සංඛ්‍යාව 926 වන අතර හිමිකාරිත්වය අනුව එය පහත දක්වා ඇති වගුවේ පරිදි වේ.

ආයතන හිමිකාරිත්වය	පාඨමාලා ප්‍රතීතන සංඛ්‍යාව (නව)	පාඨමාලා ප්‍රතීතන සංඛ්‍යාව (යාවත්කාලීන)
රාජ්‍ය ආයතන	155	124
ව්‍යවස්ථාපිත හෝ සංස්ථා මණ්ඩල	270	306
පෞද්ගලික	138	65

6.3 වෘත්තීය පුහුණු ආයතන තුල තත්ත්ව කළමණාකරන පද්ධතිය ස්ථාපනය කිරීමේ ක්‍රියාවලිය සහ සහතිකකරණය.

වෘත්තීය පුහුණු ආයතන තුල තත්ත්ව කළමණාකරණ පද්ධති ස්ථාපනය කිරීම සඳහා බාහිර තත්ත්ව විගණනය කිරීම මෙම සභාව මගින් සිදු කරනු ලැබේ. 2019 වර්ෂයේදී පුහුණු ආයතන 49 ක තත්ව කළමණාකරන පද්ධති ස්ථාපනය කරන ලදී. පහත දක්වා ඇති පුහුණු ආයතන තත්ත්ව කළමණාකරණය ස්ථාපනය සඳහා සහතිකකරණය ලබා දීම සිදු කරන ලදී.

1. සුවිස් ලංකා පුහුණු මධ්‍යස්ථානය - ජාතික තරුණ සේවා සභාව - එරමිනියාය
2. ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - පරන්තන්
3. රණවිරු සේවා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - වත්තල
4. ජාතික තරුණ සේවා සභාව - පුත්තලම
5. ජැෆ්නා කොලේජ් ඉන්ස්ටිටියුට් ඔෆ් ඇග්රිකල්චර් වොකේෂන්ල් ට්‍රේනින් සෙන්ටර්
6. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - මහියංගනය
7. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - නාවලපිටිය
8. ජාතික තරුණ සේවා සභාව - කහටගස් දිගිලිය
9. යොවුන් නිකේතනය ජාතික තරුණ සේවා සභාව- අනුරාධපුර
10. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - අංගම්මන ගම්පොල
11. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය- යායවත්ත
12. තාක්ෂණ විද්‍යාලය- හසලක
13. ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනය - කිලිනොච්චි
14. විශ්ව විද්‍යාල විද්‍යායතනය - බටන්ගල
15. උලපනේ පුහුණු මධ්‍යස්ථානය - ජාතික තරුණ සේවා සභාව
16. යොවුන් සවිබල ගැන්වීමේ මධ්‍යස්ථානය -ජාතික තරුණ සේවා සභාව- මාතර
17. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - වැල්ලවත්ත
18. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - කිරින්ද
19. සාගර විශ්ව විද්‍යාලය - මට්ටක්කුලිය
20. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - මාවතගම
21. ඩිමෝ පුද්ගලික සමාගම - වැලවිරිය
22. දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - මාරවිල

23. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - වෑගිරිය

24. යුනයිටඩ් ට්‍රැක්ටර්ඩ් පුද්ගලික සමාගම

25. ජාතික තරුණ සේවා සභාව - රිකිල්ලගස්කඩ

26. ජාතික තරුණ සේවා සභාව - පොල්ගොල්ල

27. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - ගොතටුව

28. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - රාජගිරිය

29. ටෙක්නික් ඉන්ටරනැෂනල් පුද්ගලික සමාගම

30. ලිට්ල් බඩිස් පුහුණු මධ්‍යස්ථානය

31. දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - සාරගම කුරුණෑගල

32. ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - අගුනුකොළපැලැස්ස

33. ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - කුරුවිට

34. ජූලිස්ටන් ලංකා ඉන්ටරනැෂනල් පුද්ගලික සමාගම

35. කාර්මික විද්‍යාලය - කුලියාපිටිය

36. දොන් බොස්කො වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - මැටියගනේ - නාරම්මල

37. තාක්ෂණ විද්‍යාලය - කුරුණෑගල

38. කලම්බු ස්කූල් ඔෆ් කනස්ට්‍රක්ෂන් ටෙක්නොලොජි පුද්ගලික සමාගම

39. කාර්මික විද්‍යාලය- මාතලේ

40. දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - නුවරඑළිය

41. කාර්මික විද්‍යාලය - දඹුල්ල

42. ඇක්වයිනාස් කොලෙජ් ඔෆ් හයර්ස්ටඩීස් - කොළඹ

43. ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - වාරියපොල

44. කාර්මික විද්‍යාලය- නුවරඑළිය

45. ජාතික තරුණ සේවා සභාව මාතර - පානදුර

46. විශ්ව විද්‍යාල විද්‍යායතනය - කුලියාපිටිය

47. දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - පේරාදෙණිය

48. කෘෂිකර්ම විද්‍යාලය - වවුනියා

49. දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - වේයන්ගොඩ

මීට අමතරව පුහුණු මධ්‍යස්ථාන තුල තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා එක්දින වැඩසටහන් 05 ක් පවත්වා ඇත. මේ සඳහා වෘත්තීය පුහුණු ආයතනයන්හි නිලධාරීන් 200 ආසන්න ප්‍රමාණයක් සහභාගී වී ඇත.

2019 වර්ෂයේදී නිලධාරීන් 04 දෙනෙකු ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශයේ විගණක සුදුසුකම් ලබා ඇත. දැනට වෘත්තීය විගණකවරුන්ගේ අවශ්‍යතාවයක් පවතින අතර, ඒ අනුව විගණන සංසදයේ විගණකවරු 35 දෙනෙකු සක්‍රීය සේවයේ සිටී. ඒ සඳහා තවත් නිලධාරීන් පුහුණු කිරීමට නියමිතය.

2019 වර්ෂය තුල කොමිෂන් සභාව ආයතන ලියාපදිංචිය පාඨමාලා ප්‍රතීතනය සහ අදාල කටයුතු තුලින් උපයා ඇති මුදල පහත අයුරුවේ.

පුහුණු මධ්‍යස්ථාන ලියාපදිංචි ගාස්තු ආදායම	-	රු. 2,873,500.00
ප්‍රතීතන ගාස්තු ආදායම	-	රු. 2,594,000.00
ශිෂ්‍ය වාර්තා පොත් විකිණීමෙන් (Student Record books)	-	රු. 4,348,050.00
තත්ත්ව කළමනාකරණ (QMS) සහතික පත්‍ර නිකුත් කිරීම	-	රු. 890,000.00
පුහුණු ආයතන ලියාපදිංචි තහවුරු කිරීමේ ලිපි	-	රු. 1,227,000.00
ලියාපදිංචි කල් ඉකුත්වීමේ දඩ	-	රු. 77,200.00
මෙම මුදල භාණ්ඩාගාරයට බැරකර ඇත.	**-**	**රු. 12,009,750.00**

මෙම ආදායමද සැලකිල්ලට ගනිමින් වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිලියෙල කෙරේ.

7.0 ජාතික නිපුණතා සම්මත, විෂය මාලා සහ ජාතික වෘත්තීය සුදුකම් අංශය

7.1 ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා වෘත්තීන්ට අදාලව ජාතික නිපුණතා සම්මතයන් සහ නිපුණතා පාදක විෂය මාලාවන් සකස් කිරීම ප්‍රධාන අවශ්‍යතාවයකි. ඒ අනුව 2019 වසරේ දී පහත සඳහන් නව ජාතික නිපුණතා සම්මත සංවර්ධනය කරන ලදුව ඒවා බලලත් කරන ලදී.

7.1.1 කර්මාන්ත කේෂ්ත්‍ර සහා මඟින් යෝජනා වූ උපදෙස් මත සකස් කරන ලද නව ජාතික නිපුණතා සම්මත සහ විෂය මාලාවන් පහත සඳහන් වේ.

• හයිඩ්‍රොලික් ශිල්පී	4 වන මට්ටම
• නිෂ්පාදන සහකාර	4 වන මට්ටම
• ප්‍රතිචක්‍රීකරණ කර්මාන්ත සහකාර	4 වන මට්ටම
• සංචාරක ත්‍රී රෝද රථ රියදුරු	4 වන මට්ටම
• මල් වගා හා භූ දර්ශන සංවර්ධන සහකාර	4 වන මට්ටම
• බහු මාධ්‍ය සැලසුම් සහකාර	4 වන මට්ටම
• මෝටර් රථ ශීතකරණ සහ වායු සමීකරණ ශිල්පී	4 වන මට්ටම
• මෘදුකාංග සංවර්ධනකරු	4 වන මට්ටම
• සත්කාර සේවා ලබා දෙන්නා (ළමා)	2/3/4 වන මට්ටම
• සත්කාර සේවා ලබා දෙන්නා (වැඩිහිටි)	4 වන මට්ටම
• රුධිර සාම්පල ලබා ගැනීමේ නිලධාරී	4 වන මට්ටම
• ඇඟලුම් නිර්මාණ ශිල්පී	4 වන මට්ටම
• ස්වයංක්‍රියකරණය සහ රොබෝ තාක්ෂණය	5/6 වන මට්ටම
• කෘෂිකර්මාන්ත පර්යේෂණ සහ නිෂ්පාදන සහයක	4 වන මට්ටම
• මෝටර් රථ තාක්ෂණ වෙළඳ සහකාර	4 වන මට්ටම
• මුද්‍රණ හා ග්‍රැෆික් කලා තාක්ෂණය	5 වන මට්ටම
• ක්‍රීඩා සම්භාහක	3/4 වන මට්ටම
• මෝටර් රථ වර්ණ තාක්ෂණ ශිල්පී	4 වන මට්ටම
• විනෝදාත්මක ජල ක්‍රීඩා විද්‍යාව	5/6 වන මට්ටම
• බහු මාධ්‍ය සැලසුම් සහකාර	4 වන මට්ටම
• රිගර් (Rigger)	4 වන මට්ටම
• යන්ත්‍ර වෑද්දුම් ශිල්පී	4 වන මට්ටම

7.1.2 සකස් කරන ලද නව ජාතික නිපුණතා සම්මතය පමණක් පහත සඳහන් වේ.

- කාලගුණ විද්‍යා තාක්ෂණය — 6 වන මට්ටම

7.1.3 සකස් කරන ලද නව විෂය මාලා පමණක් පහත සඳහන් වේ.

- පෙර පාසල් කළමනාකරණය — 5/6 වන මට්ටම
- ඖෂධවේදී — 4 වන මට්ටම
- පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය — 5/6 වන මට්ටම

7.2 පහත සඳහන් ජාතික නිපුණතා සම්මත හා විෂයමාලා යාවත්කාලීන කිරීමෙන් අනතුරුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා බලාත්මක කරන ලදී.

7.2.1 යාවත්කාලීන කරන ලද නිපුණතා සම්මත සහ විෂය මාලා පහත සඳහන් වේ.

- යකඩ දඬු නමන්නා — 3 වන මට්ටම
- පිළිගැනීමේ නිලධාරී - හෝටල් ක්ෂේත්‍රය — 4 වන මට්ටම
- දන්ත ශල්‍යාගාර හෙද සහයක — 4 වන මට්ටම
- ශීතකරණ සහ වායු සමීකරණ කාර්මික ශිල්පී — 4 වන මට්ටම
- මෝටර් රථ වායු සමීකරණ කාර්මික/තාක්ෂණ ශිල්පී — 3/4 වන මට්ටම
- පරිගණක ප්‍රකාශන ශිල්පී — 3 වන මට්ටම
- ජයාරූප ශිල්පී — 4 වන මට්ටම
- නිෂ්පාදන සුපරීක්ෂක (මැහුම්) — 4 වන මට්ටම
- ඉදිකිරීම් වැඩබිම් අධීක්ෂක — 4 වන මට්ටම
- ටයිල් අතුරන්නා — 4 වන මට්ටම
- ශාරීරික යෝග්‍යතා පුහුණුකරු — 4 වන මට්ටම
- කුරුඳු ක්ෂේත්‍ර මෙහෙයුම් — 3/4 වන මට්ටම
- කුරුඳු කර්මාන්තශාලා මෙහෙයුම් — 3/4 වන මට්ටම
- අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු — 3/4 වන මට්ටම
- බහු නිපුණතා ශිල්පී — 3/4 වන මට්ටම
- මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී — 3/4 වන මට්ටම

- ත්‍රී රෝද රථ කාර්මික ශිල්පී — 4 වන මට්ටම
- ගෘහ අලංකරණ ශිල්පී — 4 වන මට්ටම
- ජලනල කාර්මික ශිල්පී — 3/4 වන මට්ටම
- ලේකම් පරිචය — 4 වන මට්ටම
- ඉදිකිරීම් උපකරණ තාක්ෂණ ශිල්පී — 4 වන මට්ටම
- ඉදිකිරීම් ශිල්පී — 4 වන මට්ටම
- පින්තාරු (ගොඩනැගිලි) — 3 වන මට්ට
- පිටපුවරු මෝටර් කාර්මික — 4 වන මට්ටම
- කාමර සහයක හෝටල් ක්ෂේත්‍රය — 3 වන මට්ටම

7.2.2 යාවත්කාලීන කරන ලද නිපුණතා සම්මත පමණක් පහත සඳහන් වේ.

- කෘෂිකර්මාන්ත නිෂ්පාදන තාක්ෂණය — 5/6 වන මට්ටම

7.3 ජාතික නිපුණතා සම්මත හා විෂයමාලා පරිවර්තන කටයුතු සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද ජාතික නිපුණතා සම්මත සහ විෂයමාලා පහත සඳහන් වේ.

පහත සඳහන් ජාතික නිපුණතා සම්මත සහ විෂයමාලා සිංහල භාෂාවට පරිවර්තනය කරන ලදී.

- ජලනල කාර්මික ශිල්පී
- සත්කාර සේවා ලබා දෙන්නා (වැඩිහිටි)
- ඉදිකිරීම් ශිල්පී
- ත්‍රීරෝද රථ කාර්මික ශිල්පී
- ඇලුමිනියම් පිරිසැකසුම් සහ ගෘහ අලංකරණ ශිල්පී
- ඡායාරූප ශිල්පී
- අධිවේගී මහන යන්ත්‍ර කාර්මික ශිල්පී
- ටයිල් අතුරන්නා

පහත සඳහන් නිපුණතා සම්මත හා විෂයමාලා දෙමළ භාෂාවට පරිවර්තනය කරන ලදී.

දෙමළ භාෂාවට පරිවර්තනය කරන ලද ජාතික නිපුණතා සම්මත සහ විෂයමාලා පහත සඳහන් වේ.

- ජලනල කාර්මික ශිල්පී
- ඉදිකිරීම් ශිල්පී
- ඇලුමිනියම් පිරිසැකසුම් සහ ගෘහ අලංකරණ ශිල්පී
- ත්‍රීරෝද රථ කාර්මික ශිල්පී
- ලේකම් පරිචය
- කුරුඳු ක්ෂේත්‍ර මෙහෙයුම්
- කුරුඳු කර්මාන්තශාලා මෙහෙයුම්
- පිට පුවරු මෝටර් කාර්මික
- සත්කාර සේවා ලබා දෙන්නා (ළමා)
- හෙද සහයක
- ටයිල් අතුරන්නා
- සත්කාර සේවා ලබා දෙන්නා (වැඩිහිටි)

දෙමළ භාෂාවට පරිවර්තනය කරන ලද ජාතික නිපුණතා සම්මත පමණක් පහත සඳහන් වේ.

- කෘෂිකර්මාන්ත සහයක
- ශීතකරණ සහ වායු සමීකරණ කාර්මික ශිල්පී
- කොණ්ඩා සැකසුම්

දෙමළ භාෂාවට පරිවර්තනය කරන ලද විෂයමාලා පමණක් පහත සඳහන් වේ.

- අත් යන්ත්‍ර ශිල්පී
- ජල ජීවී වගා ශිල්පී

7.4 ජාතික වෘත්තීය සුදුසුකම් නොවන පාඨමාලාවන්හි සුදුසුකම් ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් වලට සමාන කිරීම.

ජාතික වෘත්තීය සුදුසුකම් නොවන පාඨමාලාවන් හදාරන ලද අයදුම්කරුවන් හට ජාතික වෘත්තීය සුදුසුකම් සමාන සහතික නිකුත් කිරීම සඳහා වෘත්තීය සමාලෝචන පරීක්ෂණ සිදුකරන ලද අතර එමගින් සමත් වූවන් හට ජාතික වෘත්තීය සුදුසුකම් සමාන කිරීමේ සහතික නිකුත් කරන ලදී.

පාඨමාලාවේ නම	ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම	නිකුත් කරන ලද සමානතා සහතික සංඛ්‍යාව
ජාතික තාක්ෂණ සහතික පත්‍රය (සිවිල් ඉංජිනේරු)	5 වන මට්ටම	04
කර්මාන්ත තාක්ෂණ ජාතික සහතික පත්‍රය (සිවිල් ඉංජිනේරු)	5 වන මට්ටම	13

ජාතික තාක්ෂණ සහතික පත්‍ර ලාභීන්ට ජාතික වෘත්තීය සුදුසුකම් සමානතාවය පිරිනැමීමට පුවත් පත් දැන්වීමක් මඟින් අයදුම් පත් කැඳවා දැනුම පරීක්ෂා කිරීම සහ පොදු විභාගයක් පවත්වා එයින් සමත් වූවන්ට වෘත්තීය සමාලෝචන පරීක්ෂණ සිදුකරන ලද අතර එමගින් සමත් වූවන් හට ජාතික වෘත්තීය සුදුසුකම් සමාන කිරීමේ සහතික නිකුත් කරන ලදී.

පාඨමාලාවේ නම	ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම	නිකුත් කරන ලද සමානතා සහතික සංඛ්‍යාව
ජාතික තාක්ෂණ සහතික පත්‍රය (සිවිල් ඉංජිනේරු) සහ කර්මාන්ත තාක්ෂණ ජාතික සහතික පත්‍රය (සිවිල් ඉංජිනේරු)	5 වන මට්ටම	40

තව ද පහත දක්වා ඇති සහතික පත්‍ර සඳහා ද ජාතික වෘත්තීය සුදුසුකම් සමාන කිරීමේ සහතික නිකුත් කිරීම සිදුකර ඇත.

ආයතනයේ නම	පාඨමාලාවේ නම	ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම	නිකුත් කරන ලද සමාන කිරීමේ සහතික සංඛ්‍යාව
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය / ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය	තොරතුරු සන්නිවේදන තාක්ෂණ ජාතික ඩිප්ලෝමාව	5 වන මට්ටම	12
වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය	කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ජාතික ඩිප්ලෝමාව	5 වන මට්ටම	01
	ප්‍රමාණ සමීක්ෂණ ජාතික ඩිප්ලෝමාව	6 වන මට්ටම	04
ඉංජිනේරු තාක්ෂණ ආයතනය	ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව	6 වන මට්ටම	09

ආයතනයේ නම	පාඨමාලාවේ නම	ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම	නිකුත් කරන ලද සමාන කිරීමේ සහතික සංඛ්‍යාව
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය	තොරතුරු තාක්ෂණ උසස් ජාතික ඩිප්ලෝමාව	6 වන මට්ටම	08
	සිවිල් ඉංජිනේරු උසස් ජාතික ඩිප්ලෝමාව	6 වන මට්ටම	06
	කෘෂිකර්ම තාක්ෂණ උසස් ජාතික ඩිප්ලෝමාව	6 වන මට්ටම	02
	විදුලි හා විද්‍යුත් ඉංජිනේරු උසස් ජාතික ඩිප්ලෝමාව	6 වන මට්ටම	01

7.5 ජාතික නිපුණතා සම්මත හා විෂය මාලාවන් හි පිටපත් සැකසිම.

සකස් කර ඇති ජාතික නිපුණතා සම්මත හා ඒවායේ ලේඛන ඇතුලත් මෘදුපිටපත් සහිත CD තැටි විකිණීම මෙම අංශය මගින් සිදු කරනු ලැබේ. 2019 වසර තුල දී මෙම CD තැටි 1,484 ක් විකුණා ඇති අතර එමගින් රු 742,000.00 ක ආදායමක් උපයා ඇත.

7.6 අන්තර් ආයතනික ජාතික වෘත්තීය සුදුසුකම් මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම.

ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටලු හඳුනා ගෙන ඒවාට විසඳුම් සෙවීම සාමුහික තීරණ ගැනීම සහ නව යෝජනා ක්‍රියාත්මක කිරීම අරමුණු කර, ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමවේදය ක්‍රියාත්මක කරන රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන් හි ජෙෂ්ඨ නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පිහිටුවා ඇත. 2019 වසර තුළ එම කමිටු රැස්වීම් 11 ක් පවත්වා ඇත.

7.7 ජාතික නිපුණතා සම්මත සංවර්ධනය කිරීමේ සහ අධීක්ෂණ කමිටුව

ජාතික වෘත්තීය සම්මතයන් සංවර්ධනය කිරීම සඳහා ශ්‍රම වෙළඳපොළ ඉල්ලුම දේශීය මෙන්ම විදේශීයව ද සලකා බලා අවසර ලබා දීමත්, ජාතික වෘත්තීය සම්මතවල ගුණාත්මකභාවය පවත්වා ගෙන යාමත්, ජාතික නිපුණතා සම්මත සහ අදාළ අනෙකුත් ලේඛන සකස් කිරීමේ දී ඇතිවන ගැටලු නිරාකරණය කිරීම සඳහා ජාතික නිපුණතා සම්මත සංවර්ධනය කිරීමේ සහ අධීක්ෂණ කමිටුව පිහිටුවා ක්‍රියාත්මක කර ඇත. 2019 වසර තුළ එම කමිටු රැස්වීම් 11 ක් පවත්වා ඇත. අදාළ තීරණ ගැනීම හා ප්‍රගතිය සමාලෝචනය කිරීම සිදුකර ඇත.

8. තත්ත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන

8.1 හැඳින්වීම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2016 වර්ෂයේ ජූලි මාසයේ දී ජාතික වෘත්තීය සුදුසුකම් අංශයේ ඇගයුම් හා පාලන අංශය NVQ සහතිකපත් අංශය ඒකාබද්ධ කරමින් ඇගයීම් තත්ත්ව ආරක්ෂණ අංශය ස්ථාපනය කරන ලදී. ඒ සඳහා ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහනේ මූල්‍ය දායකත්වය ලබා දෙන ලදී.

ඒ අනුව මෙම අංශය අධ්‍යක්ෂ , නියෝජ්‍ය අධ්‍යක්ෂ , සහකාර අධ්‍යක්ෂවරුන් 04 , වැඩසටහන් සම්බන්ධීකාරකවරුන් 01, සංවර්ධන නිලධාරීවරු 03, කළමණාකාර සහකාරවරු 04 හා පරිගණක යෙදවුම් සහායක 02 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම මිනිස් සම්පත් උපයෝගී කර ගනමින් 2019 වර්ෂයේදී පහත සඳහන් කාර්යයන් ඉටුකරනු ලැබීය.

8.2 ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ක්‍රියාත්මක කරලීම හා නියාමනය කිරීම

8.2.1 ඇගයීම් නිලධාරී සංචිතය පවත්වාගෙන යාම

8.2.1.1 අවශ්‍යවන ඇගයීම් නිලධාරී ප්‍රමාණය පුරෝකථනය කිරීම

සංවර්ධනය කර ඇති ජාතික නිපුණතා සම්මත හා 2017 වර්ෂයේ අවසන් වන විටදී සංචිතයේ ලියාපදිංචි වී සිටි ඇගයීම් නිලධාරී/ නිලධාරිනියන් සංඛ්‍යාවත්, එම නිලධාරීන්ගේ භූගෝලීය පැතිරීමත්, යන කරුණු සැලකිල්ලට ගෙන අවශ්‍යවන ඇගයීම්කරුවන් සංඛ්‍යාව පිළිබඳ පුරෝකථන වාර්තාව සකස්කරන ලදී.

8.2.1.2 නිපුණතා පාදක ඇගයීම් නිලධාරීන් ලෙස පුහුණු කිරීම සඳහා අයඳුම්කරුවන් තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම

නිපුණතාපාදක ඇගයීම් නිලධාරීන් ලෙස පත්වීම සඳහා පෞද්ගලික අංශයෙන්ද ඉල්ලුම්පත් කැඳවන ලදී. මෙම අයඳුම්පත් කැඳවීම සඳහා නිශ්චිත කාලවකවානුවක් නොමැති අතර, ලැබෙන අයඳුම්පත් අතරින් සුදුස්සන් තෝරාගැනීම, සම්මුඛ පරීක්ෂණ මණ්ඩල මගින් සිදුවේ.

අදාල වෘත්තීන් පිළිබඳව විශේෂඥ දැනුමින් යුත් පුද්ගලයන් මෙම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට පත්කරන අතර, එවැනි සම්මුඛ පරීක්ෂණ දින 20ක් 2019 වසර තුළ පැවැත්වීමට සැලසුම් කර සිටි නමුදු ඉල්ලුම හා අවශ්‍යතාවයන්ට අනුව එවැනි දින 19ක් ගත වූ වසර තුළ පවත්වා ඇගයීම් නිලධාරීන් 614ක් පුහුණුකර සංචිතයට ඇතුලත් කරන ලදී.

8.2.2 ඇගයීම් නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා එයට පහසුකම් සැපයීම

මේ යටතේ අදාල පුහුණුකිරීමේ වැඩසටහන් 10ක් පවත්වන ලදී.

2019 වර්ෂයේ ඇගයීම් නිළධාරීන් 957 සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇති අතර ඉන් 614 දෙනෙකු ඇගයීම්කරුවන් ලෙස තෝරාගෙන ඇත.

8.2.3 ඇගයීම්කරුවන් වෙත බලපත්‍ර ලබාදීම

2019 වර්ෂයේ දී ඇගයීම්කරුවන් 15 දෙනෙක් වෙත ඇගයීම් බලපත් ලබාදෙන ලදී.

8.2.4. නිපුණතා පාදක ඇගයීම් කටයුතු නිගමනය කිරීම

මේ යටතේ කාර්යයන් 03ක් පහත සඳහන් පරිදි සිදු කරන ලදී.

- පෞද්ගලික අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල ඇගයීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබාදීම.
- රාජ්‍ය අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල ඇගයීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබා දීම.
- ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

8.2.4.1 පෞද්ගලික අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල නිපුණතා පාදක ඇගයීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබාදීම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති පෞද්ගලික අංශයට අයත් පුහුණු ආයතනවල ප්‍රතිපාදනය කර ඇති පාඨමාලා අවසානයේ එම පාඨමාලා හදාරා තිබූ ආධුනිකයින් ඇගයීමට ලක්කොට නිපුණතාවය ලබා ඇති ආධුනිකයින් හට ජාතික වෘත්තීය සුදුසුකම් පිරිනැමේ.

එහිදී අදාල නිර්නායක පරීක්ෂාකොට ඒවා සපුරන ලද අවස්ථාවන්හී දී කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන ඇගයීම් සංචිතයේ සිටින ඇගයීම්කරුවන් පත්කොට ඔවුන්ලවා ඇගයීම් කටයුතු සංවිධානය කලයුතුය. විවිධ පුහුණු මධ්‍යස්ථාන/ ආයතන විසින් 2019 වසර තුළ ඇගයීම් සඳහා කෙරුණ ඉල්ලීම් ප්‍රමාණය 1073කි. මෙය පෞද්ගලික අංශය සඳහා 1792 ක් ද රාජ්‍ය අංශය සඳහා 1073ක් ද වශයෙන් වෙයි.

8.2.4.2 රාජ්‍ය අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල ඇගයීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබාදීම

රාජ්‍ය අංශයට අයත් පුහුණු ආයතනවල පැවැත්වෙන පුහුණු පාඨමාලාවල ඇගයීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබාදීමේ කාර්යය කොමිෂන් සභාවේ ඇගයීම් තත්ත්ව ආරක්ෂණ අංශය විසින් ඉටුකරන ලදී. එවැනි අනුමත ලබාදීම් ගත වූ වසර තුළ 1792ක් ඉටුකරන ලද අතර, එම ඉල්ලීම් ඉදිරිපත් වූයේ යොවන කටයුතු හා නිපුණතා අමාත්‍යාංශයට අයත් මෙන්ම ඊට පරිබාහිරව ක්‍රියත්මක රාජ්‍ය අංශයට අයත් පහත සඳහන් පුහුණු මධ්‍යස්ථාන වලිනි.

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යංශයට අයත් ආයතන

- කාර්මික අධ්‍යාපන හා පුහුණාකිරීමේ දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
- ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය
- සාගර විශ්වවිද්‍යාලය
- ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යංශයට අයත් නොවන රාජ්‍ය ආයතන

- ජාතික තරුණසේවා සභාව
- ශ්‍රී ලංකා යොවුන් බලකාය
- ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යංශය
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- සමාජසේවා දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව
- ශ්‍රී ලංකා නාවික හමුදාව

කෙසේ වෙතත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන තුළින් ජාතික වෘත්තීය සුදුසුකම් පිරිනැමීම සඳහා වන ඇගයීම් සඳහා 2019 වසර තුළ ඉහළ ඉල්ලුමක් පැවති බවක් දක්නට ලැබුණි. මෙවැනි අනුමත කිරීම් 2865 ක් ගත වූ වසර තුළ ලබා දී ඇත.

මෙසේ වීමට පහත සඳහන් කරුණු හේතුවන්නට පුළුවන,

- විදේශ රැකියා සඳහා ජාතික වෘත්තීය සුදුසුකම පිළිගැනීම.
- රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය විසින් අමාත්‍යංශ/ දෙපාර්තමේන්තු ආයතන සඳහා පුද්ගලයින් බඳවා ගැනීමේදී හා උසස්වීම් ලබාදීමේ දී ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය භාවිත කරන ලෙස අදාල ආයතන වෙත රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් දැනුම් දීම.
- ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ක්‍රම ක්‍රමයෙන් සමාජය තුළ ප්‍රචලිත වීම.
- ජාතික වෘත්තීය සුදුසුකම් 3 මට්ටම අ.පො.ස. (සා.පෙ.) මට්ටමටත්, 4 වන මට්ටම අ.පො.ස. (උ.පෙ) මට්ටමටත් සමාන කිරීම.

නිපුණතා පාදක පුහුණු පාඨමාලා තුළින් ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීමට අමතරව තවත් ක්‍රමයකට එම සුදුසුකම් ලබාදේ. එනම්, කර්මාන්තය තුළ වෘත්තීන්හි නියැලී අත්දැකීම් ලබා ඇති පුද්ගලයන්ට පාඨමාලා හැදෑරීමට අපහසු නිසා NVQ සුදුසුකම සඳහා ඉල්ලුම් කළහැකි අතර, එවැනි අත්දැකීම් ලබා ඇති පුද්ගලයන්ගේ නිපුණතා ඇගයීමිකර NVQ සහතිකය ලබාදේ. එම ක්‍රමය පෙරදැනුම ඇගයීමේ ක්‍රමය (RPL) ලෙස හැඳින්වේ. එම ක්‍රමය තුළින් ජාතික වෘත්තීය සුදුසුකම ලබා දීමට පහත සඳහන් රාජ්‍ය ආයතන 3කට බලය පවරා ඇත.

එම ආයතන 03 වන්නේ,

- ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
- කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව

8.2.5 පෙර දැනුම් ඇගයීමේ ක්‍රමය පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවතීම

වරින්වර ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලද අතර, මෙහෙයුම් කමිටු රැස්වීම් වලදීද විභාග මණ්ඩල රැස්වීම්වලදීද ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය සහ වෘත්තීය පුහුණු අධිකාරිය සමඟ පෙර දැනුම ඇගයීම ක්‍රමය පිළිබඳ ගැටළු හා අභියෝග පිළිබඳව සාකච්ඡා කරන ලදී. ඊට අමතරව විදේශ සේවා නියුක්ති කාර්යංශයේ නිලධාරීන් සමඟ රැස්වීම් වාරයක් පවත්වන ලදී. එම කාර්යංශය තුළින් ''ගෘහස්ථ ගෘහ පාලිකා'' තනතුර සඳහා සහ සාත්තු සහායක රැකියා සඳහා විදේශ ගතවන්නන්හට විශේෂ පුහුණු පාඨමාලා දිවයින පුරා පිහිටි එම කාර්යංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල පැවැත්වේ. එම පාඨමාලා පෙර දැනුම ඇගයීම ක්‍රමය අනුව අවසාන ඇගයීම් පවත්වා ඔවුන්හට ජාතික වෘත්තීය සුදුසුකම් ලබාදේ.

8.3 නිපුණතා පාදක ඇගයීම්වල සංඝතභාවය තහවුරු කිරීම

8.3.1 සංඝතභාවය තහවුරුකිරීමේ හා ඇගයීම්කරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩමුළු පැවැත්වීම

ඉහත සඳහන් කරන ලද අභිමතාර්ථය සපුරාගැනීමේ අරමුණින් වැඩමුළු 5 ක් වසර තුල පැවැත්වීමට සැලසුම් කරන ලද අතර එම වැඩමුළු 5 පවත්වන ලදී. මෙම නිපුණතා පාදක ඇගයීම් ක්‍රමය ආරම්භ කරන ලද්දේ 2005 වසරේදී වන අතර ඒ පිලිබඳව ඇගයීම්කරුවන් පුහුණුකිරීම අරඹා ඇත්තේද එම වසරේදීමය. එම වැඩමුළුවලදී ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳව සහ නව ක්ෂේත්‍ර දැනුම යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇත.

8.3.2 රාජ්‍ය හා පෞද්ගලික අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල පැවැත්වෙන නිපුණතා පාදක ඇගයීම් කටයුතු අධීක්ෂණය කිරීම

ගත වූ වසර තුල රාජ්‍ය හා පෞද්ගලික අංශයට අයත් පුහුණු ආයතනවල පවත්වන ලද නිපුණතා පාදක ඇගයීම් 194 ක් අධීක්ෂණය කරන ලදී. 2019 වර්ෂයේ රාජ්‍ය අංශයේ නිපුණතා පාදක ඇගයීම් 288 ක් සඳහා ඉල්ලීම් ලද අතර එය ඉටු කරන ලදී. එම අධීක්ෂණ ප්‍රතිඵල අනුව NVQ චක්‍රලේඛණ අංක 2017/1 අනුව සහ ඉහල කළමණාකාරිත්වයේ උපදෙස් මත ඇගයීම් ක්‍රියාවලියට හා මූලධර්මවලට පටහැනිව කටයුතු කළ අවස්ථාවලදී ඇගයීම්කරුවන්ට අවශ්‍ය උපදෙස් ලබාදීම හා අනෙකුත් අදාල විනයානුකූල තීරණ ගන්නා ලදී. ඒ අනුව අධීක්ෂණ 838ක් ඉටුකරන ලදී.

8.4 පැමිණිලි විභාග කිරීම

ගතවූ වසරතුල ඇගයීම් පිළිබඳ ලැබූ ලිඛිත පැමිණිලි 11 ක් විභාග කරන ලදී. ඊට අදාළ පියවර ගන්නා ලද අතර ඒ තුළින් ඇගයීම් නිසි ආකාරයට පැවැත්වීමට කටයුතු කරන ලදී.

8.5 දැනුම පරීක්ෂා කිරීමේ පොදු ලිඛිත විභාගය පැවැත්වීම

8.5.1 ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 4 ප්‍රදානය කිරීම සඳහා පොදු ලිඛිත විභාගය පැවැත්වීම

පහත සඳහන් වෘත්තීය ක්ෂේත්‍රයන්හි අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීමේ ලිඛිත විභාගය පහත විස්තර කෙරෙන ආකාරයට පවත්වන ලදී.

වගුව 8.2.1 2019 වර්ෂයේ පැවති පොදු පරීක්ෂණ වලට සහභාගිවූ අයදුම්කරුවන්

ක්ෂේත්‍රය	පෙබරවාරි	අප්‍රේල්	ජූලි	මුළු එකතුව
මෝටර් රථ කාර්මික ශිල්පී	663	88	766	1517
බේකරි ශිල්පී	326	57	570	953
රූපලාවන්‍ය	2413	383	2501	5297
වැඩබිම් සුපරීක්ෂක	500	40	247	787
සූපවේදී ශිල්පී	487	68	848	1403
සැලසුම් ශිල්පී	742	129	256	1127
විදුලි ශිල්පී	967	417	588	1972
කේෂාලංකරණ	2475	429	2153	5057
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී	5165	922	6127	12214

ක්ෂේත්‍රය	පෙබරවාරි	අප්‍රේල්	ජූලි	මුළු එකතුව
හෙද සහායක	7	6	106	119
පෙර පාසල් ගුරු (මුල් ළමාවිය සංවර්ධන)	359	219	3869	4447
ප්‍රමාණ සමීක්ෂණ සහායක	636	127	896	1659
ශීතකරණ හා වායුසමීකරණ කාර්මික ශිල්පී	318	25	133	476
මුළු එකතුව	**15058**	**2910**	**19060**	**37028**

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිත

2018 වසරේදී ඔන්ලයින් ක්‍රමයට ප්‍රශ්න සංචිත සංවර්ධනය කිරීම සඳහා පාඨමාලා 13ක් තෝරාගෙන ඒ සඳහා අදාල කටයුතු ආරම්භකල අතර 2019 වසරේ මැදභාගය වනවිට අදාල ප්‍රශ්න අවසන් කිරීමට කටයුතු කරනු ලැබීය.

ඉහත සඳහන් වන පාඨමාලාවල ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 4 සඳහා ලිඛිත පරීක්ෂණය තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2019 ජනවාරි අප්‍රේල් හා ජූලි මාසවල පවත්වන ලදී. මෙම සියලුම පරීක්ෂණවල ප්‍රතිඵල එම වර්ෂය තුලදීම නිකුත්කරන ලදී.

8.5.2 ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 5 සහ 6 ලිඛිත විභාගයන් පැවැත්වීම

ගත වූ වසර තුල අයදුම්පත් කැඳවා ICT, Quantity Surveying, Construction Technology, Cosmetology, Agriculture Production Technology, Mechatronic Technology, Ref & AC Technology, Production Technology, Pre School Management, Diploma in Printing Technology, Drafitng Technology සහ Mechanical Technology යන ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 සහ 6 පාඨමාලාවල පොදු ලඛිත විභාගය 2018 වසර තුල අදාල ආයතනවල ඉල්ලීම මත පවත්වන ලදී.



8.6 ඇගයීම් නිලධාරීන් සඳහා ගෙවීම් කිරීම ඇගයීම

රේඛීය අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මකවන පහත සඳහන් ආයතනයන්හි පවත්වන ලද ඇගයීම් සඳහා සහභාගි වූ ඇගයීම්කරුවන්ට දීමනා හා ගමන් ගාස්තු කොමිෂන් සභාවේ ඇගයීම් ඒකකය විසින් ගෙවීමට කටයුතු කරන ලදී.

1. කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව
2. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය (නිපුණතා පාදක පාඨමාලා සඳහා)
3. ජාතික අධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය (නිපුණතා පාදක සහ ආයතන ගත පුහුණු පාඨමාලා සඳහා)

මෙම ශීර්ෂය යටතේ ඇගයීම් නිලධාරීන්ගේ වවුචර්පත් 1949ක දීමනා ඇගයීම් ඒකකය විසින් සහතික කොට ගිණුම් අංශයට ඉදිරිපත් කරනලදී. එම වවුචර්පත්වල මුළු වටිනාකම රු. 12,453,000/- ක් විය.

8.7 ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් නිකුත් කිරීම

8.7.1 ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් නිකුත්කිරීම

2019 වසර තුළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සහතිකපත් 65212 ක් නිකුත් කර ඇති අතර ඒ පිලිබඳ විස්තර පහත දැක්වේ.

වගුව 8.7.1 2019 වර්ෂය සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් ලාභීන් (ආයතන අනුව)

ආයතනය	සහතිකපත් ප්‍රමාණය				සහතිකපත් ලාභීන්			
	නිපුණතා පාදක ඇගයීම් ක්‍රමය	කර්මාන්ත වැඩ පුහුණු ක්‍රමය	පෙර දැනුම ඇගයීම් ක්‍රමය	එකතුව	නිපුණතා පාදක ඇගයීම් ක්‍රමය	කර්මාන්ත වැඩ පුහුණු ක්‍රමය	පෙර දැනුම ඇගයීම් ක්‍රමය	එකතුව
කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව	11117		82	11199	10096		67	10163
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය	2833	3342	5212	11387	2517	3258	4577	10352
ජාතික තරුණ සේවා සභාව	1933			1933	1688			1688
පෞද්ගලික අංශය	27792			27792	24379			24379
වෘත්තීය පුහුණු අධිකාරිය	23407		2289	25696	19014		1859	20873
එකතුව	**67082**	**3342**	**7583**	**78007**	**57694**	**3258**	**6503**	**67455**

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිත

NVQ 1 සිට NVQ 6 දක්වා මට්ටම් වලට 2019 වර්ෂය තුලදී නිකුත් කර ඇති සහතිකපත් ප්‍රමාණයන් ඒ ඒ ආයතන අනුව පහත වගුවේ දැක්වේ.

වගුව 8.7.2 2019 වර්ෂය තුලදී නිකුත් කර ඇති සහතිකපත්‍ර

ආයතනය	පළමු මට්ටම	දෙවන මට්ටම	තෙවන මට්ටම	සිව්වන මට්ටම	පස්වන මට්ටම	හයවන මට්ටම	එකතුව
කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව		534	4028	5190	1342	105	11199
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය		1697	5556	4134			11387
ජාතික තරුණ සේවා සභාව	42	125	508	1258			1933
පෞද්ගලික අංශය	2120	1345	17340	6068	424	495	27792
වෘත්තීය පුහුණු අධිකාරිය	855	1531	12868	10075	361	6	25696
එකතුව	**3017**	**5232**	**40300**	**26725**	**2127**	**606**	**78007**

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

2019 වර්ෂයේදී පුහුණු ආයතන විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් සහතික (ස්ත්‍රී / පුරුෂ භාවය අනුව) පහත වගුවේ දැක්වේ.

වගුව 8.7.3 2019 වර්ෂය සඳහා නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් සහතික (ස්ත්‍රී / පුරුෂ භාවය අනුව)

ආයතනය	ස්ත්‍රී	පුරුෂ	එකතුව
කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව	4299	6900	11199
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය	3464	7923	11387
ජාතික තරුණ සේවා සභාව	1253	680	1933
පෞද්ගලික අංශය	15408	12384	27792
වෘත්තීය පුහුණු අධිකාරිය	9059	16637	25696
එකතුව	**33483**	**44524**	**78007**

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2018 වසර තුල සහතිකපත් 1095ක් නැවත මුද්‍රණය කරන ලදී. ඒ පිළිබඳ විස්තර පහත වගුවේ දැක්වේ.

වගුව 8.7.4 2019 වර්ෂයේදී නැවත මුද්‍රණය කරන ලද සහතිකපත්‍ර පිළිබඳ විස්තර

සහතික වර්ගය	සහතික පත්‍ර ප්‍රමාණය
මුද්‍රණ දෝෂ හේතු කොටගෙන නැවත මුද්‍රණය කරන ලද සහතිකපත්‍ර	897
අස්ථානගත වූ සහතික වෙනුවට අනු පිටපත් මුද්‍රණය	102

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

වගුව 8.7.5 2019 වර්ෂයේදී නිකුත් කල ජාතික වෘත්තීය සුදුසුකම් සහතික ප්‍රමාණය EBT, CBT හා RPL අතර සංසන්දනයක් පහත දැක්වේ.

පුහුණු ක්‍රමය	සහතික ප්‍රමාණය
නිපුණතා පාදක ඇගයීම් ක්‍රමය	67082
කර්මාන්ත වැඩ පුහුණු ක්‍රමය	3342
පෙර දැනුම ඇගයීම් ක්‍රමය	7583

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

2006 වර්ෂයේ සිට නිකුත් කරන ලද සහතික පිළිබඳ විස්තර පහත වගුවේ දැක්වේ.

වගුව 8.7.6 2006 සිට 2019 දක්වා නිකුත් කරනලද මුළු සහතිකපත්‍ර ප්‍රමාණය

වර්ෂය	සහතිකපත්‍ර සංඛ්‍යාව
2006	259
2007	1,629
2008	8,915
2009	11,249
2010	13,256
2011	16,572
2012	18,111
2013	22,855
2014	28,546
2015	44,148

වර්ෂය	සහතිකපත්‍ර සංඛ්‍යාව
2016	47,017
2017	65,212
2018	61,150
2019	78,007
එකතුව	**416,926**

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

ප්‍රස්තාරය 8.7.1 2006 සිට 2019 දක්වා නිකුත්කල සහතිකපත්‍ර ප්‍රමාණය



මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව ආරම්භයේ සිට 2019 වර්ෂය අවසාන වන විට සහතිකපත් 416,926 ක් නිකුත්කර ඇත.

9.0 මහජන සම්බන්ධතා (වෘත්තික හා කර්මාන්ත) අංශය

9.1 පසුබිම

2016 වර්ෂයේ කර්මාන්ත සබඳතා අංශය නමින් පිහිටවනු ලැබූ මෙම අංශය 2018 වර්ෂය වනවිට වඩාත් ශක්තිමත්ව මහජනතාවට සම්බන්ධ කාර්යයන් ව්‍යාප්ත කිරීමේ අරමුණින් මහජන සම්බන්ධතා (වෘත්තික හා කර්මාන්ත)යන නමින් මේ වන විට එහි කාර්යභාර්යයන් ඉටු කරනු ලබයි.

ආංශික නිපුණතා සහ ශ්‍රී ලංකාව තුළ ප්‍රථම වරට ක්‍රියාත්මක කරමින් සහ කාර්මික අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ වෘත්තීය මාර්ගෝපදේශන කටයුතු ඉටුකරමින් එමෙන්ම 2019 වර්ෂයේ ජනවාරි 01 දින සිට මෙම අංශයට සම්බන්ධව තොරතුරු කේන්ද්‍රයක් ස්ථාපිත කර මහජනතාවට මෙන්ම ආයතනය සමඟ මනාව සම්බන්ධ වෙමින් අංශයේ කාර්යයභාර්යයන් පුළුල් කරමින් ක්‍රියාත්මක විය.

9.2 මහජන සම්බන්ධතා (වෘත්තික හා කර්මාන්ත) අංශයේ අරමුණු

කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය තුළින් කර්මාන්තයට අවශ්‍ය කෙරෙන නිපුණතාවයන්ගෙන් හෙබි මානව ශ්‍රමය සැපයීමට අවශ්‍ය කටයුතු සම්පාදනය, ක්ෂේත්‍රය මහජනතාවගේ අවබෝධය හා දැනුම වැඩිකිරීම, වෘත්තීය ලොවට පිවිසීමට බලාපොරොත්තු වන තරුණ තරුණියන්ට නිසි මඟ පෙන්වීමක් කිරීමට වෘත්තීය මාර්ගෝපදේශන සේවාව ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම මහජන සම්බන්ධතා (වෘත්තික හා කර්මාන්ත) අංශයේ ප්‍රධාන අරමුණු ලෙස හැඳින්විය හැකිය. මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා පහත සඳහන් වන උප අරමුණු ක්‍රියාවට නැංවීම මහජන සම්බන්ධතා අංශයේ ප්‍රධාන වගකීම වේ.

- කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයෙහි පුහුණු කිරීම සඳහා භාවිත වන නිපුණතා සම්මත හා පුහුණු පාඨමාලා සංවර්ධනය සඳහා කර්මාන්තයේ දායකත්වය ලබා ගැනීම.

- කර්මාන්තයේ සිදුවන තාක්ෂණික වෙනස්කම් හා නව ප්‍රවණතාවයන් පිළිබඳව කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයෙහි පුහුණු කිරීමේ කටයුතුවල නියැලෙන අධ්‍යන කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම හා ඒ සම්බන්ධව පුහුණු වීම් අවශ්‍ය වෙතොත් ලබා දීම.

- දැනට ලබා දෙනු ලබන වෘත්තීය පුහුණුවත් කර්මාන්තයේ ඉල්ලුමත් අතර නිපුණතා පරතරයක් ඇතිදැයි විමසා බලා ඊට අවශ්‍ය නිගමන හා නිවැරදි කිරීම් ඉටු කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

- කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයෙහි පුහුණුව ලබන ආධුනික ආධුනිකාවන් උදෙසා කර්මාන්ත ආශ්‍රිත පුහුණුව ලබා දීම පිළිබඳ පසුවිපරම් කිරීම හා ශක්තිමත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

- කාර්මික අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයෙහි පුහුණුව අවසන් කරන ආධුනික ආධුනිකාවන් කර්මාන්තයේ පවතින රැකියා අවස්ථා පිළිබඳ දැනුවත් කිරීම හා වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන සම්බන්ධීකරණය කොට ඔවුන් හට රැකියා සොයා ගැනීමට සහය දැක්වීම.

- විධිමත් පුහුණුවකින් තොරව කර්මාන්තයේ නියුතු ශිල්පීන් හට සුදුසුකම් සහතික ලබාදීම සඳහා කර්මාන්ත ආංශික නිපුණතා සභාවන්හි සහයෝගය සහිතව ඔවුන් දැනුවත් කිරීම හා වෘත්තීය ගමන්මගේ ඉහළට යාම සඳහා ඔවුන් සූදානම් කිරීම.

- කර්මාන්තයන් හා ඒවායෙහි රැකියා පිළිබඳ සමාජයේ සුභවාදී ප්‍රතිරූපයක් ඇති කිරීම.
- කොමිෂන් සභාවේ සේවාවන් වඩාත් ඵලදායී හා කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- පාසල් හැර යන සිසු සිසුවියන් සඳහා කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණුව පිළිබඳව දැනුවත් කොට ඔවුන් මෙම කාර්මික පුහුණු ක්ෂේත්‍රය වෙත ආකර්ෂණය කර ගැනීම.
- කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය පිළිබඳ සමස්ථ ප්‍රජාව දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- පොදු වෘත්තීය මාර්ගෝපදේශන සේවාවන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- විවිධ වෘත්තික කණ්ඩායම්, වෘත්තිකයන් හා සම්බන්ධතාවය වැඩිදියුණු කරගනිමින් කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම.

9.3 කාර්යභාරය

ඉහත දක්වන ලද අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා මහජන සම්බන්ධතා අංශය මගින් පහත කාර්යයන් 2019 වර්ෂය තුළදී ඉටුකර ඇත.

9.3.1. ආංශික නිපුණතා සහා 4ක් පවත්වාගෙන යාම වෙනුවෙන් ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන මගින් ලබා දෙන ප්‍රතිපාදන ආංශික නිපුණතා සහා වෙත ලබාදීම හා වඩාත් ඵලදායීව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කිරීම. සෞඛ්‍ය හා රැකවරණ ක්ෂේත්‍රයේ ස්වේච්ඡා කමිටුවක් මගින් අදාල ක්ෂේත්‍රයේ වැඩ කටයුතු ඉටු කිරීම.

මහජන සම්බන්ධතා අංශයේ දායකත්වය අනුව ආංශික නිපුණතා සහා 4ක් 2019 වර්ෂයේ ක්‍රියාකාරීව පැවති අතර 2018 වර්ෂය තුළ අකර්මන්‍යව පැවති සංචාරක කර්මාන්ත ආංශික නිපුණතා සභාවද තරමක් 2019 වර්ෂය තුළ සක්‍රිය මට්ටමක පැවතිනි. ඒ අනුව පහත සඳහන් ආංශික නිපුණතා සහා 2019 වර්ෂයේ ක්‍රියාකාරීව පැවතිනි.

1. ඉදිකිරීම් කර්මාන්ත ආංශික නිපුණතා සභාව
2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්ත ආංශික නිපුණතා සභාව
3. නිෂ්පාදන හා ඉංජිනේරු සේවා ආංශික නිපුණතා සභාව
4. සංචාරක කර්මාන්ත ආංශික නිපුණතා සභාව

මෙම ආංශික නිපුණතා සභා පවත්වා ගෙන යාමට අවශ්‍ය පරිපාලන වියදම් ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන මගින් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට ලබාදෙන ලද අතර එම ප්‍රතිපාදන ආංශික නිපුණතා සභා වෙත ගෙවන ලදුව 2019 වර්ෂයේ තෙවන කාර්තුවේ සිට ආංශික නිපුණතා සභාවලින් වියදම් සිදුකර පසුව ප්‍රතිපූරණය කරගන්නා ලදී. ඊට අමතරව සෞඛ්‍ය හා රැකවරණ ක්ෂේත්‍රයේ ස්වේච්ඡා කමිටුව මගින් එම ක්ෂේත්‍රයට අදාල විෂය මාලා සංවර්ධන කටයුතු ඉටු කරන ලදී.

2019 වර්ෂයේ ආංශික නිපුණතා සභා විසින් සංවර්ධන කටයුතු රාශියක් ඉටු කරන ලද අතර එකී කාර්යයන් පහත අයුරින් වේ.

I. ඉදිකිරීම් කර්මාන්ත ආංශික නිපුණතා සභාව.

කාර්මික අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ ඉදිකිරීම් අංශයේ නියැලෙන පුහුණුකරුවන්ගේ න්‍යායික දැනුම වර්ධනය කිරීමේ වැඩසටහන් 5 ක් 2019 වර්ෂයේ දී පැවැත්වුනු අතර අධ්‍යාපන චාරිකා 12 සමඟින් පුහුණුකරුවන් 64 ක් මේ සඳහා සහභාගී විය.

- ඉදිකිරීම් කර්මාන්තායතනවල සේවයේ නියුතු කාර්මික මට්ටමේ නිලධාරීන් 29ක් ජාතික වෘත්තීය සුදුසුකම් ඇගයීම්කරුවන් ලෙස යොදා ගැනීම.
- දැනට සේවයේ නියුතු ඇගයීම්කරුවන් 76 දෙනෙකු සඳහා වැඩමුළුවක් පවත්වා වෘත්තීය දැනුම වැඩිදියුණු කිරීම.
- න්‍යායික පුහුණුව නිමකල සිසුන් 120 දෙනෙකු කර්මාන්තගත පුහුණුව සඳහා යොමුකිරීම.
- 13 වසර අඛණ්ඩ අධ්‍යාපනය සඳහා වැඩමුළු 3කදී විෂය මාලා 3ක් සමාලෝචනය කිරීම.
- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ IESL ආරාධනය පරිදි TECHNO 2019 කාර්මික ප්‍රදර්ශනයේ දී ආංශික සභාව පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම.
- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නිපුණතා පරතරයන් හඳුනාගැනීම සඳහා සැලැස්මක් සකස් කර ගවේෂණ කණ්ඩායම් සඳහා ක්‍රමවේදයන් හඳුනා ගැනීම.
- කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලි සේවක පිරිස් සඳහා නම්‍යශීලී අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. ඒ සඳහා කර්මාන්තායතන දෙකකින් නාම යෝජනා 16ක් ඉදිරිපත් විය.
- ආංශික නිපුණතා සභාව සඳහා ප්‍රධාන පෙලේ කර්මාන්තායතන හතරක නියෝජනය ලබා ගැනීම.
- විශේෂ වෘත්තීය මාර්ගෝපදේශන සේවා තුළින් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා/ රැකියා අවස්ථා/ රැකියා ක්ෂේත්‍ර පිළිබඳ පුහුණුකරුවන්/ ඇගයීම්කරුවන් සහ පුහුණුවන්නන් දැනුවත් කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා අත්පත්‍රිකා දෙකක් සකස් කිරීම.
- නිපුණතා පාදක නව පුහුණු පාඨමාලා සකස් කිරීම සඳහා අවශ්‍යවන උපදේශන හා යෝජනා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම.(Pre Fabricator and Elector, Plasterer, Brick and Block Layer, Wood Craftsman Form Work), Aluminum Fabricator/Erector)
- දැනට භාවිත වන විෂයමාලා අතුරින් පුනරීක්ෂණය කළ යුතු පාඨමාලා හඳුනාගෙන ඉදිරිපත් කිරීම (Construction Equipment Operator, Survey Filed Assistant, Scaffolder, Construction Site Supervisor, Draughts person auto cad draughtsman), Road Construction Site Supervisor, Wood Craftsman (Buildings), Road Construction Site Equipment Operator)
- වෘත්තීය සංසද පිහිටුවීම සඳහා සුදුසු කර්මාන්තායතන තුනක් හඳුනා ගැනීම.

II. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්ත ආංශික නිපුණතා සභාව.

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිපුණතා ආංශික සභාව මඟින් 2019 වර්ෂයේ දී පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටුකරන ලදී.
- තරුණ තරුණියන් 700 ක් උදෙසා තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- රැකියා විරහිත තරුණ තරුණියන් 200ක් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශනය සිදුකිරීම.
- වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 305 දෙනෙකු සඳහා තාක්ෂණික දැනුම වැඩිදියුණු කිරීම උදෙසා වැඩසටහන් පැවැත්වීම.
- නව තාක්ෂණය උපයෝගී කර ගැනීම පිළිබඳව ගුරුවරුන් 160 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සිසුන් 970ක් උදෙසා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට පැමිණීමට විකල්ප ක්‍රමවේදයන් හඳුන්වා දීම.
- වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ සිසුන් 1015 ක් සඳහා මෘදු කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- වෙබ් අඩවි හරහා සහ සමාජ ජාල හරහා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය නඟා සිටුවීම සඳහා පළකිරීම් 102 ක් සිදුකිරීම.
- නව කර්මාන්තකරුවන් 26 ක් සම්පත්දායකයන් ලෙස ලියාපදිංචි කර ගැනීම.
- ත්‍රිවිධ හමුදා පුහුණු වැඩසටහන් සිදුකිරීම තුළින් නිලධාරීන් 80 දෙනෙකුට සන්නිවේදන තාක්ෂණ පුහුණුව පිළිබඳව පුහුණු කිරීම.
- ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 4 සඳහා කර්මාන්තවල සම්පත්දායකත්වය ලබා ගනිමින් විෂය මාලා සංවර්ධනය අවසන් කිරීම.
- ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමවේදයේ පවතින ගැටළුවලට විසඳුම් වශයෙන් විකල්ප ක්‍රමවේදයක් හඳුන්වා දීම.
- ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ තොරතුරු තාක්ෂණ විෂයමාලා සංවර්ධනය කිරීම.
- විශ්ව විද්‍යාල දෙකක් සමඟ ගිවිසුම් ගතව තොරතුරු තාක්ෂණය නඟා සිටුවීම සඳහා එක්ව ක්‍රියා කිරීම.

III. නිෂ්පාදන හා ඉංජිනේරු සේවා ආංශික නිපුණතා සභාව.

- ලෝහ ආශ්‍රිත කර්මාන්ත, විදුලි, ඉලෙක්ට්‍රොනික, රබර් හා ප්ලාස්ටික් අංශ සඳහා නිපුණතා පරතර විශ්ලේෂණ සමීක්ෂණය 2019 නිම කිරීම.
- වාත්තු කාර්මික සහ කඩදාසි ප්‍රතිචක්‍රීකරණ කාර්මික සඳහා ජාතික නිපුණතා සම්මත සංවර්ධනය කිරීම ආරම්භ කිරීම.
- කාර්මික ඉලෙක්ට්‍රොනික් ශිල්පී, පරිගණක සංඛ්‍යා පාලක, සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය, ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ තාක්ෂණ ශිල්පී සහ මෝටර් රථ කාර්මික ශිල්පී යන ජාතික නිපුණතා සම්මත වලංගු කිරීම සඳහා සම්පත් දායකත්වය ලබා දීම.
- ත්‍රිරෝද රථ සහ මෝටර් කාර්මික උපදේශකයින් 25 දෙනෙකු ඇලුමිනියම් පිරිසැකසුම් උපදේශකයින් 22, වෙල්ඩින් උපදේශකයින් 25, දැව ශිල්පී උපදේශකයින් 20, මෝටර් වයින්ඩර් උපදේශකයින් 15 දෙනෙකු වැඩසටහන් තාර්කික පාලන 23 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- නම්‍යශීලී ඉගෙනුම් සඳහා වෙළඳ කලාපවල මානව සම්පත් කලමනාකරුවන් දැනුවත් කිරීම.

Iv. සංචාරක කර්මාන්ත ආංශික නිපුණතා සභාව.

- සංචාරක කර්මාන්ත ආංශික නිපුණතා සභාව සඳහා කළමනාකරුවෙකු බඳවාගැනීමෙන් අනතුරුව මාස 4 ක පමණ කාලයක් සේවය කරන ලදී. ඉන් අනතුරුව කළමනාකරුවන් දෙදෙනෙකු බඳවාගත් අතර එම දෙදෙනා ද මේ වන විට ආංශික නිපුණතා සභාවෙන් ඉවත් වී ඇත. එම සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අදාල ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා වූ විවිධ වැඩසටහන් සඳහා දායකත්වය සපයන ලදී.

9.3.2. කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය ඉහළ නැංවීමට අදාලව සිදුකරනු ලබන සංවර්ධන කටයුතු වෙනුවෙන් ආංශික නිපුණතා සභා සඳහා මුදල් ලබාදීම හා මඟපෙන්වීම සිදුකිරීම.

2019 වර්ෂයේ දී ආංශික නිපුණතා සභාවන් සංවර්ධන කටයුතු සිදුකිරීම වෙනුවෙන් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් අතිරේක මුදල් සඳහා ඉල්ලීම් නොකල අතර සිදුකරන ලද සංවර්ධන වැඩසටහන් ආයතනවල කාර්ය භාරයන් හා සමපාත වීමේදී අදාල ආයතනවලින් ප්‍රතිපාදන ලබා දී තිබුනි.

9.3.3 ආංශික නිපුණතා සභාවන්හි ප්‍රගති සමාලෝචනය හා ඉදිරි කටයුතු පැහැදිලි කිරීම සඳහා එම සභාවන්හි සභාපතිවරුන් සහ ආයතන නිලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්වීම සහ අවශ්‍ය පියවර ගැනීම.

ආංශික නිපුණතා සභාවන්හි ප්‍රගති සමාලෝචනය හා ඉදිරි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටළු නිරාකරණය කිරීම සඳහා සභාපතිවරුන්ගේ රැස්වීම් 4ක් 2019 වර්ෂයේ පවත්වන්නට යෙදුනි.

9.3.4. දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථානයන්හි සේවාව ශක්තිමත් කිරීම සහ ඇගයීම සිදුකිරීම.

දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන මගින් 2019 වර්ෂයේ සිදු කරන ලද සේවාවන් හා එම මධ්‍යස්ථානවල පවත්නා යටිතල පහසුකම් පිළිබඳ සොයා බැලීම සඳහා ඇගයීම් කටයුතු සිදු කිරීම අනුරාධපුර, නුවර, වව්නියාව, රත්නපුර, ගාල්ල මධ්‍යස්ථානවල සිදුකරන ලදී.

9.3.5. කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ නව සංවර්ධන මානයන් පිළිබඳව දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහන් පැවැත්වීම හා පවත්නා රැකියා අවස්ථාවන් පිළිබඳව මහජනතාව, පාසල් සිසුන්, පාසල් හැරගිය සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය කටයුතු කිරීම.

කර්මාන්තයට සරිලන අයුරින් පුහුණු ඉලක්ක සඳහා ශිෂ්‍යයන් යොමු කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් මහියංගනය වෘත්තීය පුහුණු ආයතනය, අම්පාර වෘත්තීය පුහුණු ආයතනය, අම්පාර තාක්ෂණ විද්‍යාලය, මොණරාගල කාර්මික විද්‍යාලය හා වැල්ලවාය දිස්ත්‍රික් වෘත්තීය පුහුණු ආයතනයේ දී පවත්වන්නට යෙදුනි.

ඒ සඳහා සිසුන් 660ක් පමණ සහභාගී විය. කැකිරාව රජරට ප්‍රජා කේන්ද්‍රයෙහි පාසල් හැරගිය තරුණ තරුණියන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත් වූ අතර ඒ සඳහා තරුණ තරුණියන් 65 ක ප්‍රමාණයක් සහභාගී විය. පිටිපන මහා විද්‍යාලයේ සිසුන් 50ක පමණ සංඛ්‍යාවක් දැනුවත් කිරීම 2019 සැප්තැම්බර් මසදී සිදුකරන ලදී. හඟුරන්කෙත උඩවත්ත පාසලෙහි දෙමාපියන්, දරුවන් දැනුවත් කල අතර ඒ සඳහා 200 දෙනෙකුගේ පමණ සහභාගීත්වයක් තිබිණි.

9.3.6. සේවාලාභීන්ගේ දැනුවත් වීම උදෙසා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් කෙරෙන කාර්යයන් පිළිබඳව තොරතුරු සංග්‍රහයක් සකස් කිරීම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සේවාවන් පිළිබඳව අනෙකුත් ආයතන හා මහජනතාව දැනුවත් කිරීමේ අරමුණින් සියලුම අංශයන්හි කාර්යභාරය පිළිබඳ තොරතුරු ඇතුළත් අත්පොතක් නිර්මාණය කර එහි පිටපත් 5000 ක් මුද්‍රණය කරන ලදී.

9.3.7. අමාත්‍යාංශය යටතේ පවත්නා පුහුණු ආයතන හා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිබඳව නිලධාරීන්, මහජනතාව, පාසල් සිසුන්, දැනුවත් කිරීම සඳහා අත්පත්‍රිකා සකස් කිරීම.

කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයට අදාලව පවත්වනු ලබන ප්‍රදර්ශන, දැනුවත් කිරීමේ වැඩසටහන් හා පුහුණු ආයතනවලට බෙදා හැරීම සඳහා සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් තොරතුරු පත්‍රිකා මුද්‍රණය 2019 වර්ෂයේ දී සිදුකෙරිනි.

9.3.8. ජනමාධ්‍ය සමඟ සම්බන්ධව වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය පිළිබඳව ප්‍රචාරය කිරීම හා තොරතුරු බෙදා හැරීම.

කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණුව පිළිබඳ තොරතුරු බෙදා හැරීම හා වෘත්තීය සංවර්ධනයන් පිළිබඳ දැනුවත් කිරීම උදෙසා ජනමාධ්‍ය උපයෝගී කරගනිමින් මහජනතාව දැනුවත් කිරීම මහජන සම්බන්ධතා අංශයෙන් 2019 වර්ෂයේ සිදුකල අතර එවැනි වැඩසටහන් රාශියක් සඳහා සහභාගී විය. ජාතික ගුවන් විදුලිය මෙන්ම පෞද්ගලික ගුවන් විදුලි වැඩසටහන් රූපවාහිනී වැඩසටහන් මේ යටතේ සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

9.3.9. කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි පවත්නා වූ අවස්ථාවන් පිළිබඳව තෝරාගත් කණ්ඩායම් සඳහා සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් දැනුවත් කිරීම.

මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හා පලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීම 2019 ජූලි මස සිදුකරනු ලැබූ අතර 130ක පමණ ක්ෂේත්‍ර නිලධාරීන් සංඛ්‍යාවක් ඊට සහභාගී විය. තවද රබෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්ෂේත්‍ර නිලධාරීන් 65 ක් අගෝස්තු මසදී දැනුවත් කරන ලදී.

9.3.10. වෘත්තීය මාර්ගෝපදේශනය හා මෘදු කුසලතා පිළිබඳව විශේෂ වැඩසටහන් පැවැත්වීම.

කාර්මික අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ නියැලෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කර්මාන්තයට අවශ්‍ය මෘදු කුසලතා සංවර්ධන වැඩසටහන් 5ක් මරදාන කාර්මික විද්‍යාලයේ මෙන්ම බද්දේගම, මහනුවර, නාරාහේන්පිට වෘත්තීය පුහුණු ආයතනයෙහි වැඩසටහන් 2ක් වශයෙන් පවත්වන ලදී.

9.3.11. ආංශික නිපුණතා සභාවලින් ආවරණය නොවන ක්ෂේත්‍රයන් සඳහා පළාත් මට්ටමින් වැඩසටහන් පැවැත්වීම.

ආංශික නිපුණතා සභාවලින් ආවරණය නොවන ක්ෂේත්‍රයන් සඳහා එක් එක් දිස්ත්‍රික්කයන්වල කර්මාන්තකරුවන්, පුහුණු ආයතන, කාර්මික හා වෘත්තීය අධ්‍යාපනයට සම්බන්ධ රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයන් ද, වාණිජ කර්මාන්ත මණ්ඩලය ඒකාබද්ධව පුහුණු අවශ්‍යතා හඳුනා ගනිමින් ඒවා වැඩි දියුණු කිරීම, කර්මාන්තයට අවශ්‍ය මෘදු කුසලතා වර්ධනය මෙන්ම විවිධ ගැටළු නිරාකරණය කරමින් කර්මාන්ත පුහුණුව වඩා ශක්තිමත් කර පුහුණු ආයතන හා කර්මාන්තකරුවන් අතර වඩාත් හොඳ සම්බන්ධතාවයක් ගොඩනැගීම මෙහි පරමාර්ථය වේ. ඒ අනුව 2019 වර්ෂයේ දී අම්පාර, ගම්පහ, කෑගල්ල, කළුතර, මහනුවර යන දිස්ත්‍රික්කයන්හි දී පවත්වන්නට යෙදුනි.

9.3.12. ආංශික නිපුණතා සභාව, වාණිජ හා කර්මාන්ත මණ්ඩලය මෙන්ම දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ඒකාබද්ධව ප්‍රචාරන වැඩසටහන් පැවැත්වීම.

9.3.13. ප්‍රතිපත්ති සංවර්ධනය උදෙසා ජාතික වෘත්තීය මාර්ගෝපදේශන නියාමන කමිටුවක් ක්‍රියාත්මක කිරීම.

කාර්මික අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය සඳහා වෘත්තීය මාර්ගෝපදේශන සේවය වඩාත් ශක්තිමත් කිරීම සඳහා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ මාර්ගෝපදේශන කටයුතුවල නියැලෙන ආයතන බොහෝ ගනණාවක නියෝජිතයන්ගේ එකතුවෙන් 2018 වර්ෂයේ දී ආරම්භ කරන ලද වෘත්තීය මාර්ගෝපදේශන නියාමන කමිටුවෙහි රැස්වීම් තුනක් 2019 වර්ෂයේ පවත්වන්නට යෙදුණි.

9.3.14 පොදු වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන සංවර්ධනය හා වැඩි දියුණු කිරීමට දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථානවලට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම.

දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන සංවර්ධනය හා වැඩිදියුණු කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් ප්‍රතිපාදන 2019 වර්ෂයේ ලබා දී ඇත. එහි අරමුණ වන්නේ වෘත්තීය මාර්ගෝපදේශනයට යොමුවන්නන් හට අලංකාරවත් ලෙස සිත් ඇදගන්නා අයුරින් ස්ථානය පිළියෙල කිරීමයි. ඒ අනුව 2019 වර්ෂයේ දී මහනුවර, ගාල්ල, අනුරාධපුර, තාක්ෂණ විද්‍යාලවල වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන සඳහා සහ දෙවන අදියරේ දී ගම්පහ, කුරුණෑගල, රත්නපුර, ගාල්ල යන මධ්‍යස්ථාන ලබා දෙන ලදී. මේ වන විට ලබා ගත් ප්‍රතිපාදනවලට අනුව එම නවීකරණ කටයුතු සිදුකර අවසන්ය.

9.3.15. කර්මාන්තගත පුහුණුව විධිමත්ව සිදුකිරීම පිළිබඳ සංවාද හා ඇගයීම් අනුව නිර්දේශ ඉදිරිපත් කිරීම.

කර්මාන්තගත පුහුණුව නිසි අයුරින් සිදුකිරීම විමර්ෂණය සිදුකිරීම 2018 වර්ෂයේ දී සිදුකරන ලද අතර ඒ තුළින් හඳුනාගන්නා ලද ගැටළු පිළිබඳ සාකච්ඡා කර විසඳුම් ලබා ගැනීමට අවශ්‍ය පියවර 2019 වර්ෂයේ දී ගන්නා ලදී. ඒ අනුව ආංශික නිපුණතා සභාවන්හි ලියාපදිංචි කර්මාන්තවලට වැඩි සිසුන් පිරිසක් බඳවා ගැනීම 2019 වර්ෂයේ සිදුවිය.

9.3.16. නිපුණතා සංවර්ධන නිලධාරීන්, වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන්, වෘත්තීය මාර්ගෝපදේශන ක්ෂේත්‍රයේ නිලධාරීන් සඳහා කුසලතා වර්ධන වැඩසටහන් පැවැත්වීම.

කාර්මික හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය පිළිබඳව නිවැරදි දත්ත ප්‍රජාව අතරට ගෙන යනු ලබන නිලධාරීන් වන වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීම හා නවතම දත්තයන් ලබාදීම තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් 2019 වර්ෂයේදී සිදුකරනු ලැබිණ. එහිදී වැඩසටහන් දෙකක් වස්කඩුව ටැන්ජරින් හෝටලයේදී පැවැත්වූ අතර එය දින තුනක වැඩසටහනක් ලෙස පැවැත්විය. එක් වැඩසටහනක් මීගමුව ඩොල්ෆින් හෝටලයේදී පවත්වන්නට යෙදුනි. දෙමළ මාධ්‍යයෙන් වැඩසටහන පැවැත්වූයේ පොළොන්නරුව සුදු අරලිය හෝටලයේදීය. එමෙන්ම වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන් උදෙසා පරිගණක පුහුණු වැඩසටහන් දෙකක් දින 4ක් පුරා ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවැත්විනි. මේ සියළුම වැඩසටහන් සඳහා සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව 245ක් පමණ වේ.

9.3.17. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිබඳව වාර්තාමය වැඩසටහන් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

මහජන සම්බන්ධතා අංශය විසින් සිදුකරන ලද විශේෂ වැඩසටහන්.

- කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ආධාර සපයන ව්‍යාපෘති/ වැඩසටහන් සමඟ කටයුතු කිරීම.
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සේවාවන් පිළිබඳව සමස්ථ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා ප්‍රදර්ශන ඇතුළු වැඩසටහන් සංවිධානය කිරීම හා සහභාගි වීම.
- කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා සම්පත්දායකත්වය ලබාදීම.
- ජාතික වශයෙන් පවත්වන ක්ෂේත්‍රයට සම්බන්ධ වැඩසටහන් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ නියෝජනය ලබාදීම.
- ආංශික නිපුණතා සභාවන්හි මාණ්ඩලීය රැස්වීම් සඳහා සහභාගි වීම.
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ තොරතුරු පද්ධති අංශයෙන් සම්පාදනය කරනු ලබන TVET Guide සඳහා මහජන සම්බන්ධතා අංශයෙන් ලිපි පළ කිරීම.
- Touch Your Future වැඩසටහන සඳහා පූර්ණකාලීන දායකත්වය ලබාදීම.
- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සඳහා මහජන සම්බන්ධතා අංශයේ නිලධාරීන් සම්බන්ධවූ අතර ප්‍රාදේශීය කර්මාන්ත සභා හා ඒකාබද්ධව කටයුතු කිරීම සඳහා මෙම කමිටුවලට අවශ්‍ය යෝජනා ලබාදීම.
- 2019 වර්ෂයේ හම්බන්තොට පැවති යොවුන්පුරය වැඩසටහන, අනුරාධපුරයෙහි හා යාපනය දිස්ත්‍රික්කයෙහි පැවැත්වූ Enterprise Sri Lanka වැඩසටහන සහ යාපනයෙහි පැවති රට වෙනුවෙන් එකට සිටිමු යන විශේෂ වැඩසටහන් මහජන සම්බන්ධතා අංශය මඟින් සම්බන්ධීකරණය කොට පවත්වාගෙන යන ලද අතර ප්‍රදර්ශන කුටියක් පවත්වා ගෙන යාම තුළින් මහජනතාව වෙත තොරතුරු ලබාදීම.
- අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් සංවිධානය කරනු ලබන විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් හට වෘත්තීය පුහුණුව ලබාදීමේ රැස්වීම්වලට හා වැඩසටහන්වලට දායකත්වය ලබාදීම හා අවශ්‍ය මාර්ගෝපදේශනය ලබාදීම.
- අමාත්‍යාංශය මඟින් විදේශ ශිෂ්‍යත්ව සඳහා නිපුණතා සංවර්ධන නිලධාරීන් තෝරාගැනීමට පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණ සඳහා දායකත්වය ලබාදීම.
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනෙකුත් අංශයන්හි රාජකාරී සඳහා අවශ්‍ය ඉල්ලීම් අනුව සහභාගී වීම හා කටයුතු කිරීම.
- TVEC facebook යාවත්කාලීනව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය පියවර ගැනීම

10.0 තොරතුරු පද්ධති අංශය

කොමිෂන් සභාවේ තොරතුරු පද්ධති අංශය මඟින් විවිධ වූ තොරතුරු එක්රැස් කර අවශ්‍ය පරිදි පිරිසැකසුම් කර එම තොරතුරු අදාල පාර්ශවයන්ට ලබාදීමේ කාර්යය ඉටු කරනු ලැබේ.මෙම කාර්ය සඳහා පරිගණක හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගන්නා අතර, එමඟින් තොරතුරු භාවිතයට ගැනීමට වැඩි පහසුවක් හා උපයෝගීතාවයක් ඇති වේ.තොරතුරු සාමුහිකව පරිහරණය කිරීම තුළින් ආයතනික සංවර්ධනය ලඟා කර ගත හැකිය. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ තොරතුරු පද්ධති අංශයෙන් මෙම අත්‍යවශ්‍ය තොරතුරු සේවාව විධිමත් පරිදි ලබාදීම සඳහා නවීනතම තාක්ෂණය උපයෝගි කරගනී. එම තොරතුරු ආයතනික දියුණුව සඳහා සාර්ථකව පරිහරණය කිරීමට හැකි වන අයුරු උපාය මාර්ග හා විධිවිධාන සැලසීම මඟින් දිනපතා සීඝ්‍රයෙන් වර්ධනය වන තොරතුරු සමුදාය හරහා සිදුවේ.

තොරතුරු පද්ධති අංශයේ ප්‍රධාන අරමුණු

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්යයන් විධිමත් හා පහසු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු පද්ධති සංවර්ධනය කිරීම,ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම ද සිදුවේ. තොරතුරු පද්ධති අංශය අධ්‍යක්ෂ, වැඩ බලන ශ්‍රම වෙළෙඳපොළ විශ්ලේෂක හා සංඛ්‍යාලේඛණඥ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හා පුස්තකාලාධිපති, වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂක, සහකාර අධ්‍යක්ෂකවරු 3ක් හා පරිගණක චිත්‍රක ශිල්පී ඇතුළු කාර්යය මණ්ඩලයකින් 2019 වසරේදී සමන්විත විය.

තොරතුරු පද්ධති අංශයේ ප්‍රධාන කාර්යයන් සහ වැඩසටහන් පහත දැක්වේ.

- ඉල්ලුම අනුව ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු විශ්ලේෂණය කිරීම.
- ඉදිරි වර්ෂය සඳහා වෘත්තීය අධ්‍යාපනයට හා වෘත්තීය පුහුණුවට මඟ (TVET Guide) ප්‍රකාශයට පත්කිරීම හා අවශ්‍ය තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම.
- UNEVOC ප්‍රාදේශීය මධ්‍යස්ථානය පවත්වගෙනයාම සහ එහි කාර්යයන් සහ වැඩසටහන් දිගටම ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතිය හා වෙබ් පිටුව සංවර්ධනය කර පවත්වාගෙන යාම.
- ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සංග්‍රහය සැකසීම හා ප්‍රකාශයට පත්කිරීම.
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පුවත් ලිපිය (Newsletter) සැකසීම හා ප්‍රකාශයට පත් කිරීම.
- තෘතීයීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් අංශයන්ගේ කටයුතු සාර්ථකව පවත්වා ගැනීම සඳහා පරිගණක පද්ධති නිර්මාණය කිරීම සහ පවත්වාගෙම යෑම.
- කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි වී ඇති සහ ලියාපදිංචි විය යුතු ආයතන සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය වන පරිගණක මෘදුකාංග පවත්වාගෙන යාම සහ එම කටයුතු සාර්ථකව කරගෙන යෑමට අවශ්‍ය තොරතුරු එම ආයතන වෙත ලබා දීම.

- අප ආයතනය යටතේ ක්‍රියාත්මක වන සේවාවන් පිළිබඳව තොරතුරු මහජනතාව සඳහා ලබා දීමට අවශ්‍ය වන TVEC වෙබ් අඩවිය නිර්මාණය කිරීම, පවත්වාගෙන යෑම සහ යාවත්කාලීන කිරීම.

- ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකපත් මුද්‍රණ කටයුතු සඳහා අවශ්‍ය වන පරිගණක මෘදුකාංග පවත්වාගෙන යෑම, අවශ්‍ය දත්ත ඇතුලත් කිරීම සඳහා අනෙකුත් ලියාපදිංචි පුහුණු ආයතන වෙත උපදෙස් ලබා දීම හා එම දත්ත කළමනාකරණය.

- SSDP වැඩසටහන යටතේ නිර්මාණය වන කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) හා සම්බන්ධවී තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට අවශ්‍ය තොරතුරු ලබාදීම.

- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන සෑම අංශයකටම අවශ්‍ය වන පරිගණක යන්ත්‍ර සහ ඒ ආශ්‍රිත උපකරණ මිලදී ගැනීමේදී ඇති වන අවශ්‍යතා හඳුනා ගැනීම සහ ඒ සඳහා අවශ්‍ය වන පිරිවිතරයන් ලබා දීම හා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබාදීම.

- ආයතනය තුල පරිගණක ජාලගත කිරීම, අන්තර්ජාල සහ විද්‍යුත් තැපෑල පහසුකම් ලබා දීම, මේ සඳහා අවශ්‍ය Servers නිසි ආකාරයෙන් පවත්වාගෙන යෑම හා ඒවයේ දෘඩාංග හා මෘදුකාංග යාවත්කාලීන කිරීම.

- කොමිෂන් සභාවේ කාර්යමණ්ඩලයට පුස්තකාල සේවාව හා ආශ්‍රිත තොරතුරු පහසුකම් සැලසීම හා පුස්තකාලය පවත්වාගෙන යාම.

- අවශ්‍ය වූ විට අදාල පරිදි ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු විශ්ලේෂණය කර සම්පාදනය කිරීම, කොමිෂන් සභාවේ කටයුතු වලට අවශ්‍ය පරිගණක චිත්‍ර නිර්මාණය කිරීම යනාදී කටයුතු මින් ප්‍රධාන ස්ථානයෙහි ලා ගැනේ.

මෙම අංශයේ ප්‍රධාන තොරතුරු පද්ධතිය සමන්විත වන්නේ ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතිය, ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීමේ පද්ධතිය, සැලසුම් සහ පර්යේෂණ පද්ධතිය හා ආයතන ලියාපදිංචි කිරීමේ හා පාඨමාලා ප්‍රතීතනය කිරීමේ තොරතුරු පද්ධතිය යනාදී තොරතුරු පද්ධතීන්ගෙනි. 2019 වර්ෂය තුලදී මෙම අංශය මඟින් පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් හා සේවාවන් ඉටුකිරීමට සමත් වී ඇත.

10.1 ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ වර්තමාන රැකියා ඉල්ලුම සහ අනෙකුත් ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සැපයීම අරමුණු කරගෙන ඊට අදාල ශ්‍රම වෙළෙඳපොල තොරතුරු පද්ධතියක් ස්ථාපනය කර ඇත.

දත්ත සමීක්ෂණය හා විශ්ලේෂණය මඟින් ලබාගන්නා ලද ශ්‍රම වෙළෙඳපොළ ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සම්පාදකයන්, වෘත්තීය මාර්ගෝපදේශකයන්, රැකියාගත කිරීමේ නියුතු ආයතන, පුහුණුකරුවන්, සේවායෝජකයන් හා රැකියා අපේක්ෂකයින් යනාදී පාර්ශවවල ප්‍රයෝජනය සඳහා ප්‍රකාශයට පත්කරනු ලැබේ.

තෘතීයීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් ප්‍රකාශයට පත්කරනු ලබන ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනය (LMI Bulletin) මඟින් හා කොමිෂන් සභාවේ අන්තර්ජාල පිටුව (TVEC website : www.tvec.gov.lk) මඟින් ලබාගත හැක.

10.2 ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනය පිළියෙල කිරීම හා ප්‍රකාශ කිරීම

2019 වසර තුළ දී ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශන 2 ක් ප්‍රකාශයට පත්කිරීමට තොරතුරු පද්ධති අංශයට හැකිවිය. මෙම ප්‍රකාශන මඟින් 2018 වසරේ මුල් භාගයේදී සහ 2018 වර්ෂයේ අග භාගය තුල ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළෙඳපොළේ පැවැති ස්වභාවය විනිවිදව විශ්ලේෂණය කර ඉදිරිපත් කිරීමට සමත් වී තිබේ.

ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සංග්‍රහය පහත සඳහන් පරිදි කොටස් 5 කින් යුක්ත වේ.

1. රැකියා සඳහා ඇති ඉල්ලුම
2. සේවානියුක්තිය
3. සේවාවියුක්තිය
4. ශ්‍රම වෙළෙඳපොළ සැපයීම හෙවත් විවිධ රැකියාවලට ඇති ශ්‍රම සැපයුම
5. ශ්‍රම වෙළෙඳපොළ සඳහා ඇති ඉල්ලුම සහ පර්යේෂණ තොරතුරු

2019 වසර තුල දී ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා තොරතුරු පද්ධති අංශය ක්‍රියාකර ඇත.

ඒ අනුව, ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනයට නව මුහුණුවරක් දෙමින් ශ්‍රම වෙළෙඳපොළ සම්බන්ධව කරන ලද පර්යේෂණ හා ශ්‍රම බලකාය පිළිබඳ තොරතුරු,ශ්‍රම වෙළෙඳපොළ ගමන්මඟ පිලිබඳ විශේෂ උනන්දුවක් දක්වන අයට වඩා ප්‍රයෝජනවත් වන ආකාරයට මෙම ප්‍රකාශනය තුලින් එළි දැක්වීමට කටයුතු කරන ලදී.

ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනයේ දේශීය හා විදේශීය වශයෙන් රැකියාවලට ඇති ඉල්ලුම, දේශීය හා විදේශීය වශයෙන් ඇති පුවත්පත් දැන්වීම් පදනම් කරගෙන එක් එක් කර්මාන්ත අංශයන් හී ඇති රැකියා අවස්ථා, රැකියාගත වීම්, අධ්‍යාපන සුදුසුකම්, ස්ත්‍රී/පුරුෂ භාවය හා පලපුරුද්ද ආදී වශයෙන් රැකියාවට සම්බන්ධ අදාල තොරතුරු අන්තර්ගත කර ඇත.

2006 සිට 2016 වර්ෂය දක්වා එක් එක් වර්ෂයන්හි "සිළුමිණ" හා "Sunday Observer" පුවත්පත් මඟින් සමීක්ෂණය කරන ලද සහ 2017 වර්ෂයේ සිට මේ දක්වා "ලංකාදීප" හා "Sunday Observer" පුවත්පත් මඟින් සමීක්ෂණය කරන ලද දැන්වීම් ගණන අංක 8.1 වගුවේ දැක්වේ.

වගුව 8.1 - සම්පාදනය කරන ලද රැකියා පිළිබඳ දැන්වීම් සංඛ්‍යාව

වර්ෂය	රැකියා පිළිබඳ දැන්වීම් සංඛ්‍යාව
2006	104,839
2007	113,060
2008	116,157
2009	82,167

වර්ෂය	රැකියා පිළිබඳ දැන්වීම් සංඛ්‍යාව
2010	124,741
2011	108,193
2012	136,994
2013	107,698
2014	91,430
2015	81,369
2016	74,245
2017*	226,555
2018	215,991

2017* වර්ෂයේ සිට සිළුමිණ පුවත්පත වෙනුවට ලංකාදීප පුවත්පත යොදාගැනීම.



2006-2018 වර්ෂය දක්වා පැවති රැකියා පිළිබඳ දැන්වීම් පහත ස්ථම්භ ප්‍රස්ථාරය මඟින් දැක්වේ.



පුවත්පත් දැන්වීම් මඟින් පලකර ඇති රැකියා පුරප්පාඩු මට්ටම තවදුරටත් සාර්ථක කරගැනීමට විද්‍යුත් තැපෑල හා වෙබ් අඩවි තොරතුරු සලකා බලන ලදී.

10.3 ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු වෙබ් පිටුව

කාර්යක්ෂම හා ඵලදායී ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සේවාවක් යාවත්කාලීනව ලබාදීමට ඒවා භාවිතා කරන්නන් හට ලබාදීමේ අරමුණින්ම වෙන් වූ මෙම වෙබ් අඩවිය 2019 වසර තුල යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් ඇත.

- වත්මන් ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු විශ්ලේෂණය
- පුහුණු පාඨමාලා තොරතුරු අන්තර්ජාලයෙන් බලාගත හැකිවීම
- පසුගිය ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශන
- ශ්‍රම වෙළෙඳපොළ පිළිබඳ සංකල්ප හා අර්ථ දැක්වීම
- ප්‍රයෝජනවත් වෙබ් අඩවිවලට පිවිසුම
- ජීව දත්ත සහිත ඉල්ලුම් පත්‍ර සාදා ගැනීමට සහය වීම
- රැකියා ඇබෑර්තු තොරතුරු ලබාගැනීමට හැකිවීම
- කාර්මික හා ඊට සම්බන්ධ වෘත්තීය ක්ෂේත්‍රයේ ඉහළ ඉල්ලුමක් ඇති රැකියා 10 ක් ප්‍රදර්ශනය කිරීම යනාදී වැදගත් කරුණු ලබාදීමට කටයුතු කර ඇත.

- වාර්ෂික TVET Guide (වෘත්තීය පුහුණුවට මඟ) පාඨමාලා විස්තර

- ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පිළිබඳ සංකල්පීය යෙදුම් අර්ථ දැක්වීම් සහ පාරිභාෂික ශබ්දමාලා ,වචන ශ්‍රම වෙළෙඳපොළ රැකියා දැන්වීම් වලට අමතරව සේවා නියුක්තිකයන් විසින් ඉදිරිපත් කරන ලද විවිධ තොරතුරු යාවත්කාලීන කර මෙම වෙබ් පිටුව ප්‍රකාශයට පත්කර ඇත.

10.4 අන්තර්ජාලය,විද්‍යුත් තැපෑල හා පහසුකම්

විද්‍යුත් තැපෑල භාවිතා කිරීම පිළිබඳව වූ රජයේ චක්‍රලේඛය අනුව කාර්යාල තොරතුරු හුවමාරු කිරීමේදී කාර්යක්ෂමතාවය වැඩිකිරීම, වියදම අඩුකිරීම සහ කාලය ඉතුරු කර ගැනීම සඳහා නවතාවයකින් යුතුව අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල් පහසුකම් කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකුටම භාවිතා කිරීමට පහසුකම් සලසා ඇත. එමඟින් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සන්නිවේදන කාර්යක්ෂමතාවය වර්ධනය කර ගැනීමට මෙන්ම අන්තර්ජාලය තුලින් නව දැනුම ලබාගැනීමට පහසුකම් සලසා ඇත. කාර්යය මණ්ඩලය වෙත තොරතුරු ලබාදීම සඳහා අභ්‍යන්තර ජාලයක් නඩත්තු කරනු ලබයි.

මෙම නව සන්නිවේදන ක්‍රමයේ ඇති නම්‍යශීලි බව හා එමඟින් තොරතුරු ලබාගැනීමේ ඇති පහසුව නිසා එය පරිහරණය කරන්නන්ගේ අවධානයට ලක්ව තිබේ.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට කාර්යක්ෂමව තොරතුරු සන්නිවේදනය කර ගැනීමේ වැඩි ඉඩ ප්‍රස්ථාවක් සලසනු වස් විද්‍යුත් තැපෑල (Email) සහ අන්තර්ජාල පහසුකම් 2019 වසරේ දී වැඩිකර ඇත.

10.5 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා වෙබ්අඩවිය සංවර්ධනය හා පවත්වාගෙන යාම

තොරතුරු පද්ධති අංශය මඟින් කොමිෂන් සභා අන්තර්ජාල අඩවිය පාලනය කරනු ලබයි.කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම්, ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු වඩාත් නිවැරදිව හා යාවත්කාලීනව පවත්වාගෙන යාම හා කොමිෂන් සභාවේ නව වැඩිදියුණු වීම් හා වෘත්තීය හා කාර්මික අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ නව සංවර්ධනයන් හඳුන්වාදීම් කොමිෂන් සභා අන්තර්ජාල වෙබ් අඩවියේ ඇතුලත් වේ. මෙම තොරතුරු එකී ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන අයට අතිශයින්ම ප්‍රයෝජනවත් වේ.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අන්තර්ජාල අඩවියේ අනුරුවක් පහත දැක්වේ.



NVQ ප්‍රතිඵල එම ආයතන වලට ලබාගැනීමේ පහසුකම් සැලසීම හා ඇගයීම් ප්‍රතිඵල එම ආයතනවලට අදාල තොරතුරු ලබාගැනීමේ පහසුකම් ලබාදීම සඳහා දත්ත ඇතුලත් කිරීමට 2015 වර්ෂයේ සලසා දී තිබූ පහසුකම් 2019 වර්ෂයේ වැඩි දියුණු කර ඇත.

කොමිෂන් සභාවේ ප්‍රධාන අන්තර්ජාල වෙබ් අඩවිය තුලින් පහත සඳහන් වෙබ්පිටුවලට පිවිසීමට අවස්ථාව සලසා ඇත.

- ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු (LMI)
- ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)
- පාඨමාලා ලියාපදිංචිය හා ප්‍රතීතනය (Registration & Accreditation)
- සැලසුම් හා පර්යේෂණ (Planning & Research)
- අභ්‍යන්තරජාලය (Intranet)
- කොමිෂන් සභාවේ පර්යේෂණාකවය
- පුවත් හා සිදුවීම්
- තොරතුරු පද්ධති
- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු මඟපෙන්වීම
- ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීමේ ක්‍රමවේදය
- අයඳුම්පත් හා තොරතුරු බාගත කිරීම
- අභ්‍යන්තර වෙබ් ජාලය

පහත දැක්වෙන වෙබ්අඩවි 2019 වසරේ දී තවදුරටත් සංවර්ධනය කර අන්තර්ජාලය වෙත සම්බන්ධ කර ඇත.

10.6 ලියාපදිංචි හා ප්‍රතීතන වෙබ් අඩවිය

මෙම වෙබ් අඩවිය මඟින් ආයතන ලියාපදිංචිය හා පාඨමාලා ප්‍රතීතනය පිළිබඳ සියළුම තොරතුරු ලබාගැනීමට හැකිය. තවද මෙම වෙබ් අඩවියේ ලියාපදිංචි ආයතන හා කොමිෂන් සභාව විසින් ප්‍රතීතනය කරන ලද පාඨමාලා පිළිබඳ තොරතුරු, තත්ත්ව කළමනාකරණ පද්ධතිය පිළිබඳ තොරතුරු, ලියාපදිංචි ඉල්ලුම්පත්, ලියාපදිංචිය අළුත්කිරීමේ ඉල්ලුම්පත්, පාඨමාලා ප්‍රතීතන අයඳුම්පත් ආදිය අඩංගු කර ඇත. වෙබ්අඩවිය මඟින් පාඨමාලා ලියාපදිංචිය, ආයතන ලියාපදිංචි කිරීම සඳහා Online ක්‍රමයට අයඳුම්කල හැකිවීම සහ එක් එක් ආයතන සඳහා වෙනම ද්වාරයක් වෙන් කර තිබීම විශේෂත්වයකි. මෙම ක්‍රියාවලිය 2019 වසරේ දී තවදුරටත් වැඩි දියුණු කරන ලදී. මෙම වෙබ් අඩවිය 2019 වර්ෂයේ දී NVQ සහතිකපත් මුද්‍රණය කරන වෙබ් අඩවිය හා සම්බන්ධ කරන ලදී. මේ මඟින් තත්ව කළමනාකරණයේ ඉදිරි පියවරක් තබන ලදී.

මෙම වෙබ් අඩවියේ අනුරුවක් පහත දැක්වේ.



10.7 පුහුණු ආයතන

ලියාපදිංචි හා ප්‍රතීතන තොරතුරු වෙබ් පහසුකම

මෙම පහසුකම මඟින් ලියාපදිංචි වී ඇති ආයතන හා ප්‍රතීතනය කරන ලද පාඨමාලා පිළිබඳ තොරතුරු අන්තර්ජාලය ඔස්සේ පරීක්ෂා කල හැකි අතර එමඟින් ඕනෑම අයෙකුට පහත සඳහන් ක්‍රමවේදයන්ට අනුව තොරතුරු සොයාගත හැකිය.

1. පළාත් සහ ක්ෂේත්‍ර අනුව ආයතන විස්තර
2. පළාත් සහ හිමිකාරීත්වය අනුව ආයතන විස්තර
3. පළාත් නම හෝ නමින් කොටසක් මඟින් ආයතන විස්තර
4. පාඨමාලා නම සහ දිස්ත්‍රික්ක අනුව ආයතන විස්තර

10.8 සැලසුම් සහ පර්යේෂණ වෙබ් අඩවිය

සැලසුම් හා පර්යේෂණ වෙබ් අඩවියේ වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් ප්‍රතිපත්ති, ආයතනික සැලසුම, වාර්ෂික සැලසුම්, වෘත්තීය පුහුණු සැලසුම් සහ මූල්‍යාධාර පිළිබඳ විස්තර ආදිය ඇතුලත් කොට ඇත. පර්යේෂණ කවය සඳහා වෙනමම වෙබ් අඩවියක් ස්ථාපිත කර ඇති අතර එහි පර්යේෂණ කවයේ පරමාර්ථ,පර්යේෂණ කවය ස්ථාපිත කිරීම අරමුණු කරන ලද පර්යේෂණ වර්ග සහ වෙනත් පර්යේෂණ වල ප්‍රගතිය ඇතුලත් වේ. පර්යේෂණ සඳහා උනන්දුවක් දක්වන කණ්ඩායම්වලට පර්යේෂණවල ප්‍රගතිය සහ ඒ පිළිබඳ තොරතුරු ලබාගත හැකිය.

10.9 තොරතුරු පද්ධති අංශයේ වෙබ් අඩවිය

තොරතුරු පද්ධති අංශය එම අංශයේ තොරතුරු ඉදිරිපත්කිරීම සඳහා මෙම වෙබ් අඩවිය 2019 වසරේ දී ද සංවර්ධනය කර පවත්වාගෙන යන ලදී.

ඉහත තොරතුරු වලට අමතරව තොරතුරු පද්ධති අංශය 2019 වසරේ දී පහත දැක්වෙන දත්ත සමුදායන් සංවර්ධනය කර පවත්වාගෙන ගොස් ඇත.

- ලියාපදිංචි පුහුණු මධ්‍යස්ථාන හා ප්‍රතීතනය කල පාඨමාලා
- ජාතික වෘත්තීය සුදුසුකම්ලාභීන්ගේ තොරතුරු
- පුවත්පත් දැන්වීම් සමීක්ෂණ තොරතුරු

තවද තොරතුරු පද්ධති අංශය අභ්‍යන්තර පරිගණක ජාලය, අන්තර්ජාල හා ඉලෙක්ට්‍රෝනික තැපැල් පද්ධති, පරිගණක ජාල පිවිසුම් බාධක (Network Firewall) ආදිය ආයතනයේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා 2019 වසර තුළ පවත්වාගෙන ගොස් ඇත.

10.10 කාර්මික හා වෘත්තීය අධ්‍යාපන / පුහුණු මාර්ගෝපදේශය (TVET Guide)

කොමිෂන් සභාවේ තොරතුරු පද්ධති අංශය මඟින් ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශයට අමතරව 2020 වර්ෂය සඳහා කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුව පිළිබඳ මග පෙන්වීමේ ප්‍රකාශනය (TVET GUIDE 2020) 2019 වසර අවසානයේදී ප්‍රකාශයට පත් කරන ලදී.

මෙම (TVET GUIDE) ප්‍රකාශය පලාත් මට්ටමින් ආයතන අනුව හා අධ්‍යාපන ක්ෂේත්‍ර අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ වෘත්තීය පුහුණු පාඨමාලා විස්තර, පාඨමාලා බඳවා ගැනීමේ සුදුසුකම් ආදී විස්තර, පාඨමාලා ගාස්තු, ලියාපදිංචි පුහුණු ආයතන පිළිබඳ විස්තර හා ප්‍රතීතනය කල පාඨමාලා පිළිබඳ විස්තර එහි ඇතුලත් කර ඇත. පළාත් මට්ටමින් එක් එක් ආයතනවල පාඨමාලා හැදෑරීමට අවශ්‍ය සුදුසුකම් අනුව වර්ග කර දක්වා ඇත.

TVET GUIDE 2020 හි අනුරුවක් පහත දැක්වේ



මෙම ප්‍රකාශනය පළාත් 9 ඇතුළත්වන සේ කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇති අතර, ඒ තුළින්

1. පළාත් සහ අධ්‍යයන ක්ෂේත්‍ර අනුව ආයතන විස්තර.
2. පළාත් සහ අධ්‍යාපන සුදුසුකම් අනුව ආයතන විස්තර.
3. පළාත් සහ අධ්‍යයන ක්ෂේත්‍ර අනුව පාඨමාලා තොරතුරු ලබා ගත හැක.

මෙම වෙබ් පිටුවේ අනුරුවක් පහත දැක්වේ



10.11 TVEC පුවත් ලිපිය

2019 වසර තුළ දී තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් සිදුකරන ලද කාර්යයන් පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් TVEC පුවත් ලිපි (TVEC Newsletters) දෙකක් ප්‍රකාශයට පත්කර සියලුම ලියාපදිංචි පුහුණු මධ්‍යස්ථාන හා ඒ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන් අතරේ නොමිලයේ බෙදා හරින ලදී.

එම පුවත් ලිපි දෙකෙහි අනුරූ පහත දැක්වේ.





10.12 කොමිෂන් සභාවේ පුස්තකාලය

කොමිෂන් සභාවේ පුස්තකාලය තොරතුරු පද්ධති අංශය මඟින් පාලනය වේ. පුස්තකාලය මඟින් දෙස් විදෙස් විවිධ අධ්‍යාපන ක්ෂේත්‍රවල නියුතු විවිධ තරාතිරම් වලට අයත් පර්යේෂකයන් විද්වතුන් වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ පුද්ගලයන්ට පුස්තකාල පහසුකම් සලසා ඇත. ඒ අනුව පුස්තකාලය මඟින් පහත සඳහන් සේවාවන් ලබා දීම සිදුවේ.

- වෘත්තීය හා කාර්මික අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයට අදාල පොත්පත්, පර්යේෂණ වාර්තා සැපයීම.
- කොමිෂන් සභාවේ ප්‍රකාශන පාලනය හා බෙදාහැරීම.
- වාර සඟරා පරිහරණයට ඉඩ සැලසීම.
- දිනපතා පුවත්පත් පරිහරණයට ඉඩසැලසීම හා අනෙකුත් ප්‍රලේඛන කාර්යයන්
- වෙනත් විවිධ තොරතුරු පරිශීලනය ප්‍රලේඛන සේවා සහ තොරතුරු සේවා සැපයීමේ පහසුකම්

ඊට අමතරව කොමිෂන් සභාවේ පුස්තකාලයේ නොමැති එහෙත් උනන්දුවක් දක්වන පාඨකයන්හට අන්තර් පුස්තකාල පිරුළු සේවාව මඟින් අවශ්‍ය පුස්තකාල තොරතුරු සේවාව සපයා ඇත. කාර්යය මණ්ඩලයේ නිලධාරීන්ගේ තොරතුරු අවශ්‍යතා ඉටුකරනු වස් පසුගිය වසර තුළ ද වෙනත් පුස්තකාල මඟින් තොරතුරු සම්පත් හුවමාරු කරගෙන ඇත.

බ්‍රිතාන්‍ය කවුන්සිලයේ ඇති පුස්තකාලයේ ආයතනික සාමාජිකත්වය ද ලබාගෙන තිබේ. එමඟින් අතිරේක පොතපත පරිශීලනය කිරීමට පහසුකම් සළසා ඇති අතර අන්තර්ජාතික දැනුම පාඨකයන්ට ලබා දීමට පුස්තකාලය 2019 වසරේ ද කටයුතු කර ඇත.

10.13 2019 වර්ෂයේදී තොරතුරු පද්ධති අංශය මඟින් සංවිධානය කල විශේෂ වැඩසටහන් සහ අලුතින් සකස්කරන ලද විශේෂ සේවාවන්

2018/2019 වර්ෂයන් සඳහා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයට අදාළ ජාතික නිපුණතා සංවර්ධන වාර්තාව 2019 දී සකස් කර ප්‍රකාශයට පත් කරන ලදී.

ජාතික නිපුණතා සංවර්ධන වාර්තාව 2018 හා 2019 දී ශ්‍රී ලාංකේය ශ්‍රම වෙළඳපොළ තුළ ලබාගත හැකි කුසලතාවන් පිළිබඳ මූලික වාර්තාවක් සපයයි. මෙම වාර්තාව ශ්‍රම වෙළඳපොළ දෙස බලන විට මධ්‍යම ප්‍රමාණයේ සිට දිගු කාලීන ප්‍රවණතා පිළිබඳ තොරතුරු ලබාදෙයි.

තවද මෙම වාර්තාවෙන් පෙන්නුම් කරන්නේ ශ්‍රම සැපයුම හා ඉල්ලුමේ ප්‍රක්ශේපයන්ගේ ප්‍රතිඵලය, වෙනස්කම් කරන ප්‍රධාන සාධකයන් වටා අතීත දත්ත හා උපකල්පන පිළිබඳ අවබෝධය මත පදනම්ව ය. එවන් පුරෝකථනයන් පිටුපස ඇති තර්කයක් වන්නේ ශ්‍රම වෙළඳපොළේ සියලුම සහභාගීවන්නන් සඳහා ප්‍රයෝජනවත් ප්‍රමිතික තොරතුරු සහ විනිවිදභාවය සපයන ලද පුළුල්, ක්‍රමානුකූල, ස්ථාවර හා විනිවිද පෙනෙන ප්‍රක්ෂේපණ සංඛ්‍යාවක් බවය.

මෙම වාර්තාව මඟින් ප්‍රතිපත්ති විශ්ලේෂණය හා රැකියා නියුක්ති රටාවන් වෙනස් කිරීම හා නිපුණතා අවශ්‍යතා සඳහා වන බලපෑම් පිළිබඳ පොදු ස්වභාවය පිළිබඳව ප්‍රයෝජනවත් තොරතුරු සපයයි.

10.14 2019 වසරේ දී සකස්කල නව තොරතුරු පද්ධති මෘදුකාංග

2019 දී, තොරතුරු පද්ධති අංශය විසින් නියම කාල දත්ත ගබඩාව සම්බන්ධ කරන වෙබ් අඩවියේ ගතික තොරතුරු (Information Dash Board) සැපයීමේ අරමුණින් නිර්මාණය කර තිබූ වෙබ් පිටුව යාවත්කාලීන කරන ලදී.

වෙබ් අඩවියේ පහත සඳහන් තොරතුරු දක්වා ඇත.

- ක්‍රියාකාරී ලියාපදිංචි පුහුණු ආයතන
- ක්‍රියාකාරී ප්‍රතිපාදන කල පාඨමාලා
- පුහුණු සැපයුම්කරුවන් විසින් සහතික නිකුත් කිරීම
- පුහුණු සැපයුම්කරුවන් විසින් සහතික ලබා දීම



කොමිෂන් සභාව මගින් පවත්වන දැනුම පරීක්ෂා කිරීමේ විභාග (Knowledge Assessment Test) සඳහා ඉල්ලුම් කිරීමට, විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම, විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා පද්ධතියක් නිර්මාණය කර වෙබ් අඩවිය හරහා පවත්වාගෙන යාම 2019 වර්ෂයේ දී සාර්ථකව සිදු කරන ලදී.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශය

ආදායම්	සටහන	2019 (රු.)	2018 (රු.)	2017 (රු.)
භාණ්ඩාගාර ප්‍රදාන	01	136,260,126	138,056,007	123,422,576
ව්‍යාපෘති ප්‍රදාන	02	40,173,953	54,135,555	56,517,948
ඉපයූ මෙහෙයුම් ආදායම්	03	45,177,812	40,721,852	17,551,157
මූල්‍ය ප්‍රදාන ආපසු ලැබීම්		287,675	20,986	
ඉපයූ මෙහෙයුම් නොවන ආදායම්	04	71,993	362,212	320,888
		221,978,846	233,296,611	197,812,569
සේවක ණය පොළී ආදායම්	05	714,459	966,413	831,614
ස්ථාවර වත්කම් විකුණුම් ලාභ				
		222,693,305	234,263,024	198,644,183
කල් දැමූ ආදායම්		7,849,676	8,958,303	10,287,724
		230,542,981	243,221,327	208,931,907
වියදම්				
පාලක මණ්ඩල සහ කළමනාකරණ කමිටු දිමනා	06	342,337	730,531	334,881
පුද්ගලික පාරිශ්‍රමික	07	76,924,458	72,335,945	60,526,230
ගමන් වියදම්	08	1,305,468	812,182	2,393,790
සැපයුම් සහ පාරිභෝජන ද්‍රව්‍ය	09	10,692,989	8,697,873	7,888,983
නඩත්තු වියදම්	10	6,006,287	6,350,539	5,661,316
පුනරුත්තාපන වියදම්	11	1,330,351	1,652,163	630,359
ගිවිසුම්ගත සේවා	12	11,861,917	12,707,820	13,203,376
මෙහෙයුම් වියදම්	13	67,322,485	56,279,705	49,830,111
		175,786,292	159,566,758	140,469,046
ව්‍යාපෘති වියදම්	14	40,181,505	54,068,925	49,797,969
		215,975,083	213,635,683	190,267,015
වර්ෂය සඳහා ක්ෂය		14,567,897	29,585,644	18,664,892
වෙන්කිරීම්වලට පෙර ශුද්ධ අතිරික්තය/ ඌණතාවය				
පාරිතෝෂික වෙන්කිරීම්				1,752,096
වෙන්කිරීම්වලට පසු ශුද්ධ අතිරික්තය /ඌණතාවය		14,567,897	29,585,644	16,912,796

කොමිෂන් සභාව වෙනුවෙන් අත්සන් කරන ලදී.

ඒ.එස්.අමරසිංහ
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)

ආර්.ඩී.එස්.කුමාරරත්න
අධ්‍යක්ෂ ජනරාල්

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

වත්කම්	සටහන	2019 (රු.)	2018 (රු.)	2017 (රු.)
ජංගම නොවන වත්කම්				
ශුද්ධ ස්පෘශ්‍ය වත්කම්	15	27,087,974	29,296,226	34,567,929
ජංගම වත්කම්				
ණයගැතියෝ	16	13,401,905	8,664,138	9,223,344
තැන්පත් සහ ලැබීම්	17	26,406,065	15,435,476	9,977,296
ඉතිරි තොගය - ශිෂ්‍ය වාර්ථා පොත්	18	3,270,017	2,958,906	2,258,857
මුදල් හා මුදල් සමකය	19	41,610,507	38,399,595	17,476,470
		84,688,495	65,458,115	38,935,967
මුළු වත්කම්		**111,776,469**	**94,754,341**	**73,503,896**
හිමිකම් හා වගකීම්				
සමුච්චිත අරමුදල		3,327,777	175,452	175,452
මෙහෙයුම් සංචිත	20	50,215,690	37,136,079	14,799,749
		52,841,507	37,311,531	14,975,201
ජංගම නොවන වගකීම්				
කල් දැමූ ආදායම්	21	27,087,974	29,296,226	34,567,929
පාරිතෝෂික ප්‍රතිපාදන (උප ලේඛන -01)		20,582,534	16,757,188	13,710,352
		47,670,508	46,053,414	48,278,281
		100,512,015	83,364,945	63,253,482
ජංගම වගකීම්				
ණයහිමියෝ	22	4,645,621	521,140	455,130
ගෙවිය යුතු	23	5,916,873	10,868,256	9,795,284
		11,264,455	11,389,396	10,250,414
මුළු වගකීම්		**111,776,469**	**94,754,341**	**73,503,896**

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

ඒ.එස්.අමරසිංහ
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)

ආර්.ඩී.එස්.කුමාරරත්න
අධ්‍යක්ෂ ජනරාල්

මහාචාර්ය දයන්ත එස්. විජේසේකර
සභාපති

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2019 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

	සමුච්චිත අරමුදල	පරිවර්තිත සංචිත	එකතුව
	රු.	රු.	රු.
2017.01.01 දිනට ශේෂය	175,452	299,124	474,576
පෙර වර්ෂ ගැලපුම්		1,157,183	1,157,183
ස්ථාවර තැන්පත් පොලී ආදායම ගැලපුම		195,539	195,539
ආරම්භක ශේෂ ගැලපුම		-3,764,893	-3,764,893
වර්ෂයට අදාල අතිරික්තය/ඌණතාවය		16,912,796	16,912,796
2017.12.31 දිනට ශේෂය	175,452	14,799,749	14,975,201
පෙර වර්ෂ ගැලපුම්		2,139,760	2,139,760
වෘත්තීය මාර්ගෝපදේශන		29,585,644	29,585,644
ආරම්භක ශේෂ ගැලපුම		-9,389,424	-9,389,424
වර්ෂයට අදාල අතිරික්තය/ඌණතාවය		350	350
2018.12.31 දිනට ශේෂය	175,452	37,136,079	37,311,531
ක්ෂය නිවැරදි කිරීම			
වර්ෂයට අදාල අතිරික්තය/ඌණතාවය	3,152,325	14,567,899	17,720,224
පෙර වර්ෂ ගැලපුම්		-1,488,286	-1,488,286
අතිරික්ත/ඌණතාව ගැලපුම්			
2019.12.31 දිනට ශේෂය	**3,327,777**	**50,215,690**	**53,543,467**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2019 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2019 (රු.)	2018 (රු.)	2017 (රු.)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය			
වර්ෂයට අදාල අතිරික්තය/ඌණතාවය	14,567,899	29,585,644	16,912,796
වත්කම් විකුණුම් ලාභය			
මූල්‍ය නොවන සිද්ධීන්			
පෙර වර්ෂ ගැලපීම්	-1,488,286	(9,389,424)	1,157,183
ක්ෂය කිරීම්	7,849,676	8,958,303	10,287,724
ආරම්භක ශේෂ වෙනස ගැලපීම්		1,975,224	195,538
ගැලපුම්			(3,764,893)
ගණුදෙනු වැටයීම	-5	350	
පාරිතෝෂික වෙන් කිරීම්	4,117,366	3,046,836	1,742,096
කල්දැමූ ආදායම	-7,849,676	-5,271,703	(312,225)
	1,927,113	**28,905,230**	**26,218,219**
පොලී ආදායම්			
පාරිතෝෂික ගෙවීම්	292,016		
කාරක ප්‍රාග්ධන වෙනස ගැලපීමට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම් වල වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**16,904,956**	**28,905,230**	**26,218,219**
ණයගැතියෝ (අඩුවීම/වැඩිවීම)	-4,737,767	559,206	(1,340,924)
තැන්පත් සහ ලැබීම් (අඩුවීම/වැඩිවීම)	-10,977,876	(5,458,181)	(4,890,265)
ඉතිරි තොගය (අඩුවීම/වැඩිවීම)	-311,111	(700,049)	(939,757)
ණයහිමියෝ (අඩුවීම/වැඩිවීම)	4,124,481	66,010	(6,720,711)
ගෙවිය යුතු වියදම් සහ තැන්පතු (අඩුවීම/වැඩිවීම)	- 4,951,383	1,072,973	(2,426,346)
	(-16,151,695)	**(-4,460,041)**	**(16,318,003)**
පොලී ආදායම්			
මෙහෙයුම් ක්‍රියාකාරකම් වල වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**58,587**	**24,445,189**	**9,900,216**
ආයෝජන වලින් වූ මුදල් ප්‍රවාහය			
දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම	-5,641,424	(3,522,064)	(9,975,499)
වත්කම් ඉවත් කිරීමේ ශුද්ධ අගය			
වත්කම් ඉවත් කිරීමේ මුදල් ප්‍රවාහය			

	2019 (රු.)	2018 (රු.)	2017 (රු.)
ආයෝජන වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**-5,641,424**	**(3,522,064)**	**(9,975,499)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය			
සමුච්චිත අරමුදල	3,152,325		
මහා භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන සහ නිපුණතා අංශික සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් මිලදී ගැනීම්	5,641,424		
සංචිත (සාමාන්‍ය භාණ්ඩාගාරයට මාරු කිරීම)			
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය			
වසර තුල මුදල් හා මුදල් සමකය	3,210,912	20,923,125	(75,282)
වසර ආරම්භයේ මුදල් හා මුදල් සමකය	38,399,595	17,476,470	17,551,752
වසර අවසානයේ වූ මුදල් හා මුදල් සමකය	**41,610,507**	**38,399,595**	**17,476,470**
බැංකු ගත මුදල් ශේෂය			
මහජන බැංකුව - ගිණුම් අංකය -078-1001-72266044	39,771,616	29,951,031	8,159,707
මහජන බැංකුව - ගිණුම් අංකය -078-1001- 12268324	424,004	2,978,140	4,208,448
මහජන බැංකුව - ගිණුම් අංකය - 078- 1001- 42266050	1,414,887	494,510	550,011
ඉතුරුම් තැන්පත්		4,975,914	4,558,304
	41,610,507	**38,399,595**	**17,476,470**

කොමිෂන් සභාව වෙනුවෙන් අත්සන් කරන ලදී.

ඒ.එස්.අමරසිංහ
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)

ආර්.ඩී.එස්.කුමාරරත්න
අධ්‍යක්ෂ ජනරාල්

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ සටහන්

	සටහන	2019 (රු.)	2018 (රු.)	2017 (රු.)
01. භාණ්ඩාගාර ප්‍රදාන				
පුනරාවර්තන		130,000,000	130,000,000	119,850,000
ප්‍රාග්ධන ප්‍රදාන - පුනරුත්තාපන හා වැඩිදියුණු කිරීම්	1.1	1,950,000	1,660,000	640,000
ප්‍රාග්ධන ප්‍රදාන - වත්කම් අත්පත් කරගැනීම්	1.2	3,560,000	1,943,993	9,627,424
ප්‍රාග්ධන ප්‍රදාන - හැකියා ගොඩනැගීම	1.3	4,390,000	6,396,007	2,932,576
		139,900,000	140,000,000	133,050,000
අඩුකලා- කල්දැමූ ආදායමට මාරුකිරීම්		3,639,874	1,943,993	9,627,424
මහාභාණ්ඩාගාරය වෙත නැවත ගෙවීම්				
		136,260,126	**138,056,007**	**123,422,576**
02. ව්‍යාපෘති ප්‍රදාන				
කෙටිකාලීන වැඩසටහන් (දේශීය)	2.1	2,777,923	213,630	17,322,377
නිපුණතා ආංශික සංවර්ධන	2.2	37,396,030	53,921,925	39,195,571
		40,173,953	**54,135,555**	**56,517,948**
03. මෙහෙයුම් ආදායම්				
ආයතන ලියාපදිංචි ගාස්තු	3.1	2,873,500	1,938,800	1,551,047
ප්‍රතිනත ගාස්තු	3.2	2,594,000	2,098,400	1,410,000
ජාතික වෘත්තීය සුදුසුකම් සහතික මුද්‍රණය	3.3	38,064,210	35,598,038	12,393,192
ඇගයුම් නිළධාරීන් ලියාපදිංචි ගාස්තු	3.4	100,500	99,650	73,739
අනෙකුත් ප්‍රකාශන අලෙවිය	3.5	748,475	838,750	861,500
ශිෂ්‍ය වාර්ථා පොත් විකුණුම් ශුද්ධ ආදායම	3.6	797,127	148,214	1,261,680
		45,177,812	**40,721,852**	**17,551,158**
04. මෙහෙයුම් නොවන ආදායම්				
අබලි ද්‍රව්‍ය විකිණීම		33,207	13,603	6,133
පුද්ගලික භාවිතය සඳහා වාහන පැවරීමේ ආදායම		37,500	25,617	20,500
ආපසු නොගෙවිය යුතු තැන්පතු මුදල්			6,000	6,000
අතිරික්ත දුරකථන බිල්පත් අයකර ගැනීම		1,286	208,992	288,255

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ සටහන්

	සටහන	2019 (රු.)	2018 (රු.)	2017 (රු.)
වෙනත් ආදායම් (පොත් ප්‍රකාශනය)			108,000	
		71,993	**362,212**	**320,888**
05. කාර්ය මණ්ඩල ණය පොළී ආදායම්				
කොමිෂන් සභා ණය පොළී		49,068	34,517	39,772
ආපදා ණය පොළී		344,446	512,765	379,658
විශේෂ අත්තිකාරම් පොළී		3,359	1,522	1,015
ස්ථාවර තැන්පත් පොළී		317,585	417,610	411,169
		714,459	**966,413**	**831,614**
06.පාලක මණ්ඩල සහ කළමනාකරණ කමිටු දීමනා				
පාලක මණ්ඩල දීමනා		259,024	667,161	244,888
කළමනාකරණ කමිටු දීමනා		83,313	63,370	89,993
		342,337	**730,531**	**334,881**
07. පෞද්ගලික පඩිනඩි				
වැටුප් හා වේතන		57,641,438	56,892,874	47,807,117
සේවක අර්ථ සාධක අරමුදල		6,398,083	5,886,544	7,501,011
සේවක භාරකාර අරමුදල		1,600,148	1,491,155	1,356,698
අතිකාල හා නිවාඩු දින දීමනා		5,422,423	2,265,263	1,579,155
පුහුණු දීමනා		920,000	932,050	1,307,250
සභාපති දීමනා		825,000	825,525	975,000
පාරිතෝෂිකය		4,117,366	4,042,534	
		76,924,458	**72,335,945**	**60,526,231**
08. ගමන් වියදම්				
දේශීය		787,748	675,744	435,410
විදේශීය		517,720	136,437	1,958,380
		1,305,468	**812,182**	**2,393,790**

	සටහන	2019 (රු.)	2018 (රු.)	2017 (රු.)
09. සැපයුම් හා පරිභෝජන				
මුද්‍රණ ලිපි ද්‍රව්‍ය	9.1	4,409,956	3,967,414	4,540,038
ඉන්ධන - ලිහිසි තෙල්	9.2	2,939,105	2,346,043	1,389,337
ප්‍රවාහන වියදම්		1,361,028	236,130	21,514
නිළ ඇඳුම්		152,000	126,000	124,000
පුවත්පත්		132,020	108,730	119,170
අනිකුත් සේවා ගාස්තු		801,198	1,195,355	1,239,430
සංග්‍රහ වියදම්		268,857	282,401	216,239
ඡායාපිටපත් මුද්‍රණ ගාස්තු				2,500
සුභ සාධන වියදම්		628,825	435,800	236,755
		10,692,989	**8,697,873**	**7,888,983**
10. නඩත්තු වියදම්				
වාහන නඩත්තු හා රක්ෂණ වියදම්	10.3	4,890,352	5,320,986	4,590,028
යන්ත්‍ර සූත්‍ර නඩත්තු වියදම්		50,140	146,741	466,639
ගොඩනැගිලි නඩත්තු වියදම්		576,364	388,808	206,200
පරිගණක සේවා		291,450	402,750	268,365
යාන්ත්‍රික හා විදුලි උපකරණ		178,421	64,117	34,234
නඩත්තු වියදම්		19,559	27,137	95,851
		6,006,287	**6,350,539**	**5,661,316**
11. පුනරුත්ථාපන වියදම්				
වාහන පුනරුත්ථාපන වියදම්		1,176,794	696,387	239,660
යන්ත්‍ර පුනරුත්ථාපන වියදම්			193,100	
ගොඩනැගිලි පුනරුත්ථාපන වියදම්		153,557	762,676	390,699
		1,330,351	**1,652,163**	**630,359**
12. ගිවිසුම්ගත සේවා				
දුරකථන ගාස්තු		3,305,604	3,125,459	3,601,843
තැපැල් වියදම්		505,541	213,500	310,816
විදුලි වියදම්		2,628,081	2,993,048	2,382,769

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ සටහන්

	සටහන	2019 (රු.)	2018 (රු.)	2017 (රු.)
ජල ගාස්තු		122,613	167,512	222,332
විරිපනම්		214,200	171,360	171,360
ආරක්ෂක සේවා		2,337,096	2,187,920	1,129,013
පවිත්‍රතා සේවා		1,087,257	1,424,590	1,218,445
විගණන ගාස්තු			250,000	
නීති ගාස්තු		138,923	7,500	
වාර සඟරා සාමාජික ගාස්තු		33,512	43,282	46,300
සාමාජික ගාස්තු -දේශීය		16,401		13,484
සාමාජික ගාස්තු -විදේශීය				3,000
කාර්යය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය		566,222	1,015,750	495,796
රක්ෂණ (මාර්ගස්ථ මුදල්)		14,867	15,073	14,366
සේවා ගිවිසුම්		891,600	1,092,825	401,026
මාරු ගිණුම්				3,192,826
		11,861,917	**12,707,820**	**13,203,376**
13. මෙහෙයුම් වියදම්				
ඇගයීම හා ලියාපදිංචිය	13.1	1,286,777	443,935	142,430
මූල්‍ය ප්‍රදාන	13.2	-	1,444,105	1,658,780
ප්‍රතිනත වැඩසටහන්	13.3	1,222,478	273,110	379,092
ජාතික වෘත්තීය සුදුසුකම් වැඩසටහන්	13.4	45,694,062	34,366,382	32,950,571
වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම් ක්‍රියාත්මක කිරීම	13.5	1,996,240	1,774,478	18,504
පලාත් වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම් සංවර්ධනය				321,946
ශ්‍රම වෙළඳපොළ ප්‍රකාශය වියදම්	13.6	2,194,614	3,043,365	2,274,710
තත්ත්ව කළමනාකරණ පද්ධති	13.7	5,217,125	4,200,139	
නිපුණතා සම්මත සංවර්ධනය		43,308	56,580	
පර්යේෂණ වියදම්		1,536,747	954,517	535,775
මූල්‍ය ප්‍රදාන නැවත ඇගයීම		96,815	414,020	473,045
පරිවර්ථන ගාස්තු		13,000	83,550	35,090
ප්‍රතිපත්ති ලියවිලි පිළියෙල කිරීම		171,644	267,222	752,445

	සටහන	2019 (රු.)	2018 (රු.)	2017 (රු.)
වාර්ෂික ක්ෂය		7,849,676	8,958,303	10,287,724
		67,322,485	**56,279,705**	**49,830,111**
14. ව්‍යාපෘති වියදම්				
කෙටිකාලීන වැඩසටහන් වියදම් (දේශීය)	14.1	2,785,474	147,000	12,573,088
නිපුණතා ආංශික සංවර්ධන	14.2	37,396,030	53,921,925	35,634,563
		40,181,505	**54,068,925**	**48,207,651**

15. දේපල පිරියත හා උපකරණ

පිරිවැය	**සටහන්**	**01.01.2019**	**මිලදී ගැනීම්**	**විකුණුම්**	**31.12.2019**
වාහන	15.1	68,451,256	-		68,451,256
ලීබඩු සහ සවිකිරීම්	15.2	6,367,841	262,584		6,630,425
පිරියත හා උපකරණ	15.3	7,265,058	210,350		7,475,408
කාර්යාල උපකරණ	15.4	10,753,976	235,551		10,989,527
පරිගණක හා උපාංග	15.5	29,391,064	4,930,229		34,321,293
පුස්තකාල පොත්	15.6	998,771	2,711		1,001,482
නාම පුවරු	15.7	519,290	-		519,290
මෘදුකාංග	15.8	7,784,979	-		7,784,979
		131,532,235	**5,641,424**		**137,173,659**
ක්ෂයවීම	**%**	**01.01.2019**	**වසර සඳහා**	**විකුණුම්**	**31.12.2019**
වාහන	25%	58,428,800	2,505,614		60,934,414
ලීබඩු සහ සවිකිරීම්	10%	3,502,456	299,088		3,801,544
පිරියත හා උපකරණ	25%	2,805,048	1,151,002		3,956,050
කාර්යාල උපකරණ	25%	6,558,616	1,068,880		7,627,496
පරිගණක හා උපාංග	33%	23,422,406	2,378,539		25,800,945
පුස්තකාල පොත්	25%	802,821	49,452		852,273
නාම පුවරු	25%	464,306	13,746		478,052
මෘදුකාංග	25%	6,251,556	383,356		6,634,912
		102,236,009	**7,849,676**		**110,085,685**
		29,296,226			**27,087,974.15**

	සටහන	2019 (රු.)	2018 (රු.)	2017 (රු.)
16. ණය ගැතියෝ				
මෙහෙයුම් ණය ගැතියෝ	16.1	304,695	304,695	304,695
සේවක ණය	16.2	13,097,210	8,359,443	8,918,649
		13,401,905	**8,664,138**	**9,223,344**
17. තැන්පත් සහ ලැබීම්				
කාර්ය මණ්ඩල අත්තිකාරම්	17.1	13,849,894	10,955,039	8,498,349
පිටස්තර පාර්ශවයන්ගෙන් අයවිය යුතු	17.2	10,275,692	2,887,219	
කාර්ය මණ්ඩලයෙන් අයවිය යුතු අගයන්		279,855	279,855	279,855
කලින් ගෙවීම්	17.3	36,856	36,856	11,556
අයවිය යුතු දුරකථන ගාස්තු			559,774	470,802
ජාතික වෘත්තීය සුදුසුකම් සහතික මුද්‍රණ වියදම්	17.4	1,963,768	716,733	716,733
අත්තිකාරම් ගෙවීම්(රාජ්‍ය අංශ)				
		26,406,065	**15,435,476**	**9,977,296**
18. අවසන් තොගය				
ඉතිරි තොගය - ශිෂ්‍ය වාර්ථා පොත්		262,500		836,452
ඉතිරි තොගය - ලිපි ද්‍රව්‍ය		543,219	345,666	624,505
ඉතිරි තොගය - සහතිකපත්		2,464,298	2,613,240	797,900
		3,270,017	**2,958,906**	**2,258,857**
19. මුදල් හා මුදල් සමකය				
මහජන බැංකුව - ගිණුම් අංකය - 078 - 1001 - 72266044		39,771,616	29,951,031	8,159,707
මහජන බැංකුව - ගිණුම් අංකය - 078 - 1001 - 12268324		424,004	2,978,140	4,208,448
මහජන බැංකුව - ගිණුම් අංකය - 078 - 1001 - 42266050		1,414,887	494,510	550,011
ඇමතුම් තැන්පත්			4,975,914	4,558,304
		41,610,507	**38,399,595**	**17,476,470**

	සටහන	2019 (රු.)	2018 (රු.)	2017 (රු.)
20. මෙහෙයුම් සංචිත				
ආරම්භක ශේෂය		37,136,079	14,799,749	299,124
ස්ථාවර තැන්පතු පොළී ගැලපුම			2,139,760	
අතිරික්ත/ඌණතාවයන් ගැලපුම්				-3,764,893
වර්ෂයට අදාල අතිරික්තය/ඌණතාවය		14,567,899	29,585,644	16,912,796
ආරම්භක ශේෂ ගැලපුම්			350	195,538
පෙර වර්ෂ ගැලපුම්		-1,488,286	(9,389,424)	1,157,183
		50,215,690	**37,136,079**	**14,799,749**
21. කල් දැමූ ආදායම				
ආරම්භක ශේෂය		29,296,226	34,567,929	34,880,154
ගැලපුම්				
සමුච්චිත ක්ෂයවීම් ගැලපුම			164,536	
		29,296,226	**34,732,465**	**34,880,154**
එකතු කරන්න: - දේපල, පැලෑටි සහ උපකරණ		3,639,873	1,943,990	9,975,499
ව්‍යාපෘතිය මගින් ලබා දෙන වත්කම්		2,001,551	1,578,074	
		34,937,650	38,254,529	44,855,653
අඩු: විස්ථාපිත ස්ථාවර වත්කම්වල ශුද්ධ වටිනාකම				
		34,937,650	38,254,529	44,855,653
අඩු: මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා මාරු කිරීම		7,849,676	8,958,303	-10,287,724
වසර අවසානයේ විලම්බිත ආදායම		27,087,974	29,296,226	34,567,929
22. ණයහිමියෝ				
මෙහෙයුම් ණය හිමියෝ	22.1	4,645,621	521,140	455,130

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ සටහන්

	සටහන	2019 (රු.)	2018 (රු.)	2017 (රු.)
23. ආපසු ගෙවිය යුතු තැන්පතු				
මහාභාණ්ඩාගාරය වෙත නැවත ගෙවීම්	23.1	539,140	1,805,160	1,587,308
ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවීම්	23.2	117,659	105,789	78,328
ගෙවිය යුතු ව්‍යාපෘති ප්‍රදාන	23.3	1,587,442	4,739,767	4,859,767
ගෙවිය යුතු පෞද්ගලික පඩිනඩි	23.4	1,030,396	1,618,562	20,683
ටෙන්ඩර් තැන්පතු		621,611	641,809	592,994
විගණන ගාස්තු		500,655	500,655	1,170,080
රදවාගත් තැන්පතු		656,124	954,372	563,491
තත්ත්ව කළමනාකරණ පද්ධති තැන්පතු		15,000	15,000	15,000
පර්යේෂණ වියදම්				
ගිණුම මාරුකිරීම		49,536	49,536	49,536
ගැලපීම් සඳහා මාරු කිරීම		1,600	20,965	
උපචිත වියදම්		379,594	221,120	662,575
චෙක්පත් අවලංගු කිරීම්			110,927	110,927
වෘත්තීය පුහුණු අධිකාරිය			84,594	84,595
ගෙවිය යුතු මූල්‍ය ප්‍රදාන				1,658,780
තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍ර සභාව		418,116		
		5,916,873	**10,868,256**	**9,795,284**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ උප සටහන්

	2019 (Rs)	2018 (Rs)	2017 (Rs)
2.1. කෙටිකාලීන වැඩසටහන් (දේශීය)			
කෙටිකාලීන වැඩසටහන් (දේශිය)		202,000	4,272,220
Touch Your Future වැඩසටහන	1,282,538	11,630	13,050,158
UNFPA	1,495,386		
	2,777,923	**213,630**	**17,322,378**
2.2. නිපුණතා ආංශික සංවර්ධන			
නිපුණතා ආංශික සංවර්ධන	37,396,030	53,921,925	39,195,571
	37,396,030	**53,921,925**	**39,195,571**
3.1 ආයතන ලියාපදිංචි ගාස්තු			
ආයතන ලියාපදිංචි ගාස්තු	2,796,300	1,932,400	1,536,147
ආයතන වර්ග කිරීමේ ගාස්තු			
ආයතන ලියාපදිංචි ප්‍රමාද ගාස්තු	77,200	6,400	14,900
	2,873,500	**1,938,800**	**1,551,047**
3.2 ආයතන ප්‍රතීතන ගාස්තු			
ආයතන ප්‍රතීතන ගාස්තු	2,594,000	2,098,400	1,410,000
	2,594,000	**2,098,400**	**1,410,000**
3.3 ජාතික වෘත්තීය සුදුසුකම් සහතික මුද්‍රණ ආදායම			
ජාතික වෘත්තීය සුදුසුකම් සහතික මුද්‍රණ ආදායම	3,318,555	1,914,675	967,240
ජාතික වෘත්තීය සුදුසුකම් සහතික නැවත මුද්‍රණ ආදායම	66,600	38,400	52,725
ජාතික වෘත්තීය සුදුසුකම් සහතික පිටපත් මුද්‍රණ ආදායම	44,375	40,125	57,950
ජාතික වෘත්තීය සුදුසුකම් සැසඳුම් ආදායම	4,715,500	5,334,200	252,687
ජාතික වෘත්තීය සුදුසුකම් සහතික මූලික මුද්‍රණ ආදායම			419,500
තත්ත්ව කළමනාකරණ පද්ධති ඇගයුම් ගාස්තු	890,000	3,340,000	
ජාතික වෘත්තීය සුදුසුකම් ඇගයුම් ගාස්තු		12,500	20,000
සහතික කිරීමේ ගාස්තුව - (NVQ නොවන)	1,227,000	1,063,750	
විභාග ගාස්තු	27,802,180	23,854,388	10,623,090
	38,064,210	**35,598,038**	**12,393,192**
3.4 ඇගයුම් නිළධාරීන් ලියාපදිංචි ගාස්තු			
ඇගයුම් නිළධාරීන් ලියාපදිංචි ගාස්තු	100,500	99,650	73,739
ඇගයුම් බලපත්‍ර ගාස්තු			
	100,500	**99,650**	**73,739**

	2019 (Rs)	2018 (Rs)	2017 (Rs)
3.5 ප්‍රකාශන විකිණීම			
ජාතික නිපුනතා සම්මත විකිණීම			
විෂය මාලා විකිණීම	742,025	654,500	477,475
වෘත්තීය පුහුණු සැලසුම් විකිණීම	900		1,000
වෘත්තීය පුහුණු මාර්ගෝපදේශන අත්පොත් විකිණීම		500	2,500
ශ්‍රම වෙළඳපොළ ප්‍රකාශන විකිණීම	450	2,700	1,350
තේමා ගීත සංයුක්ත තැටිය විකිණීම			
වෙනත් ප්‍රකාශන විකිණීම	5,100	181,050	379,175
	748,475	**838,750**	**861,500**
3.6 ශිෂ්‍ය වාර්ථා පොත් විකිණීම			
ශිෂ්‍ය වාර්ථා පොත් විකුණුම් ආදායම	4,348,050	2,401,650	3,028,080
ආරම්භක තොගය		836,452	614,842
ශිෂ්‍ය වාර්ථා පොත් මුද්‍රණ වියදම	3,813,423	1,416,984	1,988,010
ශිෂ්‍ය වාර්ථා පොත්විකුණුම් වියදම			
	3,813,423	2,253,436	2,602,852
අඩු කලා - ඉතිරි තොගය	262,500		836,452
ශිෂ්‍ය වාර්ථා පොත් විකුණුම් වලට අදාල මුලු වියදම	3,550,923	2,253,436	1,766,400
	797,127	**148,214**	**1,261,680**
9.1 මුද්‍රණ ලිපි ද්‍රව්‍ය			
ලිපි ද්‍රව්‍ය	2,073,338	2,383,128	2,108,750
මුද්‍රණ වියදම්	512,390	475,348	849,592
පුවත්පත් දැන්වීම්	1,824,228	1,108,938	1,581,696
	4,409,956	**3,967,414**	**4,540,038**
9.2 ඉන්ධන - ලිහිසි තෙල්			
අනුයුක්ත වාහන සඳහා ඉන්ධන - ලිහිසි තෙල්	2,164,407	1,615,668	836,944
සංචිත වාහන සඳහා ඉන්ධන - ලිහිසි තෙල්	774,698	730,375	552,393
කාර්යාල ප්‍රවාහන වාහන සඳහා ඉන්ධන - ලිහිසි තෙල්			
	2,939,105	**2,346,043**	**1,389,337**
10.3 වාහන නඩත්තුහා රක්ෂණ වියදම්			
වාහන නඩත්තු KE-0488	449,477	270,284	359,625
වාහන නඩත්තු KB-9869	312,469	237,372	235,200
වාහන නඩත්තු KF-6350	409,003	375,310	565,087
වාහන නඩත්තු KF-7354		19,183	59,410
වාහන නඩත්තු 18-1901	123,577	284,548	40,464
වාහන නඩත්තු PB-4729	586,251	401,030	275,118
වාහන නඩත්තු 57-7603	145,294	419,286	167,635
වාහන නඩත්තු PD-2405	335,733	481,122	293,713

	2019 (Rs)	2018 (Rs)	2017 (Rs)
වාහන නඩත්තු KR-7697	125,965	328,323	228,343
වාහන නඩත්තු KS-2350	223,594	296,174	275,463
වාහන නඩත්තු KS-2645	190,611	358,144	328,295
වාහන නඩත්තු NB-2942	668,306	523,244	512,714
වාහන නඩත්තු PE-0572	280,789	410,540	488,707
වාහන නඩත්තු NC -0021	458,609	379,052	485,860
වාහන නඩත්තු PF -6302	580,676	537,373	274,394
	4,890,352	**5,320,986**	**4,590,028**
13.1 ආයතන ලියාපදිංචි වියදම්			
ආයතන ලියාපදිංචි සහ ඇගයුම් වියදම	1,087,537	174,365	
ඉන්ධන වියදම්	33,100	2,000	9,180
ආයතන ලියාපදිංචි සහ ඇගයුම් වැඩසටහන් වියදම්	166,140	267,570	133,250
	1,286,777	**443,935**	**142,430**
13.2 මූල්‍ය ප්‍රදාන			
රාජ්‍ය අංශය සඳහා මූල්‍ය ප්‍රදාන			
පුද්ගලික අංශය සඳහා මූල්‍ය ප්‍රදාන		1,444,105	1,658,780
පීඩාවට පත් අය සඳහා මූල්‍ය ප්‍රදාන			
		1,444,105	**1,658,780**
13.3 ප්‍රතිතන වියදම්			
පාඨමාලා ඇගයුම් ගාස්තු	1,222,478	131,050	319,010
ඉන්ධන වියදම්			59,700
ප්‍රතිතන වැඩසටහන්		142,060	382
	1,222,478	**273,110**	**379,092**
13.4 ජාතික වෘත්තීය සුදුසුකම් වැඩසටහන්			
ජාතික වෘත්තීය සුදුසුකම් වැඩසටහන්		523,362	236,288
ජාතික වෘත්තීය සුදුසුකම් ඇගයුම් සහයන්			377,065
ඇගයුම් නිළධාරීන් ලියාපදිංචිය	171,480		
ප්‍රවර්ධන වැඩසටහන්	70,560	379,013	576,756
තත්ත්ව කළමණාකරණ පද්ධති/ඔස් 5 වැඩසටහන්	117,728	100,903	109,995
ජාතික වෘත්තීය සුදුසුකම් ඇගයුම් ගාස්තු	12,141,216	17,908,976	23,627,595
විභාග ගාස්තු	25,985,268	13,787,818	4,747,235
ජාතික වෘත්තීය සුදුසුකම් සහතික මුද්‍රණ වියදම්	4,231,951	277,810	2,417,712
ඇගයුම් බලපත්‍රගාස්තු	6,150	4,650	68,975
ඇගයුම් සහ ඇගයුම් ක්‍රියාත්මක කිරීම	2,087,978	1,378,069	562,300
ජාතික වෘත්තීය සුදුසුකම් මාර්ගගත පද්ධතිය	388,671		
ඇගයුම් විගණනය	49,950	5,782	226,650

	2019 (Rs)	2018 (Rs)	2017 (Rs)
ඇගයුම් නිළධාරීන් ලියාපදිංචිය	443,110		
	45,694,062	**34,366,382**	**32,950,571**
13.5 වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම් පිළියෙල කිරීම			
වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම් (නව)	8,000	1,230,478	18,504
වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම් (යාවත්කාලීන)	1,988,240	544,000	
	1,996,240	**1,774,478**	**18,504**
13.6 ශ්‍රම වෙළඳපොළ ප්‍රකාශය වියදම්			
ශ්‍රම වෙළඳපොළ ප්‍රකාශය /ප්‍රවෘත්ති ලිපි වියදම්	474,890	721,615	460,954
ශ්‍රම වෙළඳපොළ ප්‍රකාශ දත්ත සැකසුම්	601,869	1,106,917	493,912
වෘත්තීය පුහුණු මාර්ගෝපදේශය	736,835	972,413	509,716
ශ්‍රම වෙළඳපොළ ප්‍රකාශය/ප්‍රවෘත්ති ලිපි තැපැල් වියදම්	183,120	241,080	136,720
යුනිවොක් වියදම්	197,900	1,340	673,408
ශ්‍රම වෙළඳපොළ සමීක්ෂණය			
	2,194,614	**3,043,365**	**2,274,710**
13.7 ජාත්‍යන්තර කම්කරු සංවිධාන වියදම් වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම් ක්‍රියාත්මක කිරීම			
සංවර්ධනය හා අධීක්ෂණය	1,313,796	435,185	
වෘත්තීය මාර්ගෝපදේශ ශක්තිමත් කිරීම	2,563,554	2,143,151	
වෘත්තීය මාර්ගෝපදේශ නියාමනය කිරීම	217,392	623,785	
මෙහෙයුම් කමිටුව පැවැත්වීම	23,028	50,756	
ප්‍රචර්ධන වැඩසටහන්	823,084	947,263	
රැකියා ස්ථානගත කිරීම	276,270		
	5,217,125	**4,200,139**	
14.1 කෙටිකාලීන වැඩසටහන් (දේශීය / විදේශීය)			
Touch Your Future වැඩසටහන	1,283,472		10,009,839
UNFPA වැඩසටහන	1,502,002		
ඇෆ්ගන් වැඩසටහන		147,000	
UNIVOC වැඩසටහන			2,563,249
	2,785,474	**147,000**	**12,573,088**
14.2 නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය			
ආයතන ප්‍රතිනය	1,802,650	1,344,859	136,850
විෂයමාලා පිළියෙල කිරීම	10,269,473	2,462,794	2,368,998
තත්ත්ව කළමණාකරණ පද්ධති	870,037	2,064,212	3,993,950
අනිකුත්		250	1,897,649
නිපුණතා වාර්ථා වියදම්	878,004	616,480	1,254,155

	2019 (Rs)	2018 (Rs)	2017 (Rs)
දීමනා	1,841,104	1,868,412	1,182,489
සේවක පුහුණුව හා සංවර්ධනය		1,113,921	3,588,429
පුහුණු ආයතන ලියාපදිංචිය	891,643	1,200,680	323,450
ඇගයුම් ගාස්තු	4,776,100	25,095,899	16,340
මෘදු නිපුණතා	1,419,560	277,991	42,450
ගොඩනැගිලි සංවර්ධනය		3,275,326	8,454,616
NVQ විභාග වියදම්		155,129	
පර්යේෂණ වියදම්	1,780,745	1,226,430	726,015
ක්ෂේත්‍ර සභා	9,600,728	10,621,592	11,641,174
නිපුණතා පරතරය විශ්ලේෂණය	690,736	693,420	
සේවක පුහුණු දීමනා	1,475,238	1,582,800	
මෘදු නිපුණතා / ඉංග්‍රීසි වැඩසටහන		321,730	8,000
තත්ත්ව සම්මානය	1,100,012		
	37,396,030	**53,921,925**	**35,634,563**
16.1 මෙහෙයුම් ණය ගැතියෝ			
සකුරා පරිගණක ආයතනය	167,895	167,895	167,895
අනිකුත් ණය ගැතියන්	136,800	136,800	136,800
	304,695	**304,695**	**304,695**
16.2 කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්			
කොමිෂන් සභා ණය	2,217,302	708,544	1,012,319
ආපදා ණය	10,573,880	7,357,304	6,731,598
සුනාමි ණය	39,000	39,000	39,000
උත්සව අත්තිකාරම්	67,300	62,300	694,800
විශේෂ අත්තිකාරම්	103,122	19,122	67,522
ලැබිය යුතු විශේෂ අත්තිකාරම් පොළිය	3,359		
සුනාමි විශේෂ ණය (II)	93,247	173,173	373,410
	13,097,210	**8,359,443**	**8,918,649**
17.1 අත්තිකාරම්			
සේවක අත්තිකාරම්	5,319,048	3,077,593	2,340,132
ව්‍යාපෘති අත්තිකාරම්- තොරතුරු සන්නිවේදන		1,276,756	1,395,342
ව්‍යාපෘති අත්තිකාරම්- නිෂ්පාදන හා ඉංජිනේරු	4,831,430	4,455,933	4,491,870
ව්‍යාපෘති අත්තිකාරම්- ඉදිකිරීම්	3,235,393	1,246,507	270,980
ව්‍යාපෘති අත්තිකාරම්- සංචාරක	464,023	898,251	25
	13,849,894	**10,955,039**	**8,498,349**

	2019 (Rs)	2018 (Rs)	2017 (Rs)
17.2 පිටස්තර පාර්ෂවයන්ගෙන් ලැබිය යුතු			
නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය	10,275,692	2,887,219	
	10,275,692	**2,887,219**	
17.3 කලින් ගෙවීම්			
කලින් ගෙවීම් - මාර්ගස්ථ මුදල් රක්ෂණ වාරික	11,556	11,556	11,556
සේවා ගිවිසුම්	25,300	25,300	
	36,856	**36,856**	**11,556**
17.4 ලැබිය යුතු ජාතික වෘත්තීය සුදුසුකම් සහතික මුද්‍රණ වියදම්			
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ ආයතනය		78,931	78,931
වෘත්තීය පුහුණු අධිකාරිය	1,272,866		
ජාතික තරුණ සේවා සභාව		16,800	16,800
කාර්මික අධ්‍යාපන පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව	254,988	254,988	254,988
ජර්මානු කාර්මික අධ්‍යාපන ආයතනය	74,750	74,750	74,750
මිනින්දෝරු දෙපාර්තමේන්තුව	69,900		
රාජ්‍ය නොවන සංවිධාන /පුද්ගලික හා රාජ්‍ය ආයතන	291,264	291,264	291,264
	1,963,768	**716,733**	**716,733**
22.1 මෙහෙයුම් ණය හිමියෝ			
මෙහෙයුම් ණය හිමියෝ	2,082,380	29,214	455,130
සේවක	1,417,876	361,730	
අනිකුත්	1,145,365	130,196	
	4,645,621	**521,140**	**455,130**
23.1 මහාභාණ්ඩාගාරය වෙත ගෙවීම්			
රාජ්‍ය භාග ගෙවීම්	539,140	1,805,160	1,587,308
වැටුප් රහිත අයකරගැනීම්			
	539,140	**1,805,160**	**1,587,308**
23.2 ආදායම් බදු දෙපාර්තාමේන්තුවට ගෙවීම්			
රඳවා ගැනීම් බදු	59,511	59,511	43,700
මුද්දර බදු	58,148	46,278	34,628
වැටුප් මත බදු			
	117,659	**105,789**	**78,328**

	2019 (Rs)	2018 (Rs)	2017 (Rs)
23.3 ගෙවිය යුතු ව්‍යාපෘති ලැබීම්			
රුහුණු ආර්ථික සංවර්ධන අධිකාරිය		48,923	48,923
ජාත්‍යන්තර කම්කරු සංවිධානය		3,103,402	3,103,402
කෙටිකාලීන වැඩසටහන් (දේශීය / විදේශීය)	1,583,950	1,583,950	1,703,950
කා.අ.සං.ව්‍යාපෘතිය	3,492	3,492	3,492
යෞවන කටයුතු අමාත්‍යාංශය			
	1,587,442	**4,739,767**	**4,859,767**
23.4 ගෙවිය යුතු පෞද්ගලික පඩි නඩි			
අතිකාල සහ නිවාඩු දින දීමනා			20,683
සේවක භාරකාර අරමුදල	1,589,120	9,566	
වැටුප්	9,759		
සේවක අර්ථසාධක අරමුදල	887,159	1,608,995	
	1,030,396	**1,618,562**	**20,683**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශ උප ලේඛන

උප ලේඛන 01 - පාරිතෝෂික වෙන්කිරීම්

නම	සේවක අංකය	පත්වීමේ දිනය	වසර ගණන	වැටුප (රු)	පාරිතෝෂික ප්‍රතිපාදන (රු)
ඩබ්. පී. එස්. ඒ. කීර්ති	5	2001.02.01	18	42,010.00	378,090
එන්. ඩබ්. පී. එන්. පීවන්ත	6	2001.02.01	18	48,016.00	432,144
කේ. සිරිසේන	9	2001.02.05	18	37,956.00	341,604
ආර්. එන්. පී. සිල්වා	10	2001.03.01	18	42,010.00	378,090
ඩී. බී. ආර්. මංජුලා	11	2001.03.01	18	47,339.00	426,051
වයි. පී. එස්. උදයකාන්ති	12	2001.02.01	18	45,985.00	413,865
එම්. එන්. අසංක රංගන	15	2001.09.03	18	35,722.00	321,498
පී. කේ. හෑගොඩආරච්චි	20	2001.11.01	18	42,548.00	382,932
එම්. එල්. එන්. එස්. එදිරිසුරිය	22	2001.11.02	18	79,887.00	718,983
එච්. බී. ඉන්දික සම්පත්	24	2001.11.16	18	48,016.00	432,144
පී. එස්. අමරසේකර	25	2001.11.15	18	37,068.00	333,612
බී. කේ. එස්. දිනේෂ්	26	2001.11.16	18	37,068.00	333,612
පී. පී. අජිත් කුසුම්	28	2001.12.03	18	79,887.00	718,983
ඩබ්. එන්. ටී. අනුර වීරකෝන්	31	2002.07.01	17	81,600.00	693,600
එස්. විජේසේකර	40	2005.04.20	14	35,938.00	251,566
ඩබ්. වී. පී. සී. ජගත් කුමාර	41	2005.05.16	13	33,544.00	218,036
වපිර පෙරේරා	43	2005.06.15	14	106,210.00	743,470
ටී. සෙන්තුරන්	46	2005.01.04	14	71,322.00	499,254
පී. එම්. සී. පී. ගුණතිලක	47	2005.01.18	14	62,908.00	440,356
ඩබ්. කේ. ඩී. හරිස්චන්ද්‍ර	48	2005.01.03	14	71,322.00	499,254
පී. ඒ. එම්. යූ. ගනේපොළ	49	2005.01.02	14	81,778.00	572,446
යූ. ඒ. පී. ධර්මසේන	51	2005.01.03	14	57,934.00	405,538
එම්. ඩී. චාමලී ද සිල්වා	56	2005.10.06	14	39,320.00	275,240
ආර්. ජේ. සමරවීර	57	2005.11.21	14	74,748.00	523,236
පී. බන්දුල	58	006.02.20	13	35,938.00	233,597
ඒ. එස්. අමරසිංහ	60	2006.05.16	13	86,739.00	563,804
පී. පී. එස්. කුමාර	62	2006.07.14	13	34,162.00	222,053
එස්. යූ. කේ රුබසිංහ	65	2007.02.02	12	89,922.00	539,532
එම්. විද්‍යානපතිරණ	66	2007.02.02	12	73,035.00	438,210
ජේ. ඒ. ඩී. ජේ. ජයලත්	68	2007.08.01	12	106,876.00	641,256
පී. පී. පී. නානායක්කාර	70	2007.10.15	12	73,035.00	438,210
ඩබ්. ඒ. ඩබ්. සී. ප්‍රේමරත්න	71	2007.11.01	12	83,814.00	502,884
පහළට ගෙන යන ශේෂය					**14,313,150**

නම	සේවක අංකය	පත්වීමේ දිනය	වසර ගණන	වැටුප (රු)	පාරිතෝෂික ප්‍රතිපාදන (රු)
ඉදිරියට ගෙන ආ ශේෂය					**14,313,150**
ඩබ්. ජේ. එල්. ඒ. දමයන්ති	72	2007.12.12	12	71,322.00	427,932
සද්ධා මංගල	73	2008.02.01	11	35,400.00	194,700
ආර්. ජී. ඒ. ටී. කුමාර	74	2008.11.03	11	37,392.00	205,656
එන්. ඩී. විජේසේකර	75	2008.11.03	11	37,392.00	205,656
එස්. එස්. කල්පගේ	76	2008.11.03	11	33,625.00	184,938
පී. සී. ජේ. ද සිල්වා	78	2009.09.01	10	36,680.00	183,400
කේ. ටී. අමරසිංහ	80	2009.11.30	10	39,230.00	196,150
කේ එස් සමීර	84	2011.08.01	8	33,302.00	133,208
ජී. සී. එස්. එම්. නානායක්කාර	85	2011.08.01	8	33,302.00	133,208
බී. එස්. ජේ. විපුල්සි	86	2012.01.02	8	57,934.00	231,736
එච්. එම්. ඒ. ඩී. කේ. හේරත්	87	2012.01.02	8	61,661.00	246,644
ඩී. එන්. අයි. ඩී. ද සිල්වා	90	2012.01.02	8	59,167.00	236,668
චන්දි මේනකා	91	2012.03.01	7	34,701.00	121,454
ඒ. පී. ඉන්ද්‍රානි	92	2012.03.01	7	31,554.00	110,439
අයි. ජී. කල්ප උදාර	93	2012.07.10	7	55,468.00	194,138
පී. මුතුකුමාරණ	94	2012.11.03	7	47,339.00	165,687
පී. ජී. එස්. චතුරංගනී	99	2013.06.06	6	34,432.00	103,296
කේ. ඩී. එල්. පී. කරුනාදාස	101	2013.07.15	6	59,167.00	177,501
ටී. එල්. ඩබ්. මධුෂානි	103	2013.07.15	6	37,478.00	112,434
කේ. ඩබ්. ඒ. අනුරුද්ධිකා	104	2013.07.15	6	36,584.00	109,752
එන්. එල්. එස්. දයාරත්න	105	2013.09.02	6	31,330.00	93,990
බී. ජී. එන්. කමල්ප්‍රිය	106	2013.09.10	6	32,818.00	98,454
උඩවත්ත සී.ජේ.	107	2014.01.16	5	55,427.00	138,568
මදන් ආර්.	110	2014.01.27	5	61,661.00	154,153
ද. සිල්වා ඊ. ඒ. කේ.	112	2014.02.10	5	65,402.00	163,505
සමරවික්‍රම සී. සී. කේ.	116	2014.08.01	5	38,276.00	95,690
හදපාන්ගොඩ බී. සී.	117	2014.09.15	5	57,934.00	144,835
කුමාර එච්. එල්. කේ. එස්.	118	2014.09.22	5	32,576.00	81,440
කාරියවසම් පී. ඩී. එස්.	119	2014.10.01	5	69,143.00	172,858
ඒ. එච්. එන්. සඳමාලි	122	2015.06.03	4	37,877.00	75,754
එච්. ඒ. ඩී. දර්ශිකා	123	2015.06.04	4	38,276.00	76,552
එල්. කේ. කොහොම්බන්	125	2015.06.06	4	36,680.00	73,360
එන්. එච්. එස්. දර්ශන	126	2015.06.07	4	36,680.00	73,360
එස්. බී. කරුණානායක	128	2015.06.08	4	36,680.00	73,360
බී. එල්. කේ .පී. සංදීපනි	129	2015.06.09	4	33,894.00	67,788
අයි. එම්. පී. එච්. ලක්මාල්	131	2015.07.08	4	30,658.00	61,316
එච්. එම්. වී. එන්. හේරත්	132	2015.07.22	4	35,239.00	70,478
පහළට ගෙන යන ශේෂය					**19,703,208**

නම	සේවක අංකය	පත්වීමේ දිනය	වසර ගණන	වැටුප (රු)	පාරිතෝෂික ප්‍රතිපාදන (රු)
ඉදිරියට ගෙන ආ ශේෂය					**19,703,208**
සුජානි දිල්හාරා	134	2017.08.29	2	35,508.00	35,508
පී. ඩබ්. එස්. භාෂිනි	136	2016.09.01	3	57,934.00	86,901
එන්. රාජපක්ස	137	2016.09.01	3	55,468.00	83,202
ඩබ්. පී. එස්. කුමාර	138	2016.10.03	3	57,934.00	86,901
ඒ. සී. යූ. ගුණතුංග	139	2016.09.01	3	57,934.00	86,901
ඩබ්. එම්. ඩබ්. බී. විජේසිංහ	140	2016.09.01	3	57,934.00	86,901
කේ. එම්. ඩී. එච්. ලක්මිණි	141	2016.09.01	3	57,934.00	86,901
ජයමිණී මධුෂා	145	2017.05.22	2	30,434.00	30,434
ඒ. ඩබ්ලිව්. විජයංග	148	2017.05.22	2	33,356.00	33,356
ඩී. ඩබ්. ඉෂානි	149	2017.05.22	2	33,356.00	33,356
රවිඳු රන්දික කුමාර	151	2017.08.25	2	30,434.00	30,434
වී. එන්. රම්මාවඩු	152	2017.08.25	2	35,508.00	35,508
නුවංගි කන්කානමගේ	155	2018.04.02	1	37,079.00	18,540
පී.වී.අයි. පියුමාලි	156	2018.04.02	1	37,079.00	18,540
ආර්.එස්. ප්‍රනාන්දු	159	2018.04.02	1	56,701.00	28,351
ඒ.එස්. කල්පගේ	162	2018.04.02	1	55,468.00	27,734
පී.එල්. මාසකෝරාල	163	2018.04.02	1	56,701.00	28,351
පී.එල්.අයි.ඒ. ද සොයිසා	164	2018.04.02	1	37,039.00	18,520
පී.ඒ.පී.කේ. පනංගල	167	2018.07.02	1	45,985.00	22,993
					20,582,534

★ **වැටුප = දෙසැම්බර් මස මූලික වැටුප + ජීවන වියදම් දීමනාව**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } වීවිවයි/ඊ/ටීවීඊසී/1/19/28

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2020 අගෝස්තු 10 දින

Chairman, Director General, Deputy Director General
11 AUG 2020
TVEC

අධ්‍යක්ෂ ජනරාල්

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් :-
01. ලේකම්- නිපුණතා සංවර්ධන, රැකී රක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය
02. ලේකම්- මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

අංක 306/72, පොළුදුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } වීටීවයි/ඊ/ටීවීඊසි/1/19/28 මබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2020 අගෝස්තු 10 දින

අධ්‍යක්ෂ ජනරාල්
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 48 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත මඟින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර ආදායම් හා වියදම් හිලව් නොකල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී තිබුණු රු. 456,000 ක මුදල ආදායම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට එම ව්‍යාපෘති වියදමෙන් හිලව් කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 13 ඡේදය පරිදි දේපල පිරියත උපකරණ යටතේ ප්‍රාග්ධන කලයුතු එකතුව රු. 197,097 ක් මෝටර් රථ හා ගොඩනැගිලි නඩත්තු වියදම් ලෙස වර්ෂයේ ලාභයට එරෙහිව කපා හැර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 47 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණවල සාධාරණ අගය වෙනස්වීම මත ප්‍රත්‍යාගණනයන් සිදුකල යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශුද්ධ අගය රු. 27,087,974 ක වත්කම් සම්බන්ධයෙන් 2008 වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 70,494,799 ක් වූ වත්කම් සඳහා භුදනා ගෙන ඇති ඵලදායී ජීවිතකාලය අවසන් වී ඇතත් තවදුරටත් එම වත්කම් භාවිතා කරමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 අනුව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 හි 34 ඡේදය ප්‍රකාරව වාහන අනතුරක් සම්බන්ධයෙන් බාහිර පාර්ශවයක් විසින් රු.1,200,000 ක වන්දියක් ඉල්ලා නඩු පවරා තිබුණද ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාලව එකතුව රු. 2,783,258 ක් වූ ගෙවියයුතු විවිධ වියදම් මුද්‍රණ වියදම් හා ආංශික වියදම් හා රු. 840,727 ක් වූ ලැබියයුතු සහතික පත්‍ර ආදායම් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(උ) 2018 වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබුණු එකතු රු. 2,501,102 ක් වූ ඇගයීම් ගාස්තු, වැටුප් හා අතිකාල දීමනා එම වර්ෂයේ ලාභයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(උ) 2019 දෙසැම්බර් මාසයේ බැංකු සැසඳුම අනුව රු. 1,463,907 ක්වූ වර්ෂය තුල සෘජු බැරකිරීම් හා රු. 1,002,905 ක් වූ ස්ථාවර නියෝග මත ගෙවීම් ඇතුළු සෘජු හර කිරීම් හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා වියදම් එම ප්‍රමාණයන්ගෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අත්තිකාරම් ශේෂය තුල 2017 වර්ෂයේ සිට ඉදිරියට එන රු. 1,879,170 ක් වූ ශේෂය සඳහා විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොකෙරුණි.

(ඒ) බැංකු සැසඳුම් ප්‍රකාශනවල ඇතුලත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකල කල් ඉකුත් වූ රු. 323,028 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව ණයහිමියන් ඇති කිරීමේදි ණයහිමි ගිණුම බැර කිරීම වෙනුවට දෝෂ සහගත ලෙස ණයහිමි ගිණුමට හර කිරීම නිසා එම ගිණුම රු.646,056 ක් අඩුවෙන් දක්වා තිබු ණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව පවත්වා ගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව බව.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සමාජිකයෙකුට කොමිෂන් සභාවට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	**විස්තරය**
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(අ) මුදල් රෙගුලාසි 103 (1), 104 (3) හා 104 (4) වගන්ති	කොමිෂන් සභාවට අයත් වාහනයකට 2016 අගෝස්තු 25 දින සිදු වූ අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ආ) මුදල් රෙගුලාසි 395 (ඇ)	සෑම බැංකු ගිණුමක් සඳහාම එක් එක් මාසය අවසානයේදී පැවති තත්ත්වය පිළිබඳ ඊ ළඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කල යුතු වුවත්, කොමිෂන් සභාවේ ප්‍රධාන ජංගම ගිණුමට අදාලව 2019 දෙසැම්බර් මාසයේ සිට 2020 පෙබරවාරි මාසය දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශන 2020 ජුනි 15 දින දක්වාම පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 188 (2)	බැංකුවේ තැන්පත් කල නමුත් උපලබ්ධි වී නොමැති මාස 06 සිට මාස 24 ක් ගත වී ඇති එකතුව රු. 3,209,720 ක්වූ චෙක්පත් 309 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඇ) මුදල් රෙගුලාසි 396	නිකුත් කර ඇතත් වලංගු කාලය අවසන් වී ඇති එකතුව රු. 6,497,642 ක් වූ චෙක්පත් 517ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඉ) මුදල් රෙගුලාසි 371 (2) (ඇ) ඡේදය හා 2015 ජූලි 14 දිනැති අංක 3/ 2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	(i) තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම මාණ්ඩලික නිලධාරියෙකු වෙත පමණක් සිදුකල යුතු වුවත් කොමිෂන් සභාව විසින් ඊට පටහැනි ලෙස අවස්ථා 110 කදී මාණ්ඩලික නිලධාරීන් නොවන නිලධාරීන් 28 දෙනෙකු වෙත එකතුව රු. 3,097,597 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.
	(ii) කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා පමණක් තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කල හැකි වුවත් ඊට පටහැනිව භාණ්ඩාගාර අනුමැතියකින් තොරව අවස්ථා 45 කදී නිලධාරීන් 30 දෙනෙකු වෙත රු. 102,000 ක සිට රු. 3,894,302 ක් දක්වා පරාසය තුල තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණි.
	(iii) තත්කාර්ය අතුරු අග්‍රිම ලෙස ලබා ගන්නා මුදල් අදාල කාර්යය නිමකල වහාම පියවිය යුතු වුවත් අත්තිකාරම් ලබාගෙන වසරකට වැඩි කාලයක් ගතවී ඇතත් 2020 ජුනි 30 දින දක්වාම පියවා නොතිබුණු රු.2,760,082ක හර ශේෂ හා රු. 593,236 ක බැර අත්තිකාරම් ශේෂ පැවතුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර කොමිෂන් සභාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල , කර්තව්‍ය සහ කාර්යයන්	නිරීක්ෂණ
1990 අංක 20 දරන පනතේ 2 වගන්තිය අනුව ආර්ථිකයේ මිනිස් සම්පත් අවශ්‍යතාවලට සරිලන අයුරින් සියළුම මට්ටම්වල තෘතීයික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමය සැලසුම් කිරීම සම්බන්ධීකරණය සහ සංවර්ධනය කිරීම කොමිෂන් සභාවේ පොදු පරමාර්ථයක් විය.	කොමිෂන් සභාව විසින් පුහුණු සැලසුම් (VET Plan) සකස් කර අදාල වෘත්තීය පුහුණු ආයතන වෙත ලබාදී තිබුණද ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් සිදුකර ක්‍රියාත්මක කල යුතු නිර්දේශ අදාල වෘත්තිය පුහුණු ආයතන වෙත ලබාදී නොතිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

03. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) කොමිෂන් සභාවේ අවසන් ඇගයීම් ක්‍රියාවලි (Procedure) අනුව තක්සේරු කරුවන් විසින් අවසන් ඇගයීම් පවත්වන දින සිට සති 2 ක් ඇතුළත ඇගයීම් ප්‍රතිඵල තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඇගයීම් පවත්වා මාස 03 කට වැඩි කාලයකට පසුව එම ප්‍රතිඵල කොමිෂන් සභාවට ඉදිරිපත් කර තිබූ බවට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පරීක්ෂණ හා ඇගයීම් අංශයෙන් ලබාගත් තොරතුරු අනුව නිරීක්ෂණය විය.

(ආ) 2018 වර්ෂයට අදාල පුහුණු මධ්‍යස්ථාන 13 ක පවත්වා ගෙන ගිය සංචාරක හෝටල් ක්ෂේත්‍රයට අදාල පුහුණු පාඨමාලා 28 ක ආධුනිකයන්ගේ ඇගයීම් සිදු කර නොතිබුණු බව විගණන දිනය වූ 2019 දෙසැම්බර් 03 දින සිදුකල පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඇ) ජාතික නිපුණතා සම්මත සකස් කිරීම සඳහා තෘතීයික වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ පිහිටුවන ලද සංචාරක කාර්මාන්ත ආංශික නිපුණතා සභාව සඳහා 2018 වර්ෂය තුල ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් රු. 2,034,886 ක් වියදම් කර තිබුණද අරක්කැමි හා බේකරි පාඨමාලාවන් සඳහා ජාතික නිපුණතා සම්මතයන් යාවත්කාලීන කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

2020.10.22 TVEC/E2/Audit 2019

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

ඔබගේ අංක ටීටීවයි/ඒ/ටීවීඒසී/1/19/28 හා 2020.08.10 දිනැති උක්ත විගණන වාර්තාව සඳහා පිළිතුරු මේ සමඟ ඉදිරිපත් කරමි.

1.2

(අ) ආදායම හා වියදම් එකිනෙකට හිලව් නොකොට වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කිරීමට පියවර ගනිමි.

(ආ) කාර්යාල පරිශ්‍රයෙහි ගොඩනැගිල්ල අයිති වන්නේ අමාත්‍යාංශයට වන බැවින් ගොඩනැගිලි සඳහා කරනු ලබන වැඩි දියුණු කිරීම් ගොඩනැගිලි පුරුත්ථාපන වියදම් යටතේ ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම්ගත කරනු ලබයි. විගණනයෙන් පෙන්වා ඇති පරිදි වාහන සඳහා උපාංග සවිකිරීම් මඟින් එහි ආයුකාලය වැඩිවීම සඳහා අදාළ වේ නම් වාහන ගිණුම යටතේ ගිණුම්ගත කිරීමට පියවර ගනිමි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 47 වන ඡේදය අනුව දේපළ පිරියත හා උපකරණවල අගය වෙනස් වීම මත ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් ප්‍රථමයෙන් 2018 වසරේ වත්කම් සත්‍යාපනය මඟින් හඳුනාගත් භාවිතයට ගත නොහැකි වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කොට ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කරන ලදී. ඒ අනුව මෙම වසරේදී ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට පියවර ගනිමි.

(ඈ) මෙහිදී ආයතනයේ ක්ෂය කිරීම් සඳහා යොදා ගනු ලබන්නේ හීනවන ශේෂ ක්‍රමය බැවින් යම් කිසි වත්කමක් දිගුකාලයක් පුරා ක්ෂය වේ. ඒ අනුව සම්පූර්ණයෙන් ක්ෂය කර නිමවූ වත්කම් නොමැති බව සඳහන් කරමි.

(ඉ) මෙම නඩුව විභාගයට දින නියම කිරීමක් මෙතෙක් සිදුකර නොමැති අතර පියවර මට්ටමේ පවතී. තවද පළවන විත්තිකරු වෙත සිතාසි ලබාදීමක්ද මෙතෙක් සිදුව නොමැති බැවින් ඒ සඳහා මූල්‍ය ප්‍රකාශයන්හි ප්‍රතිපාදන වෙනස් කිරීමක් සිදු නොකළ අතර මෙය අසම්භාව්‍ය වත්කමක් ලෙස හෙලිදරව් කිරීමට පියවර ගනිමි.

(ඊ) 2019 වසරේ ගිණුම්වලින් අත්හැරී තිබූ 2020 වසර වියදම් ලෙස ගිණුම්ගත කර ඇති රු.912,943.00 ක් වූ විවිධ ගිණුම් අගය පෙර වර්ෂ ගැලපුම් ගිණුමට මාරු කිරීමට පියවර ගනිමි. තවද රජයේ මුද්‍රණාලය වෙත ගෙවිය යුතු වූ රු.1,322,569.00 අදාළව වවුචර්පත් ඉදිරිපත් වී ඇත්තේ 2020.06.30 බැවින් එය පෙර වර්ෂ ගැලපුම් ගිණුම යටතේ 2020 වසරට අදාළව ගිණුම්ගත කළ බව සඳහන් කරමි.

කොමිෂන් සභාව උපචිත පදනම මත ගිණුම් පිළියෙළ කළද නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය ගිණුම් සටහන් තබනුයේ මුදල් පදනම යටතේ වන බැවින් යම් කිසි වර්ෂයක අවසාන දිනය තෙක් දරණ ලද වියදම් පමනක් අදාළ වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කරනු ලබයි. ඒ අනුව විගණනයෙන් දක්වා ඇති පරිදි වර්තමාන වර්ෂයේදී ගෙවා ඇති රු.547,746.00 අගය පෙර වර්ෂ ගැලපුම් ගිණුමට මාරු කිරීමට පියවර ගනිමි.

ලැබිය යුතු සහතික පත්‍ර ආදායමද සහතික අංශයේ ගොනු පරීක්ෂා කර බලා ගිණුම් ගත කළ අතර, විගණනයෙන් පෙන්වා ඇති වෙනස පරීක්ෂා කර බලා ගිණුම් සටහන් යෙදීමට පියවර ගනිමි.

(උ) ඇගයුම් ගාස්තු ගෙවීම එක් එක් වර්ෂයට අදාළ ප්‍රතිපාදනවලට යටත්ව සිදු කෙරෙන බැවින් පෙර වර්ෂයේදී ඉතිරිව ඇති වවුචර්පත් සඳහා 2020 වසරේදී ගෙවීම් කරනු ලබයි. එම හේතුව මත එය ප්‍රවර්ථන වර්ෂයට අදාළ ලෙස ගිණුම්ගත කළද එය පෙර වර්ෂ ගැලපුම් ගිණුමට මාරුකිරීමට පියවර ගනිමි. තවද පෙර වර්ෂ වෙනුවෙන් ගෙවනු ලැබූ වැටුප් වර්ධක වල අදාළ හිඟ වැටුප් වේතන හා අතිකාල දීමනාද පෙර වර්ෂ ගිණුමට ගැලපුම් කිරීමට කටයුතු කරමි.

(ඌ) 2019 වර්ෂයේ බැංකු සැසඳුම් වාර්තා පිළියෙළ කිරීමේ දිගු ප්‍රමාදයක් සිදු වී තිබුණි. මෙම සෘජු බැරකිරීම හඳුනා ගත්තේ එම වර්ෂය සඳහා බැංකු සැසඳුම් සැකසීමේදීය. එම නිසා මෙම ගිණුම් ගත නොකළ සෘජු බැර කිරීම් හඳුනාගන්නා විට 2019 වර්ෂය සඳහා ගිණුම් ප්‍රකාශන පිළියෙළ කර අවසන් වී තිබූ නිසා එම ගිණුම් ගත නොකළ සෘජු බැරකිරීම් 2020 වර්ෂයේ ඒ සඳහා ගැලපීම සිදුකර ඇත.

2019 වර්ෂයේ බැංකු සැසඳුම් වාර්තා පිළියෙළ කිරීමේදී දිගු ප්‍රමාදයක් සිදු වී තිබුණි. මෙම සෘජු හර කිරීම හඳුනාගත්තේ එම වර්ෂය සඳහා බැංකු සැසඳුම් සැකසීමේදීය. මෙම ගිණුම් ගත නොකළ සෘජු හර කිරීම් හඳුනාගන්නා විට 2019 වර්ෂය සඳහා ගිණුම් ප්‍රකාශන පිළියෙළ කර අවසන් වී තිබූ නිසා එම ගිණුම් ගත නොකළ සෘජු හරකිරීම් 2020 වර්ෂයේ ඒ සඳහා ගැළපීම සිදු කර ඇත.

(එ) අත්තිකාරම් ගිණුමෙහි ඇති රු. 1,879,170.00ක් වූ අත්තිකාරම් වටිනාකමට අදාළ උපලේඛන විගණනයට ඉදිරිපත් කිරීමට පියවර ගනිමි.

(ඒ) රු.323,028.00 යන 2016,2017 වර්ෂවලට අදාළ වියදම් සමූහයක එකතුව ගිණුම් ගත විය යුත්තේ ජංගම ගිණුම් PB - 044 ට වුවත් වැරදීමකින් මෙම වියදම් PB - 324 යන ගිණුමෙහි ගිණුම් ගතකර තිබුණි. මෙම වරද නිවැරදි කිරීම සිදු කළේ PB - 044 බැංකු සැසඳුම් පිළියෙළ කළ විටයි. මේ වන විට PB - 324 ජංගම ගිණුමේ සටහන් ව තිබූ උක්ත වියදම 2019.09.03 වන දින (චෙක්පත් වල මාස 06 ඉකුත් වී ඇති නිසා) ණයහිමියන්ගේ ගිණුමට බැර කරන ලදී.

නමුත් ඉහත කී වරද PB - 044 බැංකු සැසඳුම පිළියෙළ කිරීමේදී, නිවැරදි කිරීම ණයහිමියන්, ගිණුමෙන් එකී මුදල රු.323,028.00 හර කිරීමේදී ගිණුම් පරිගණක මෘදුකාංගයේ ගැටළුවක් නිසා 2019.01.01 ලෙස සටහන් වී ඇති නමුත් එය සත්‍ය වශයෙන් එම වරද නිවැරදි කර ඇත්තේ 2019.09.03 ට පසුවයි (2020 ගිණුම් ප්‍රකාශ පිළියෙළ කිරීමෙන් පසු) එනම් ණය හිමි ගිණුමට එම මුදල බැරකිරීමෙන් පසුවය.

නීතිරීති/ විධානයට යොමුව

(අ) මේ පිළිබඳව කොමිෂන් සභාවේ අභ්‍යන්තර පරීක්ෂණ මණ්ඩලයක් මඟින් විමර්ෂණයක් කරන ලද අතර එම වාර්තාවට අනුව වාහනය යථා තත්වයට පත් කිරීම සඳහා වැය වූ සම්පූර්ණ මුදල අදාළ රියදුරුගෙන් අයකර ගැනීම නිර්දේශිතව තිබූ බැවින් සමස්ථ වියදම වාරික වශයෙන් ඔහුගේ වැටුපෙන් අයකරනු ලබයි.

(ආ) 2017 වර්ෂයේ සිදු වූ පරිගණක ගිණුම් මෘදුකාංගයේ ගැටළුව නිසා 2018 හා 2019 වර්ෂයට අදාළ බැංකු සැසඳුම් පිළියෙළ කිරීමේ දිගු ප්‍රමාදයක් උද්ගත වී තිබුණි. කෙසේ හෝ මෙම තත්වය බොහෝ දුරට නිවැරදි කර 2019 දෙසැම්බර් මස බැංකු සැසඳුම් 2020.06.23 දින විගණන අංශය වෙත භාරදී ඇති අතර 2020 මාසික බැංකු සැසඳුම්, වර්ෂයේ තුන්වන කාර්තුව අවසාන වීමට ප්‍රථම පිළියෙළ කර මෙම ප්‍රමාදය සම්පූර්ණයෙන් නැතිකර මුදල් රෙගුලාසි 359 (ඇ) අනුවම බැංකු සැසඳුම් වාර්තා විගණන අංශයට බාරදීමට කටයුතු සැලසුම් කර ඇත.

(ඇ) බැංකු සැසඳුම් පිළියෙළ කිරීමේ ප්‍රමාදය නිසා මෙම තත්වය හටගත් අතර 2017,2018 වර්ෂයට අදාළ උපලබ්ධි නොවූ මුදල් තැන්පත් පිළිබඳ පරීක්ෂාකර ඒවාට අදාළ ගැලපීම් සිදු කිරීමට කටයුතු කරමි.

(ඈ) බැංකු සැසඳුම් පිළියෙළ කිරීමේ ප්‍රමාදය නිසා මෙම තත්වය හටගත් අතර වලංගු කාලය අවසන් වූ චෙක්පත් සම්බන්ධයෙන් අදාළ ගැලපීම් සිදු කිරීමට කටයුතු කරමි.

(ඉ) **(I,II)**

මීට පෙර වර්ෂවල මෙවැනි අඟ්‍රිම නිකුත් කර තිබූ අතර පසුගිය වර්ෂයේ විගණන වාර්තාව හා එම උපදෙස් අනුව 2019.07.03 දින සිට මුදල් රෙගුලාසි 371 (2) හා 2015 ජූලි 14 රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව තරයේ කටයුතු කර ඇත.

මීට අමතරව විභාග කටයුතු වලදී මෙම සීමාව ඉක්මවා අත්තිකාරම් දියයුතු අවස්ථා සඳහා මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි. කෙසේ නමුත් සමාලෝචිත වර්ෂයේදී විභාග කටයුතු සඳහා ලබාගත් සීමා ඉක්මවූ අත්තිකාරම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබාගත් වාචිකව උපදෙස් මත කටයුතු කල බව සඳහන් කරමි.

(III) මෙම අඟ්‍රිම නිසි පරිදි කාර්යය නිමකළ වහාම පියවීමට කටයුතු කර ඇත.

ජේ.ඒ.ඩී.ජේ.ජයලත්
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)

පිටපත් :

ලේකම් - නිපුණතා සංවර්ධන, රැකී රක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය (දැ.ගැ.ස)
විගණන අධිකාරී - රජයේ විගණන අංශය දැ.ගැ.ස)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණක හා විමර්ෂණ) - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (දැ.ගැ.ස)

Tertiary and Vocational Education Commission
Ministry of Skills Development, Employment & Labour Relations

3rd Floor, "Nipunatha Piyasa"
354/2, Elvitigala Mawatha, Narahenpita, Colombo 05.

Telephone : 011-7608000 | Fax : 011-2555007 | e-mail : info@tvec.gov.lk

www.tvec.gov.lk